# වසර මැද

# රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව-2018

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ

10 වෙනි වගන්තිය යටතේ නිකුත් කරන ලදී.

**මංගල සමරවීර, පා.ම.**

**මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය**

2018 ජූනි 30

**වසර මැද රාජ්‍ය මූල්‍ය තත්ත්වය පිළිබඳ වාර්තාව**

**2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ**

**10 වැනි වගන්තිය යටතේ**

**ගරු මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලදී.**

2003 අංක 3 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ (වගකීම) පනතේ 10 වැනි වගන්තියට අනුව, වසර මැද රාජ්‍ය මූල්‍ය කාර්ය සාධනය සම්බන්ධයෙන් වන වාර්තාවක් මුදල් අමාත්‍යවරයා විසින් අදාළ වර්ෂයේ ජූනි මස අවසාන දිනය වන විට මහජනතාවගේ දැන ගැනීම සඳහා නිකුත් කිරීමටත්, ඉන් ඉක්බිතිව එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමටත් අවශ්‍ය බව දැක්වේ.

රජයේ රාජ්‍ය මූල්‍ය ක්‍රමෝපාය අනුව රාජ්‍ය මූල්‍ය ක්‍රියාකාරකම්වල යාවත්කාලීන තොරතුරු සැපයීම මෙම වාර්තාවේ අරමුණ වේ.

2018 වර්ෂයේ පළමු මාස 4 තුළ රජයේ ආදායම, වියදම, මුදල් ප්‍රවාහ කටයුතු හා ණය ගැනීම් පිළිබඳ කාර්යසාධනය මෙම වාර්තාවේ ඇතුලත් වේ. 2018 පළමු අර්ධය සඳහා වන අයවැය තත්ත්වය පිළිබඳ තාවකාලික දත්ත ද ලබාගත හැකි තොරතුරු අනුව සාර්ව ආර්ථික කටයුතු වල කාර්යසාධනය, මිල ගණන් වෙනස්වීම්, විදේශ මූල්‍යනය, රාජ්‍ය ණය, නිල සංචිත සහ රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්ය සාධනය පිළිබඳ තොරතුරු ද මෙම වාර්තාවේ ඇතුලත් වේ.

# පටුන

පිටු අංකය.


| | | |
|---|---|---|
| **1 වන පරිච්ඡේදය** | **ආර්ථිකය** | |
| | 1.1 ආර්ථික වර්ධනය | 01 |
| | 1.2 උද්ධමනය | 04 |
| | 1.3 මුදල් හා ණය | 05 |
| | 1.4 කොටස් වෙළඳපොළ | 06 |
| | 1.5 විදේශ අංශයේ ප්‍රවණතා | 06 |
| **2 වන පරිච්ඡේදය** | **ගෝලීය ආර්ථිකයේ ප්‍රවණතා** | |
| | 2.1 ආර්ථික වර්ධනය | 09 |
| | 2.2 උද්ධමනය සහ පොලී අනුපාතික | 10 |
| | 2.3 විනිමය අනුපාත | 10 |
| | 2.4 අයවැය හිඟය | 11 |
| | 2.5 රාජ්‍ය ණය | 11 |
| | 2.6 ජාත්‍යන්තර වෙළඳාම සහ භාණ්ඩ මිල | 11 |
| **3 වන පරිච්ඡේදය** | **රාජ්‍ය මූල්‍ය ප්‍රවණතා** | |
| | 3.1 සමාලෝචනය | 13 |
| | 3.2 රජයේ ආදායම | 15 |
| | 3.3 රජයේ වියදම | 28 |
| | 3.4 භාණ්ඩාගාර මෙහෙයුම් | 52 |
| **4 වන පරිච්ඡේදය** | **රජය සතු වාණිජ ව්‍යවසායයන්ගේ කාර්යසාධනය** | |
| | 4.1 සමාලෝචනය | 55 |
| | 4.2 රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන් දහය පිළිබඳ කෙටි සමාලෝචනය | 55 |
| | 4.3 රජය සතු ප්‍රධාන වාණිජ ව්‍යවසායයන්හි ප්‍රතිසංස්කරණ මූලාරම්භයන් | 59 |
| **5 වන පරිච්ඡේදය** | **විදේශ මූල්‍යනය** | |
| | 5.1 විදේශ මූල්‍යයන බැඳීම් | 65 |
| | 5.2 විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධීන් | 68 |
| | 5.3 පළ කරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය | 70 |
| | 5.4 ගෙවීමට ඇති විදේශ ණය සහ ණය සේවාකරණය | 71 |

# මූලික ආර්ථික දර්ශක

| දර්ශකය | කාල පරිච්ඡේදය | ඒකකය | වටිනාකම | |
|---|---|---|---|---|
| | | | 2017 | 2018 තාවකාලික |
| **මූර්ත අංශය** | | | | |
| ආර්ථික වර්ධනය | පළමු කාර්තුව | % | 3.8 | 3.2 |
| කෘෂි කර්මාන්ත | පළමු කාර්තුව | % | (3.2) | 4.8 |
| කර්මාන්ත | පළමු කාර්තුව | % | 6.3 | 1.0 |
| සේවා | පළමු කාර්තුව | % | 3.5 | 4.4 |
| උද්ධමනය (ලක්ෂ්‍යමය) | මැයි අවසානයට | % | 7.1[ආ] | 2.1 |
| උද්ධමනය (සාමාන්‍යය) | මැයි අවසානයට | % | 6.1[ආ] | 5.7 |
| සේවා වියුක්ති අනුපාතය (ශ්‍රම බලකායේ ප්‍රතිශතයක් ලෙස) | වාර්ෂික | % | 4.2 | ලැබී නොමැත |
| ශ්‍රම බලකා සහභාගිත්ව අනුපාතය | වාර්ෂික | % | 54.1 | ලැබී නොමැත |
| **රාජ්‍ය මූල්‍ය අංශය** | | | | |
| අයවැය හිඟය | ජන-අප්‍රේල් | රු.මිලි | -233,171 | -250,638 |
| මුළු ආදායම | ජන | රු.මිලි | 589,439 | 622,378 |
| බදු ආදායම | ජන | රු.මිලි | 554,715 | 570,471 |
| බදු නොවන ආදායම | ජන | රු.මිලි | 34,725 | 51,908 |
| වර්තන වියදම | ජන | රු.මිලි | 626,469 | 685,966 |
| රාජ්‍ය ආයෝජන | ජන | රු.මිලි | 201,012 | 181,998 |
| රාජ්‍ය ණය | | රු.මිලි | 10,313,045 ( දෙසැ අවසන) | 10,654,098 ( මාර්තු අවසන) |
| **විදේශ අංශය** | | | | |
| අපනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,569 | 3,784 |
| එයින් කෘෂි අපනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 852 | 843 |
| කාර්මික අපනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 2,701 | 2,923 |
| රෙදිපිළි හා ඇඟළුම් | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,626 | 1,667 |
| වෙනත් | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,075 | 1,256 |
| ආනයන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 6,883 | 7,765 |
| පාරිභෝගික භාණ්ඩ | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,516 | 1,780 |
| අන්තර් භාණ්ඩ | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 3,692 | 4,330 |
| එයින් ඛනිජ නිෂ්පාදන | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,208 | 1,402 |
| ආයෝජන භාණ්ඩ | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 1,615 | 1,591 |
| වෙළඳ ශේෂය | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | -3,314 | -3,981 |
| සංචාරක පැමිණීම් | ජන-මැයි | සංඛ්‍යාව | 887,093 | 1,017,819 |
| සංචාරක ඉපැයීම් | ජන-මැයි | ඇ.ඩො.මිලි. | 1,645.1[අ] | 1,887.6 |
| සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ | ජන-මැයි | ඇ.ඩො.මිලි. | 3,000.1[ආ] | 3,100.1 |
| කොටස් වෙළඳපොල විවිධ අයෝජන(ශුද්ධ) | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | 154.5 | 154.5 |
| සමස්ථ ගෙවුම් ශේෂය | ජන-අප්‍රේල් | ඇ.ඩො.මිලි. | (344) | 2036 |
| දළ නිල සංචිත | අප්‍රේල් අවසානය | ඇ.ඩො.මිලි. | 6,759.7 | 8,769.0 |
| විනිමය අනුපාතය(මාසය අග) | මැයි අවසානය | ඇ.ඩොලරයට රුපියල් | 152.71 | 158.09 |
| විනිමය අනුපාතය (මාසික සාමාන්‍යය) | ජන-මැයි | ඇ.ඩොලරයට රුපියල් | 152.33 | 157.90 |

# මූලික ආර්ථික දර්ශක තවදුරටත් . . .

| මූල්‍ය අංශය | | | | |
|---|---|---|---|---|
| නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය | ජූනි අවසානයට | % | 7.25 | 7.25 |
| නිත්‍ය ණය පහසුකම් අනුපාතය | ජූනි අවසානයට | % | 8.75 | 8.50 |
| ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය | ජූනි අවසානයට | % | 7.50 | 7.50 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | ජූනි අවසානයට | % | 11.88 | 10.92 |
| වාණිජ බැංකු වල බරිත සාමාන්‍ය ප්‍රමුඛ ණය අනුපාතය | අප්‍රේල් අවසානයට | % | 13.52 | 14.13 |
| ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාතිකය (මාස 01) | ජූනි අවසානයට | % | 10.52 | 9.01 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 91) | ජූනි අවසානයට | % | 9.60 | 8.32 |
| භාණ්ඩාගාර බිල්පත් බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය (දින 364) | ජූනි අවසානයට | % | 10.47 | 9.37 |
| මුදල් සැපයුම් වර්ධනය ($M_2b$) | මාර්තු 2018/ අප්‍රේල් 2017 | % | 20.09 | 16.77 |
| පෞද්ගලික අංශයට ලබා දුන් ණයෙහි වර්ධනය | මාර්තු 2018/අප්‍රේල් 2017 | % | 19.99 | 15.30 |

*සටහන: 2018 වර්ෂයේ දත්තයන් තාවකාලිකවේ.*

*(අ) 2017 වසරේ ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන අධිකාරිය විසින් සිදු කරන ලද සාමාන්‍ය නවාතැන් කාලසීමාව සහ දෛනික වියදම පදනම් කරගත් සමීක්ෂණ වාර්තාවේ ඇස්තමේන්තු අනුව සිදු කරන ලද සංශෝධන අනුව*

*(අ) සංශෝධිත*

# ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක

| දර්ශකය | කාලපරිච්ඡේදය | ඒකකය | වටිනාකම |
|---|---|---|---|
| **විදුලිබලය** | | | |
| විදුලි බලය සඳහා ඇති ප්‍රවේශය | 2017 | % | 99.0 |
| **ජලය** | | | |
| පිරිසිදු පානීය ජල සැපයුම් සඳහා ප්‍රවේශය | 2017 | % ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 89.3(ඇ) |
| නල ජල පහසුකම් සඳහා ප්‍රවේශය | 2017 | % ජනගහනයෙහි ප්‍රතිශතයක් ලෙස | 49.2 |
| **මාර්ග** | | | |
| මාර්ග ඝනත්වය | 2017 | වර්ග කි.මී. | 1.82 |
| මාර්ගවල මුළු දිග | 2017 | කි.මී | 119,480 |
| **පණිවිඩ හුවමාරුව** | | | |
| ජංගම දුරකථන ඇතුළුව දුරකථන ඝනත්වය | 2017 | පුද්ගලයින් 100 කට | 143.6 |
| අන්තර්ජාලය සඳහා ප්‍රවේශය | 2017 | පුද්ගලයින් 100 කට | 27.5 |
| **අධ්‍යාපනය** | | | |
| **පොදු අධ්‍යාපනය** | | | |
| ප්‍රාථමික පාසල් සඳහා ඇතුළත්වීමේ අනුපාතය | 2017 | % | 93.9 |
| ගුරු/ශිෂ්‍ය අනුපාතය (රජයේ පාසැල්) | 2017 | සංඛ්‍යාව | 17.3 |
| සාක්ෂරතා අනුපාතය (සාමාන්‍යය) | 2016 | % | 93.1(ඇ) |
| පරිඝනක සාක්ෂරතා අනුපාතය | 2017 | % | 28.3 |
| **විශ්ව විද්‍යාල අධ්‍යාපනය** | | | |
| ගුරු/ ශිෂ්‍ය අනුපාතය | 2017 | සංඛ්‍යාව | 17.4 |
| වයස් විශේෂිත ලියාපදිංචි අනුපාතය (වයස අවුරුදු 19-23) (අ) | 2017 | % | 6.8 |
| **සෞඛ්‍ය** | | | |
| රෝහල් (Practicing Western Medicine) (ආ) | 2017 | සංඛ්‍යාව | 612 |
| ඇඳන් | 2017 | සංඛ්‍යාව | 76,829 |
| රෝහල් ඇඳන් | 2017 | පුද්ගලයින් 1,000 කට | 3.6 |
| වෛද්‍යවරයෙක් සඳහා පුද්ගලයින් | 2017 | සංඛ්‍යාව | 1,054 |
| **ජනගහනය** | | | |
| ජනගහන ඝනත්වය | 2017 | වර්ග කි.මීටරයට පුද්ගලයින් | 342 |
| ජනගහන වර්ධනය | 2017 | % | 1.1 |
| උපතේදී ආයු අපේක්ෂාව | 2015 | අවුරුදු | 75.0 |
| ළදරු මරණ අනුපාතිකය | 2017 | සජීවී උපත් 1,000 කට | 8.5 |
| මාතෘ මරණ අනුපාතිකය | 2013 | සජීවී උපත් 1,000 කට | 26.8 |
| දළ උපත් අනුපාතිකය | 2017 | පුද්ගලයින් 1,000 කට | 15.2 |
| දළ මරණ අනුපාතිකය | 2017 | පුද්ගලයින් 1,000 කට | 6.5 |
| යැපුම් අනුපාතිකය | 2017 | % | 49.4 |
| **දරිද්‍රතාව** | | | |
| දරිද්‍රතා දර්ශකය | 2016 | % | 4.1 |
| ගෘහ ඒකක ආදායමෙහි ගිනි සංගුණකය | 2016 | සංගුණකය | 0.45 |
| දරිද්‍රතා පරතර දර්ශකය | 2016 | % | 0.6 |
| දිනකට ලබා ගන්නා සාමාන්‍ය කැලරි ප්‍රමාණය | 2016 | කිලෝ කැලරි | 2,095 |

## ශ්‍රී ලංකාව : තෝරාගත් දර්ශක තවදුරටත් . . .

| ජාත්‍යන්තර ශ්‍රේණි ගත කිරීම් | | | ස්ථානය |
|---|---|---|---|
| මානව සංවර්ධන දර්ශකය | 2015 | රටවල් 188 ක් අතරින් ස්ථානය | 73 |
| ව්‍යාපාර පවත්වා ගෙන යාමේ දර්ශකය | 2018 | රටවල් 190 ක් අතරින් ස්ථානය | 111 |
| ගෝලීය තරඟකාරීත්ව දර්ශකය | 2017/2018 | රටවල් 138 ක් අතරින් ස්ථානය | 85 |
| ආර්ථික නිදහස් දර්ශකය | 2018 | රටවල් 180 ක් අතරින් ස්ථානය | 111 |
| ගෝලීය සාම දර්ශකය | 2018 | රටවල් 163 ක් අතරින් ස්ථානය | 67 |
| ඊ රාජ්‍ය සංවර්ධන දර්ශකය | 2016 | රටවල් 193 ක් අතරින් ස්ථානය | 79 |

*(අ) අභ්‍යන්තර ලියාපදිංචි වූ සිසුන් පමණක් ඇතුළත්වේ.*

*(ආ) රජයේ*

*(ඇ) ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව 2016 දී සිදු කරන ලද කුටුම්භ ආදායම් සහ වියදම් සමීක්ෂණය පදනම් කර ගනී.*

*(ඈ) 2016 ජුලි මස ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 2011 සිට නැවත බර තබන ලද හා සංශෝධනය කරන ලද ශ්‍රම බලකා දත්ත මෙය සමස්ත දිවයිනම ඉලක්ක කොට ගෙන සිදු කරන ලද කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පදනම් කර ගෙන ඇත.*

# 1 වන පරිච්ඡේදය

# ආර්ථික විවරණය

## 1.1 ආර්ථික වර්ධනය

ශ්‍රී ලංකා ආර්ථිකය 2018 වර්ෂයේ පළමු කාර්තුව තුළ සියයට 3.2 ක් දක්වා මූර්ත වශයෙන් ප්‍රසාරණය වූ අතර එය 2017 වසරේ ඊට අනුරූප කාලපරිච්ඡේදය තුළ සියයට 3.8 ක අගයක් වාර්තා කරන ලදී. ධාන්‍ය, සහල් සහ මිරිදිය ජල ජීව වගාව හා ධීවර කර්මාන්ත වැනි ක්ෂේත්‍රයන්හි සිදු වූ සුවිශේෂී වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික අංශයේ වර්ධනයක් දැක ගත හැකි විය. කෘෂිකාර්මික අංශය 2017 වර්ෂයේ අනුරූප කාල පරිච්ඡේදයේ වාර්තා වූ සියයට 3.2 ක සෘණාත්මක වර්ධනය හා සැසඳීමේ දී 2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 4.8 කින් වර්ධනය වී ඇත. 2018 පළමු කාර්තුවේ දී කර්මාන්ත හා සේවා අංශයන් පිළිවෙලින් සියයට 1.0 කින් හා සියයට 4.4 කින් පුළුල් වී ඇත. ඇතැම් ප්‍රදේශවල පැවති දැඩි නියං තත්ත්වය, ගංවතුර තත්ත්වය සහ රටේ ඇතැම් දිස්ත්‍රික්ක වල සිදුවූ නාය යෑම් ආර්ථිකය කෙරෙහි අහිතකර බලපෑමක් සිදු කරන ලදී.

රූපසටහන 1.1 | දළ දේශීය නිෂ්පාදනයේ කාර්තුමය වර්ධනය




2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී කෘෂිකාර්මික, කර්මාන්ත, සේවා සහ නිෂ්පාදන මත වන සහනාධාර අඩු කරන ලද බදු යනාදී අංශ පිළිවෙලින් ද.දේ.නි. ට සියයට 7 කින්, සියයට 30 කින්, සියයට 54 කින් සහ සියයට 9 කින් දායක විය. ධාන්‍ය, සහල්, එළවළු සහ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයෙහි එකතු කළ අගය සහිත නිෂ්පාදන අංශයන්ගේ වර්ධනය හේතුවෙන් කෘෂිකාර්මික අංශය පුළුල් විය. යහපත් කාලගුණික තත්ත්වය හේතුවෙන් වී නිෂ්පාදනය 2016/17 මහ කන්නයේ වාර්තා කරන ලද මෙ.ටො. මිලියන 1.5 ට සාපේක්ෂව 2017/18 මහ කන්නයේ දී මෙ.ටො. මිලියන 2.4 දක්වා සියයට 60 කින් සැලකිය යුතු ලෙස වැඩි විය. කෙසේ වෙතත්, පොල් සහ රබර් නිෂ්පාදනය පිළිවෙලින් සියයට 14.9 ක හා සියයට 13.8 ක සෘණාත්මක වර්ධනයක් පෙන්වීය. ජලාශ වෙත මත්ස්‍ය ඇඟිල්ලන් මුදා හැරීම ඉහළ යාම මිරිදිය ධීවර කර්මාන්තයේ හිතකර වර්ධනය සඳහා හේතු වී ඇති අතර යුරෝපා සංගමය විසින් මත්ස්‍ය අපනයන මත පනවා තිබූ තහනම ඉවත් කිරීමෙන් පසු ශ්‍රී ලාංකීය මුහුදු ආහාර සඳහා පවතින ඉල්ලුම ඉහළ යාම කරදිය ධීවර කර්මාන්තය පුළුල් වීම සඳහා දායක වී ඇත.

රූපසටහන 1.2 | පවත්නා මිල අනුව ද.දේ.නි ආංශික සංයුතිය - පළමු කාර්තුව 2018




එකතු කළ අගය සහිත කර්මාන්ත අංශය 2017 වර්ෂයේ අනුරූප කාල පරිච්ඡේදයේ දී වාර්තා කළ සියයට 6.3 ට සාපේක්ෂව 2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 1.0 කින් වර්ධනය වී ඇත. කර්මාන්ත අංශයේ වර්ධනය සඳහා ආහාර හා පාන, දැව, රසායන ද්‍රව්‍ය නිෂ්පාදන, රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන, මූලික ලෝහ, විදුලිය, ගෑස්, වායු හා වායු සමීකරණ සැපයීම, මලාපවහන කටයුතු, කසල කළමනාකරණය ධනාත්මකව බලපාන ලදී. දැව හා දැව ආශ්‍රිත නිෂ්පාදන උප අංශය 2017 වර්ෂයේ සමාන කාල පරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 2.1 ක ඍණාත්මක වර්ධනයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී සියයට 11.9 කින් වර්ධනය විය.

වගුව 1.1 : ස්ථාවර (2010) මිල ගණන් අනුව ද.දේ.නි. ආංශික සංයුතිය පළමු කාර්තුව - 2017-2018

රු. මිලියන

| | අංශය | 2017 | 2018 (අ) | වර්ධනය (%) |
|---|---|---|---|---|
| | **කෘෂිකර්මාන්තය, වන වගාව හා ධීවර කර්මාන්තය** | **147,783** | **154,907** | **4.8** |
| 1 | ධාන්‍ය වගාව (වී හැර) | 3,253 | 4,561 | **40.2** |
| 2 | වී වගාව | 5,372 | 8,415 | **56.6** |
| 3 | එළවළු වගාව | 8,323 | 10,179 | **22.3** |
| 4 | උක් වගාව,දුම්කොළ වගාව සහ වෙනත් බහු වාර්ෂික භෝග නොවන බෝග | 436 | 396 | **-9.2** |
| 5 | පළතුරු වගාව | 12,867 | 13,638 | **6.0** |
| 6 | තෙල් සහිත පළතුරු භෝග වගාව (පොල්, තැඹිලි සහ ඔයිල් පාම් වගාව) | 15,043 | 13,012 | **-13.5** |
| 7 | තේ වගාව | 14,588 | 16,139 | **10.6** |
| 8 | වෙනත් පානීය භෝග වගාවන් (කෝපි, කොකෝවා ආදී) | 317 | 333 | **5.0** |
| 9 | කුළුබඩු, සුවඳ දෙන භෝග, බෙහෙත් ඖෂධීය පැලෑටි වගාව | 15,663 | 15,982 | **2.0** |
| 10 | රබර් වගාව | 6,799 | 5,853 | **-13.9** |
| 11 | වෙනත් බහුවාර්ෂික භෝග වගාව | 4,289 | 4,165 | **-2.9** |
| 12 | සත්ව නිෂ්පාදනයන් | 13,277 | 13,994 | **5.4** |
| 13 | පැල බෝ කිරීම සහ කෘෂිකාර්මික කටයුතු සඳහා වන ආධාරක කාර්යයන් | 2,595 | 2,484 | **-4.3** |
| 14 | වන වගාව, දැව හා වනාන්තර ආශ්‍රිත නිෂ්පාදන | 14,576 | 15,044 | **3.2** |
| 15 | කරදිය ධීවර කර්මාන්තය සහ කරදිය ජලජීව වගාව | 27,993 | 27,428 | **-2.0** |
| 16 | මිරිදිය ධීවර කර්මාන්තය සහ මිරිදිය ජලජීව වගාව | 2,390 | 3,284 | **37.4** |

වගුව 1.1 : තවදුරටත්. . .

| | | | | |
|---|---|---|---|---|
| **කර්මාන්ත** | | **690,910** | **697,620** | **1.0** |
| | | | | |
| 17 | පතල් හා කැණීම් කර්මාන්තය | 58,806 | 59,172 | **0.6** |
| 18 | ආහාර,බීම සහ දුම්කොළ නිෂ්පාදනය | 158,328 | 166,586 | **5.2** |
| 19 | රෙදිපිළි, නිමි ඇඳුම්,සම් භාණ්ඩ හා බුමුතුරුණු නිෂ්පාදනය | 105,245 | 110,176 | **4.7** |
| 20 | ගෘහභාණ්ඩ හැර දව හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 9,773 | 10,940 | **11.9** |
| 21 | කඩදාසි හා ඒ ආශ්‍රිත නිෂ්පාදන,මුද්‍රණ කටයුතු සහ දෘශ්‍ය හා ශ්‍රවණ තැටි නැවත නිෂ්පාදනය | 12,023 | 11,844 | **-1.5** |
| 22 | අඟුරු සහ ඛනිජතෙල් පිරිපහදු කිරීමේ නිෂ්පාදන | 11,739 | 7,188 | **-38.8** |
| 23 | රසායන ද්‍රව්‍ය සහ ඒ ආශ්‍රිත නිෂ්පාදන, ඖෂධ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 20,458 | 21,713 | **6.1** |
| 24 | රබර් සහ ප්ලාස්ටික් නිෂ්පාදන | 11,924 | 12,870 | **7.9** |
| 25 | ලෝහමය නොවන වෙනත් ඛනිජ නිෂ්පාදන | 19,152 | 19,465 | **1.6** |
| 26 | ලෝහ හා ඒ ආශ්‍රිත නිෂ්පාදන | 12,031 | 13,123 | **9.1** |
| 27 | යන්ත්‍රෝපකරණ නිෂ්පාදන | 14,430 | 13,632 | **-5.5** |
| 28 | ගෘහභාණ්ඩ නිෂ්පාදනය | 30,240 | 29,626 | **-2.0** |
| 29 | වෙනත් නිෂ්පාදන කර්මාන්ත,යන්ත්‍රෝපකරණ අළුත්වැඩියාව සහ සවි කිරීම | 21,434 | 21,368 | **-0.3** |
| 30 | විදුලිය ,ගෑස්,වායු හා වායු සමීකරණ සැපයීම | 22,653 | 24,972 | **10.2** |
| 31 | ජලය රැස් කිරීම, පිරිසිදු කිරීම සහ බෙදා හැරීම | 3,375 | 3,423 | **1.4** |
| 32 | මලාපවහන කටයුතු, කසල කළමනාකරණය සහ එම ද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය | 6,692 | 7,348 | **9.8** |
| 33 | ඉදිකිරීම් කර්මාන්තය | 172,608 | 164,173 | **-4.9** |
| | | | | |
| | **සේවාවන්** | **1,215,384** | **1,269,228** | **4.4** |
| | | | | |
| 34 | තොග හා සිල්ලර වෙළඳාම | 244,700 | 258,018 | **5.4** |
| 35 | මගීන් හා භාණ්ඩ ප්‍රවාහන සේවාවන් සහ ගබඩා පහසුකම් සැපයීම | 220,064 | 222,731 | **1.2** |
| 36 | තැපැල් හා කුරියර් සේවාවන් | 1,084 | 1,155 | **6.5** |
| 37 | නවාතැන් සැපයීම සහ ආහාරපාන සැපයීමේ සේවාවන් | 36,004 | 38,739 | **7.6** |
| 38 | ගුවන්විදුලි සහ රූපවාහිනී විකාශනය සහ එම නිෂ්පාදන කටයුතු | 771 | 630 | **-18.3** |
| 39 | විදුලි සංදේශ සේවාවන් | 9,421 | 10,465 | **11.1** |
| 40 | තොරතුරු තාක්ෂණ උපදේශන සේවාවන් හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් | 3,236 | 3,374 | **4.3** |
| 41 | මූල්‍ය සේවා ක්‍රියාකාරකම් හා අතිරේක මූල්‍ය සේවා | 118,082 | 132,524 | **12.2** |
| 42 | රක්ෂණය, ප්‍රති රක්ෂණය හා විශ්‍රාම අරමුදල් | 16,616 | 18,155 | **9.3** |
| 43 | නිවාස අයිතිය හා දේපල වෙළඳාම | 134,141 | 140,693 | **4.9** |
| 44 | වෘත්තීමය සේවාවන් | 37,879 | 39,341 | **3.9** |
| 45 | රාජ්‍ය පරිපාලනය හා ආරක්ෂාව ,අත්‍යවශ්‍ය සමාජ ආරක්ෂාව | 96,330 | 95,951 | **-0.4** |
| 46 | අධ්‍යාපනය | 42,618 | 41,909 | **-1.7** |
| 47 | සෞඛ්‍ය,නේවාසික රැකවරණ සේවාවන් සහ සමාජ සේවාවන් | 32,464 | 32,519 | **0.2** |
| 48 | වෙනත් පෞද්ගලික සේවාවන් | 221,972 | 233,023 | **5.0** |
| | **සමස්ත එකතු කළ අගය (GVA), මූලික මිළ ගණන් අනුව** | **2,054,078** | **2,121,756** | **3.3** |
| | **(+)භාණ්ඩ හා සේවා මත අය කරන බදු (-) සහනාධාර** | **100,893** | **102,101** | **1.2** |
| | **දළ දේශීය නිෂ්පාදිතය (GDP), වෙළඳපල මිල** | **2,154,971** | **2,223,856** | **3.2** |

*මූලාශ්‍රය : ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
*(අ) තාවකාලික*

ඒ හා සමාන ව විදුලිය, ගෑස්, වායු සහ වායු සමීකරණ සැපයුම් උප අංශය 2017 වර්ෂයේ පළමු කාර්තුව තුළ දී වාර්තා කරන ලද සියයට 0.3 ක ඍණාත්මක වර්ධනයට සාපේක්ෂව 2018 වර්ෂයේ අනුයාත කාලපරිච්ඡේදය තුළ සියයට 10.2 කින් කැපී පෙනෙන ලෙස වැඩි විය. එකතු කළ අගය සහිත බනිජ තෙල් නිෂ්පාදන උප අංශය අදාල කාලපරිච්ඡේදය තුළ දී සියයට 38.8 කින් සංකෝචනය විය. කෙසේ වෙතත්, බනිජ තෙල් නිෂ්පාදන අපනයන්ගෙන් ලද ආදායම 2017 පළමු කාර්තුවේ දී වාර්තා වූ ඇ.ඩො. මිලියන 90.6 ට සාපේක්ෂව 2018 පළමු කාර්තුවේ දී ඇ.ඩො. මිලියන 135.5 ක් දක්වා සියයට 49.6 කින් වැඩි විය. 2017 වර්ෂයේ ජනවාරි-මාර්තු දක්වා වූ කාලපරිච්ඡේදයේ දී ගිගාවොට් පැය 3,500 ක් වූ විදුලි බල උත්පාදනය 2018 වර්ෂයේ ජනවාරි-මාර්තු දක්වා වූ කාලපරිච්ඡේදය තුළ දී ගිගාවොට් පැය 3,838 ක් දක්වා සියයට 9.6 කින් වර්ධනය විය. රට තුළ හටගත් අධික වර්ෂාපතනය සමඟ අනුරූපී කාල පරිච්ඡේදය තුළ දී ජල විදුලි බල උත්පාදනය ගිගාවොට් පැය 650 ක් දක්වා සියයට 87.6 කින් ඉහළ යන ලදී.

සේවා අංශය එකතු කළ අගය මත වටිනාකම අනුව 2017 වර්ෂයේ අනුරූපී කාර්තුවේ දී වාර්තා කරන ලද සියයට 3.5 වර්ධනයට සාපේක්ෂව 2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 4.4 කින් වර්ධනය වී ඇත. සේවා අංශයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් මූල්‍ය සේවා හා රක්ෂණ කටයුතු, විදුලි සංදේශ සේවා, තොග හා සිල්ලර වෙළඳාම, නවාතැන් සැපයීම, දේපළ වෙළඳාම්, වෘත්තීමය සේවාවන් සහ තැපැල් හා පණිවුඩ සේවාවන් හේතු වී ඇත. අගය එකතු කරන ලද මූල්‍ය සේවා ක්‍රියාකාරකම් 2017 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදයේ දී වාර්තා වූ සියයට 14.9 ට සාපේක්ෂව 2018 වර්ෂයේ පළමු කාර්තුවේ දී සියයට 12.2 ක වර්ධනයක් පෙන්නුම් කර ඇත. මේ අතරතුර, රක්ෂණ ක්‍රියාකාරකම් අනුරූප කාලපරිච්ඡේදය තුළ දී සියයට 9.3 කින් පුළුල් විය.

විදුලි සංදේශ සේවාවන් අදාල කාලපරිච්ඡේදය තුළ දී උපයෝජනය ඉහල යාම හේතුවෙන් එම අංශය 2018 පළමු කාර්තුව තුළ දී එකතු කළ අගය මත වටිනාකම අනුව සියයට 11.1 කින් වර්ධනය විය. තොග හා සිල්ලර වෙළඳාම උප අංශය එකතු කළ අගය මත වටිනාකම අනුව දේශීය විදේශීය වෙළඳ ක්‍රියාකාරකම් හේතුවෙන් 2017 පළමු කාර්තුව තුළ දී වාර්තා කළ සියයට 4.5 ට සාපේක්ෂව 2018 පළමු කාර්තුව තුළ දී සියයට 5.4 කින් වර්ධනය විය. මේ අතරතුර, තැපැල් හා පණිවුඩ සේවා, නවාතැන්, ආහාර සහ පාන වර්ග සහ දේපළ වෙළඳාම් වැනි උප අංශයන් අදාළ කාල පරිච්ඡේදය තුළ දී එකතු කළ අගය මත වටිනාකම අනුව පිළිවෙලින් සියයට 6.5 කින්, සියයට 7.6 කින් සහ සියයට 4.9 කින් වර්ධනය විය.

## 1.2 උද්ධමනය

ජාතික පාරිභෝගික මිල දර්ශකය ( 2013=100 ) අනුව ගණනය කරනු ලබන උද්ධමනය 2017 දෙසැම්බර් මස වාර්තා කළ අගය වූ සියයට 7.3 සිට 2018 ජනවාරි මස වන විට සියයට 5.4 දක්වා පහල යාමක් වාර්තා කර ඇත. 2017 ජනවාරි මස පැවති ඉහළ උද්ධමන මට්ටම සහ 2018 ජනවාරි මස ආහාර මිල ගණන් අඩුවීම මෙම උද්ධමනය පහල යාම සඳහා බලපා ඇත. ජාතික පාරිභෝගික මිල දර්ශකයේ (NCPI) වාර්ෂික සාමාන්‍ය අගය 2017 දෙසැම්බර් මස දී සියයට 7.7 සිට 2018 ජනවාරි මස සියයට 7.6 ක් දක්වා අඩුවී තිබේ.

2018 මාර්තු මාසයේ දී සියයට 2.8 ක් ව පැවති උද්ධමනය 2018 අප්‍රේල් මස දී සියයට 1.6 ක් දක්වා තවදුරටත් පහල ගොස් ඇති අතර ඊට ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2017 අප්‍රේල් මස දී ආහාර සැපයුම් වල මිල ගණන් ඉහළ අගයක් ගැනීමයි. ජාතික පාරිභෝගික මිල දර්ශකය අනුව ගණනය කරනු ලබන වාර්ෂික සාමාන්‍ය උද්ධමනය 2018 ජනවාරි මස සියයට 7.6 සිට 2018 අප්‍රේල් වන විට සියයට 6.1 දක්වා අඩු වී ඇත.

කොළඹ පාරිභෝගික මිල දර්ශකය මගින් ගණනය කරනු ලබන වාර්ෂික උද්ධමනය, 2017 වසරේ මැයි මස වාර්තා වූ සියයට 6.0 ට සාපේක්ෂව 2018 වසරේ මැයි මස වන විට සියයට 4.0 දක්වා අඩු වී ඇත. 2017 මැයි මස දී සියයට 9.3 ක් ව පැවති ආහාර වර්ගවලට අදාළව උද්ධමනය 2018 මැයි මස වන විට සියයට 3.3 ක් දක්වා අඩු වී ඇති අතර ආහාර නොවන ද්‍රව්‍ය සඳහා එය පිළිවෙලින් සියයට 3.8 සිට සියයට 4.2 දක්වා වැඩි වී ඇත. ඉල්ලුම මගින් ඇතිවන පීඩනය ක්‍රමිකව කළමනාකරණය කිරීම හරහා උද්ධමනය තවදුරටත් මධ්‍යස්ථ තනි අගයක පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර මධ්‍යකාලීනව සියයට 4 - 6 පරාසය තුළ ස්ථාවර කිරීමට අපේක්ෂිතය.

වගුව 1.2 : උද්ධමනයේ විචලනය (%)

| වසර | මාසය | කොළඹ පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | | ජාතික පාරිභෝගික මිල දර්ශකය (2013=100) | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | මතුපිට උද්ධමනය | | *මූලික උද්ධමනය | | මතුපිට උද්ධමනය | | *මූලික උද්ධමනය | |
| | | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය | ලක්ෂ්‍යමය | වාර්ෂික සාමාන්‍ය |
| 2017 | ජනවාරි | 5.5 | 4.3 | 7.0 | 4.7 | 6.5 | 4.6 | 7.1 | 6.2 |
| | පෙබරවාරි | 6.8 | 4.6 | 7.1 | 5.0 | 8.2 | 5.1 | 7.1 | 6.4 |
| | මාර්තු | 7.3 | 5.0 | 7.3 | 5.3 | 8.6 | 5.6 | 7.0 | 6.6 |
| | අප්‍රේල් | 6.9 | 5.3 | 6.8 | 5.5 | 8.4 | 6.0 | 5.9 | 6.6 |
| | මැයි | 6.0 | 5.4 | 5.2 | 5.5 | 7.1 | 6.1 | 4.7 | 6.4 |
| | ජුනි | 6.1 | 5.5 | 5.1 | 5.5 | 6.3 | 6.1 | 4.1 | 6.1 |
| | ජූලි | 4.8 | 5.4 | 4.9 | 5.4 | 6.3 | 6.2 | 4.2 | 5.9 |
| | අගෝස්තු | 6.0 | 5.5 | 6.0 | 5.6 | 7.9 | 6.5 | 4.8 | 5.8 |
| | සැප්තැම්බර් | 7.1 | 5.8 | 6.0 | 5.8 | 8.6 | 6.8 | 4.6 | 5.7 |
| | ඔක්තෝබර් | 7.8 | 6.1 | 5.8 | 6.0 | 8.8 | 7.1 | 4.1 | 5.6 |
| | නොවැම්බර් | 7.6 | 6.4 | 5.2 | 6.0 | 8.4 | 7.5 | 2.8 | 5.2 |
| | දෙසැම්බර | 7.1 | 6.6 | 4.3 | 5.9 | 7.3 | 7.7 | 2.7 | 4.9 |
| 2018 | ජනවාරි | 5.8 | 6.6 | 3.5 | 5.6 | 5.4 | 7.6 | 2.1 | 4.5 |
| | පෙබරවාරි | 4.5 | 6.4 | 3.5 | 5.3 | 3.2 | 7.2 | 2.0 | 4.1 |
| | මාර්තු | 4.2 | 6.1 | 3.4 | 5.0 | 2.8 | 6.7 | 1.9 | 3.6 |
| | අප්‍රේල් | 3.8 | 5.9 | 3.5 | 4.7 | 1.6 | 6.1 | 1.9 | 3.3 |
| | මැයි | 4.0 | 5.7 | 3.2 | 4.5 | 2.1 | 5.7 | 1.7 | 3.1 |

*මූලාශ්‍රය : ජන ලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*
**කොළඹ පාරිභෝගික මිල දර්ශකය -අළුත් ආහාර, බලශක්ති, සහ ප්‍රවාහනය හැර*

## 1.3 මුදල් සැපයුම හා ණය

2018 වර්ෂයේ පළමු මාස 04 තුළ දී සංචිත මුදල් හා පුළුල් මුදල් සැපයුම (M2b) මෙන්ම පෞද්ගලික අංශය සඳහා වූ ණය සැපයුම ද වර්ධනය වී ඇත. 2018 වර්ෂයේ අප්‍රේල් මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උද්ධමනය මධ්‍යකාලීනව මැද තනි අංකයක ස්ථාවරව පවත්වා ගෙන යාම සඳහා නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) පදනම් අංක 25 කින් සියයට 8.50 දක්වා පහත දැමූ අතර නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සියයට 7.25 මට්ටමේ නොවෙනස්ව පවත්වා ගෙන ඇත. ඒ අනුව, මුදල් වෙළඳපොල පොලී අනුපාතිකයන් විශේෂයෙන්ම, ණය දීමේ පොලී අනුපාතිකය 2018 වර්ෂයේ අප්‍රේල් මස සිදුකරන ලද ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකයන්ගේ වෙනස් වීම හේතුවෙන් ඉදිරියේ දී පහළට විතැන් වේ යැයි අපේක්ෂා කෙරේ.

වගුව **1.3 :** මුදල් සහ පුද්ගලික අංශයට ලබාදුන් ණය

| අයිතමය | 2017 | | | | 2018 | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | ජනවාරි | පෙබරවාරි | මාර්තු | අප්‍රේල් | 2018 අප්‍රේල් / 2017 අප්‍රේල් වර්ධනය (%) |
| සංචිත මුදල් | 828.5 | 847.6 | 892.2 | 885.6 | 930.0 | 938.1 | 997.2 | 1,000.1 | 12.9 |
| පුළුල් මුදල් සැපයුම (M2b) | 5,460.4 | 5,552.0 | 5,677.4 | 5,730.8 | 6,378.4 | 6,450.5 | 6,606.6 | 6,691.7 | 16.8 |
| පුද්ගලික අංශයට ලබාදුන් ණය | 4,222.3 | 4,293.2 | 4,375.2 | 4,394.1 | 4,863.4 | 4,921.6 | 5,043.9 | 5,066.5 | 15.3 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා මහ බැංකුව*

2018 වර්ෂයේ මාර්තු මස දී ලක්ෂමය පදනම මත සංචිත මුදල් සියයට 11.8 කින් වර්ධනය වූ අතර පුළුල් මුදල් සැපයුම 2017 වර්ෂයේ වාර්තා වූ සියයට 20 වර්ධනය හා සැසඳීමේ දී 2018 වර්ෂයේ මාර්තු මස දී සියයට 16.4 කින් වර්ධනය විය. තව දුරටත්, ඉහළ ණය ඉල්ලුම හේතුවෙන් 2018 වර්ෂයේ මාර්තු මස දී ලක්ෂමය පදනම මත ගණනය කරන ලද පෞද්ගලික අංශයේ ණය සියයට 15.3 කින් වර්ධනය වී ඇත. රටේ සියලුම අංශයන් ආවරණය වන පරිදි මෙම පෞද්ගලික අංශයේ ණය සැපයීම සමානව ව්‍යාප්ත වී ඇත.

## 1.4 කොටස් වෙළඳපොළ

රුපියල අවප්‍රමාණය වීම ආර්ථිකය තුළ පැවති මන්දගාමීත්වය, රුපියල අවප්‍රමාණ වීම සහ කොළඹ කොටස් වෙළඳපොල තුළින් විදේශීය ආයෝජනයන් යම් ප්‍රමාණයකින් ඉවත් කර ගැනීම වැනි තත්ත්වයන් යටතේ 2018 වර්ෂයේ පළමු මාස පහ තුළදී කොටස් වෙළඳපොල පහල මට්ටමේ කාර්යසාධනයක් පෙන්නුම් කළේය. සමස්ත කොටස් මිල දර්ශකය 2017 වර්ෂයේ පළමු මාස 05 ක කාලය හා සසඳන විට 2018 මැයි මස අවසානයේ දී ඒකක 6,398 දක්වා සියයට 4.1 කින් පහළ යාමක් පෙන්වීය. මේ අතර එස්. සහ පී.එස්.එල්. 20 දර්ශකය 2018 මැයි මස අග වන විට ඒකක 3,567 දක්වා සියයට 6.6 කින් පහළ වැටුණි. කෙසේවුවද පෙර වසරේ අදාල කාලපරිච්ඡේදය හා සසඳන කළ 2018 පළමු මාස පහ තුළ දී දෛනික සාමාන්‍ය පිරිවැටුම රුපියල් මිලියන 998 දක්වා සියයට 10.8 කින් ඉහළ ගොස් ඇත. තවද, 2017 වර්ෂයේ අදාළ කාලය තුළ වාර්තා වූ රුපියල් බිලියන 2,953 ක් වූ වෙළඳපොල ප්‍රාග්ධනීකරණය 2018 වර්ෂයේ දී රුපියල් බිලියන 2,989 ක් දක්වා සියයට 1.2 කින් ඉහළ ගොස් ඇත.

වගුව 1.4 : ප්‍රාග්ධන වෙළඳපොල කාර්යසාධනය

| දර්ශකය | 2013 | 2014 | 2015 | 2016 | 2017 | මැයි අග වන විට | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | 2017 | 2018 |
| සමස්ත කොටස් මිල දර්ශකය (1985=100) | 5,913 | 7,299 | 6,895 | 6,228 | 6,369 | 6,674 | 6,398 |
| මිලංකාමිල දර්ශකය පී .එස්. එල් 20 දර්ශකය* | 3,264 | 4,089 | 3,626 | 3,496 | 3,672 | 3,819 | 3,567 |
| වෙළඳපොල ප්‍රාග්ධනීකරණය (රු.බිලියන) | 2,460 | 3,105 | 2,938 | 2,745 | 2,899 | 2,953 | 2,989 |
| වෙළඳපොල කටයුතු සිදුකරනු ලබන ලැයිස්තුගත සමාගම් ගණන | 289 | 294 | 294 | 295 | 296 | 296 | 299 |
| වාර්ෂික පිරිවැටුම (රු.බිලියන) | 828 | 1,415 | 1,060 | 737 | 915 | 901 | 998 |
| විදේශ විකිණුම් (රු.මිලියන) | 60,873 | 83,554 | 89,790 | 74,200 | 94,627 | 31,612 | 44,681 |
| විදේශ මිලදී ගැනීම් (රු.මිලියන) | 83,657 | 104,771 | 84,418 | 74,583 | 112,285 | 50,411 | 43,093 |
| ශුද්ධ මිලදී ගැනීම් (රු.මිලියන) | 22,784 | 21,217 | -5,372 | 384 | 17,658 | 18,798 | -1,588 |

*මූලාශ්‍රය : කොළඹ කොටස් වෙළඳපොළ හා ශ්‍රී ලංකා මහ බැංකුව*

** 2012 ජුනි සිට මිලංකා මිල දර්ශකය වෙනුවට එස් ඇන්ඩ් පී .එස්. එල් 20 දර්ශකය ආදේශ කරන ලදී.*

## 1.5 විදේශ අංශයේ ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ විදේශ අංශය 2018 වසරේ පළමු මාස හතර තුළදී මූල්‍ය ගිණුම තුළට වූ ඉහළ ගලා ඒම් සහ විදේශ ශ්‍රමික ප්‍රේෂණ සහ සංචාරක ව්‍යාපාරයේ ඉපැයීම් සමඟින් හිතකර කාර්යසාධනයක් පෙන්නුම් කර ඇත. දළ නිල සංචිත ප්‍රමාණය ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සහ කොටස් වෙළඳපොළ සහ රජයේ සුරැකුම්පත් වෙළඳපොළට ගලා වූ විදේශීය ගලා ඒම් සමඟින් 2018 අප්‍රේල් මස අග වන විට ඇ.ඩො. බිලියන 9.9 ක ඉහළ අගයක් වාර්තා කර ඇත. කෙසේ වුවද, 2018 පළමු මාස හතර තුළදී වෙළඳ හිඟය ඇ.ඩො. මිලියන 3,981 ක්දක්වා පුළුල් වී ඇති අතර මේ සඳහා ආනයනික වියදම (සියයට 12.8 කින්) ඉහළ යාම සමඟින් අපනයන ඉපැයීම් (සියයට 6.0 කින්) මධ්‍යස්ථව වර්ධනය වීම හේතු වී ඇත. වෙළඳ හිඟය පුළුල් වීම හැරුණු විට ගෙවුම් ශේෂය 2017 අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා කළ ඇ.ඩො. මිලියන 344 ක හිඟයට සාපේක්ෂව 2018 අප්‍රේල් අග වන විට ඇ.ඩො. මිලියන 2,036 ක අතිරික්තයක් වාර්තා කර ඇත.

## අපනයන

අපනයන ආදායම 2018 පළමු මාස හතර තුළදී සියයට 6.0 කින් ඇ.ඩො මිලියන 3,784 ක් දක්වා වර්ධනය වී ඇති අතර මේ සඳහා කාර්මික අපනයනවලින් ලද ආදායම ප්‍රධාන වශයෙන් බලපා ඇත. ඇගළුම් අපනයනවලින් ලද ආදායම 2018 වසරේ පළමු මාස හතර තුළදී සියයට 2.1 කින් ඇ.ඩො. මිලියන 1,564 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර මේ සඳහා ඇමරිකා එක්සත් ජනපදය සහ යුරෝපීය සංගමය වෙත යවන ලද අපනයන ප්‍රමාණය ඉහළ යාම හේතු වී ඇත. තේ සහ රබර් අපනයන 2018 වසරේ පළමු මාස හතර තුළදී සියයට 4.3 කින් සහ සියයට 12.9 කින් ඉහළ ගොස් ඇත. කෙසේවුවද, සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී පොල් සහ කුළුබඩු අපනයනවලින් ලද ආදායම සියයට 12.8 කින් සහ සියයට 12.1 කින් පහල ගොස් ඇති අතර මේ සඳහා එම බෝගයන්හි දේශීය නිෂ්පාදනය පහළ යාම හේතු විය. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ශ්‍රී ලාංකික නිෂ්පාදන අපනයන කරන ලද ප්‍රධාන රටවල් අතර ඇමරිකා එක්සත් ජනපදය, එක්සත් රාජධානිය, ඉන්දියාව, ජර්මනිය සහ ඉතාලිය යන රටවල් ප්‍රමුඛ වේ.

**වගුව 1.5 : විදේශ වෙළඳාම (ජනවාරි - අප්‍රේල්)**

| | | *ඇ. ඩො. මිලියන* | |
|---|---|---|---|
| **අයිතමය** | **2017** | **2018 (තාවකාලික)** | **% වර්ධනය** |
| **අපනයන** | **3,569.0** | **3,783.7** | **6.0** |
| කෘෂිකාර්මික නිෂ්පාදන | 851.7 | 843.4 | -1.0 |
| තේ | 458.2 | 478.1 | 4.3 |
| ප්‍රාථමික නිෂ්පාදන (රබර් හා පොල් නිෂ්පාදන) | 134.7 | 115.1 | -14.6 |
| අනෙකුත් කෘෂිකාර්මික නිෂ්පාදන | 258.8 | 250.2 | -3.3 |
| කාර්මික නිෂ්පාදන | 2,701.5 | 2,923.3 | 8.2 |
| රෙදි පිළි හාඇගලුම් | 1,626.3 | 1,667.2 | 2.5 |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 120.1 | 173.2 | 44.2 |
| අනෙකුත් කාර්මික නිෂ්පාදන | 955.0 | 1,082.8 | 13.4 |
| ඛණිජ නිෂ්පාදන | 9.9 | 10.3 | 4.0 |
| අනෙකුත් | 5.9 | 6.7 | 13.5 |
| **ආනයන** | **6,883.3** | **7,764.6** | 12.8 |
| පාරිභෝගික භාණ්ඩ | 1,515.6 | 1,780.0 | 17.4 |
| ආහාරභාපාන වර්ග | 629.2 | 652.7 | 3.7 |
| අනෙකුත් පාරිභෝගික භාණ්ඩ | 886.5 | 1,127.4 | 27.2 |
| අතරමැදි භාණ්ඩ | 3,692.2 | 4,329.8 | 17.3 |
| ඛණිජ තෙල් නිෂ්පාදන | 1,208.3 | 1,402.0 | 16.0 |
| පොහොර | 22.6 | 88.5 | 291.6 |
| රෙදි පිළි හාඇගලුම් | 860.6 | 882.7 | 2.6 |
| අනෙකුත් අතරමැදි භාණ්ඩ | 1,600.7 | 1,956.6 | 22.2 |
| ආයෝජන භාණ්ඩ | 1,614.6 | 1,590.7 | -1.5 |
| යන්ත්‍රසූත්‍ර සහ උපකරණ | 871.9 | 866.9 | -0.6 |
| ප්‍රවාහන උපකරණ | 215.1 | 221.4 | 2.9 |
| ගොඩනැගිලි ද්‍රව්‍ය | 524.1 | 499.7 | -4.7 |
| අනෙකුත් ආයෝජන භාණ්ඩ | 3.4 | 2.7 | -20.6 |
| අනෙකුත් | 60.9 | 64.1 | 5.3 |
| **වෙළඳ ශේෂය** | **-3,314.4** | **-3,980.8** | **20.1** |

*මූලාශ්‍රය : රේගු දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහ බැංකුව*

## ආනයන

ආනයන වියදම 2018 පළමු මාස හතර තුළදී සියයට 12.8 කින් ඇ.ඩො. මිලියන 7,765 ක් දක්වා ඉහළ ගොස් ඇති අතර මේ සඳහා අතරමැදි සහ පාරිභෝගික භාණ්ඩ ආනයනය ඉහළ යාම ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. ඛනිජ තෙල් ආනයනික වියදම සමස්ත ආනයනික වියදම කෙරෙහි ප්‍රධාන දායකත්වයක් දරන අතර 2018 වසරේ පළමු මාස හතර තුළදී එම ආනයනික වියදමෙහි පිරිපහදු කළ පෙට්‍රෝලියම් ඇ.ඩො. මිලියන 1,054 ක් දක්වා සියයට 27 කින් ඉහළ ගොස් ඇති අතර බොරතෙල් සහ ගල් අඟුරු ආනයනික වියදම පහළ ගොස් ඇත. මෝටර් වාහන ආනයන වියදම ඇ.ඩො. මිලියන 516.6 ක් දක්වා සියයට 108.2 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇති අතර මේ සඳහා එන්ජින් ධාරිතාවය 1000ට අඩු මෝටර් කාර් ආනයනය ඉහළ යාම හේතු වී ඇත. කෙසේවුවද, සහල් ආනයනික වියදම සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො. මිලියන 98.8 ක් දක්වා සියයට 10.7 කින් පහළ ගොස් තිබේ. මේ අතර, සමාලෝචිත කාලසීමාව තුළදී රන් ආනයනය ඇ.ඩො. මිලියන 437.3 ක් දක්වා සියයට 126.5 කින් සැලකිය යුතු ලෙස ඉහළ ගොස් ඇත. 2018 අප්‍රේල් මස සිට බලපැවැත්වෙන පරිදි රන් ආනයනය මත රජය විසින් සියයට 15 ක රේගු බද්දක් පනවන ලදී. මේ අතර, පෙහොර ආනයනික වියදම සියයට 291.0 කින් ඉහළ ගොස් ඇති අතර මෙය රටෙහි ආනයනික වියදම ඉහළ යාම කෙරෙහි දායක වී ඇත. ශ්‍රී ලංකාවේ ප්‍රධාන ආනයනික රටවල් ලෙස ඉන්දියාව, එක්සත් අරාබි එමීර් රාජ්‍යය, ජපානය සහ සිංගප්පූරුව ප්‍රධාන වේ.

## වර්තන ගිණුම

2018 වසරේ පළමු මාස හතර තුළදී සංචාරක පැමිණීම් ඉහළ ගොස් ඇති අතර මේ සඳහා එක්සත් රාජධානිය, ඉන්දියාව සහ ඕස්ට්‍රේලියාව යනාදී රටවලින් පැමිණි සංචාරකයින් ප්‍රමාණය ඉහළ යාම හේතු වී ඇත. 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 2018 වසරේ පළමු මාස හතර තුළදී සංචාරක පැමිණීම් 888,253 ක් දක්වා සියයට 16.1 කින් ඉහළ ගොස් ඇත. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී සංචාරක ඉපැයීම් ඇ.ඩො. මිලියන 1,647 ක් විය. ශ්‍රමික විදේශ ප්‍රේෂණ සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී ඇ.ඩො. මිලියන 2,520 ක් දක්වා සියයට 5.0 කින් ඉහළ ගොස් ඇත.

## මූල්‍ය ප්‍රවාහ

2018 වසරේ පළමු මාස හතර තුළදී කොටස් වෙළඳපල විදේශ ආයෝජන ප්‍රමාණය ඇ.ඩො. මිලියන 47.2 ක් විය. මේ අතර 2018 අප්‍රේල් මස අගවන විට රජයේ සුරැකුම්පත් වෙළඳපලට ගලා ආ විදේශ මූල්‍ය ගලා ඒම් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 13.6 ක් වන අතර සමාලෝචිත කාලපරිච්ඡේදය තුළදී රජය විසින් ගනු ලැබූ දිගුකාලීන ණය ප්‍රමාණය ඇ.ඩො. මිලියන 30.1 ක් විය.

## විදේශ සංචිත

2018 අප්‍රේල් මස අග වන විට රටෙහි දළ නිල සංචිත ප්‍රමාණය ඇ.ඩො. බිලියන 9.9 ක් හෙවත් ආනයනික මාස 5.5 කට සමාන වේ. 2018 අප්‍රේල් මස අග වන විට සමස්ත විදේශ වත්කම් ප්‍රමාණය ඇ.ඩො. බිලියන 12.3 කි.

# 2 පරිච්ඡේදය
# ගෝලීය ආර්ථික ප්‍රවණතා

## 2.1 ගෝලීය ආර්ථික සංවර්ධනයන්

ගෝලීය ආර්ථිකය 2017 වර්ෂයේ දි පැවති සියයට 3.8 ක වර්ධනයට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 3.9 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂිත අතර මේ සඳහා චීනය, ජපානය සහ අනෙකුත් නැගෙනහිර ආසියානු රටවල ශක්තිමත් ආර්ථික වර්ධනය හේතු වී ඇත. පුළුල් පදනමකින් සිදුවී ඇති මෙම ආර්ථික වර්ධනය සඳහා ශක්තිමත් ව්‍යාපාරික තත්ත්වයන් , ශ්‍රම වෙළඳපොළ තත්ත්වයන් මෙන්ම ආයෝජන සහ කාර්මික නිෂ්පාදනය ඉහළ යාම හේතුවිය. ඇමරිකා එක්සත් ජනපදයේ ආර්ථිකය එහි විභව නිපැයුම් මට්ටමට වඩා ඉහළ අනුපාතිකයින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, දැනට සිදු කෙරෙමින් පවතින බදු ප්‍රතිසංස්කරණයන් මෙම වර්ධනයේ විභවතාව කෙරෙහි අහිතකරව බලපානු ඇත. 2017 වර්ෂයේ සියයට 2.3 ක් පැවති යූරෝ කලාපයේ ආර්ථික වර්ධනය 2018 වර්ෂයේ දී සියයට 2.4 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ සඳහා යූරෝ කලාපයේ අපේක්ෂිත මට්ටම ඉක්මවා දේශීය ඉල්ලුම වර්ධනය වීම, හිතකර මූල්‍ය ප්‍රතිපත්තිය සහ විදේශීය ඉල්ලුම වර්ධනය වීම හේතුවී ඇත.

**වගුව 2.1| තෝරාගත් රටවල් කිහිපයක මූලික ආර්ථික දර්ශක සාරාංශය-2017**

| රට | ද.දේ.නි. වර්ධනය (වාර්ෂික ප්‍රතිශත වෙනස) | උද්ධමනය (ප්‍රතිශතය) | විරැකියා (ප්‍රතිශතය) | රාජ්‍ය මූල්‍ය හිඟය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) | දළ රාජ්‍ය ණය (ද.දේ.නි. ප්‍රතිශතයක් ලෙස) |
|---|---|---|---|---|---|
| ආජන්ටිනාව | 2.9 | 25.7 | 8.4 | -6.5 | 52.6 |
| ඕස්ට්‍රේලියාව | 2.3 | 2 | 5.6 | -2.2 | 41.6 |
| බ්‍රසීලය | 1 | 3.4 | 12.8 | -7.8 | 84 |
| කැනඩාව | 3 | 1.6 | 6.3 | -1 | 89.7 |
| චිලී | 1.5 | 2.2 | 6.7 | -2.7 | 23.6 |
| චීනය | 6.9 | 1.6 | 3.9 | -4 | 47.8 |
| ප්‍රංශය | 1.8 | 1.2 | 9.4 | -2.6 | 97 |
| ජර්මනිය | 2.5 | 1.7 | 3.8 | 1.1 | 64.1 |
| ග්‍රීසිය | 1.4 | 1.1 | 21.5 | 0 | 181.9 |
| ඉන්දියාව | 6.7 | 3.6 | …. | -6.9 | 70.2 |
| ඉන්දුනීසියාව | 5.1 | 3.8 | 5.4 | -2.5 | 28.9 |
| ඉතාලිය | 1.5 | 1.3 | 11.3 | -1.9 | 131.5 |
| ජපානය | 1.7 | 0.5 | 2.9 | -4.2 | 236.4 |
| කොරියාව | 3.1 | 1.9 | 3.7 | 1.9 | 39.8 |
| මැලේසියාව | 5.9 | 3.8 | 3.4 | -2.9 | 54.2 |
| මෙක්සිකෝව | 2 | 6 | 3.4 | -1.1 | 54.2 |
| රුසියාව | 1.5 | 3.7 | 5.2 | -1.5 | 17.4 |
| සිංගප්පූරුව | 3.6 | 0.6 | 2.2 | 5.9 | 110.9 |
| දකුණු අප්‍රිකාව | 1.3 | 5.3 | 27.5 | -4.5 | 52.7 |
| ස්පාඤ්ඤය | 3.1 | 2 | 17.2 | -3.1 | 98.4 |
| ශ්‍රී ලංකාව | 3.1 | 7.1 | 4.2 | -5.5 | 77.6 |
| තායිලන්තය | 3.9 | 0.7 | 0.7 | -0.6 | 41.6 |
| එක්සත් රාජධානිය | 1.8 | 2.7 | 4.4 | -2.3 | 87 |
| එක්සත් ජනපදය | 2.3 | 2.1 | 4.4 | -4.6 | 107.8 |
| වියට්නාමය | 6.8 | 3.5 | 2.2 | -4.7 | 58.2 |
| වෙනිසියුලාව | -14 | 1087.5 | 27.1 | -31.8 | 34.9 |

මූලාශ්‍රයඃ ලෝක ආර්ථික විශ්ලේෂණය, ජා.මූ.අ, අප්‍රේල් 2018 Fiscal Monitor, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, 2018 අප්‍රේල්
වාර්ෂික වාර්තාව 2017, ශ්‍රී ලංකා මහ බැංකුව

2017 වර්ෂයේ සියයට 4.8 ක්ව පැවති නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් රටවල ආර්ථික වර්ධනය 2018 වර්ෂයේදී සියයට 4.9 කින් පමණ වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ සඳහා භාණ්ඩ නිර්යාතකරුවන් නැවත යථා තත්වයට පත්වීම සහ භාණ්ඩ ආයාතකරුවන්ගේ ඉහළ ක්‍රියාකාරකම් හේතු වී ඇත. ආයෝජන ශක්තිමත් වීම, ව්‍යාපාරික ආදායම සහ හිතකර මුදල් ප්‍රතිපත්තීන් පිළිඹිබු කරමින් භාණ්ඩ නිර්යාත ආර්ථිකයන් නැවත යථා තත්වයට පැමිණ ඇත. මෙයට සමගාමීව, දේශීය ඉල්ලුම වර්ධනය වීම සහ අපනයන ඉහළ යාම හේතු කොට ගෙන භාණ්ඩ ආනයනික ආර්ථිකයන්හි වර්ධනය ශක්තිමත්ව පවතිනු ඇත. කෙසේ වුව ද, චීනයේ ආර්ථික වර්ධනය 2018 වර්ෂයේදී සියයට 6.6 ක මධ්‍යස්ථ වර්ධනයක් පෙන්නුම් කරමින් 2019 වර්ෂයේදී සියයට 6.4 ක් වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර මේ සඳහා විදේශීය ඉල්ලුම වර්ධනය වීම හේතු වී ඇත. මේ අතර, ඉන්දියාවේ ආර්ථිකය 2018 වසරේදී සියයට 7.4 කින් සහ 2019 වසරේදී සියයට 7.8 කින් වර්ධනය වනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර මේ සඳහා විදේශ විනිමය හුවමාරු සම්බන්ධයෙන් වූ මූලාරම්භයෙහි පැවති අස්ථායි බලපෑම් සහ භාණ්ඩ සහ සේවා බද්ද ක්‍රියාත්මක කිරීම හේතු විය.

කෙසේ වුවද, භූ දේශපාලනික අස්ථාවරත්වය තවමත් ගැටළුවක්ව පවතී. ඉහළ ණය මට්ටම සහ සමහර අංශවල අධික නිෂ්පාදන ධාරිතාව හේතුකොට ගෙන චීන ආර්ථිකයේ අවදානම වැඩි කරනු ඇත. මෙයට අමතරව, බොහොමයක් රටවල පවතින ජනගහන සංයුතියේ වෙනස්වීම් සහ අඩු නිෂ්පාදන ඵලදායිතා මට්ටම හේතුකොට ගෙන ගෝලීය ආර්ථික වර්ධනය මැදකාලීන සහ දිගුකාලීනව මන්දගාමී වනු ඇත.

2017 වර්ෂයේ දී සියයට 5.5 ක්ව පැවති පහළ ආදායම් ලබන රටවල ආර්ථික වර්ධනය 2018 වර්ෂයේදී සියයට 5.7 ක් දක්වා ඉහළ යනු ඇතැයිද 2019-2020 කාලසීමාව තුළදී සියයට 6.1 ක සාමාන්‍ය අගයක් ගනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ සඳහා ඛණිජමය ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළයාම, කෘෂිකාර්මික නිමැවුමෙහි වර්ධනය සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වූ ආයෝජනය අඛණ්ඩව සිදු කිරීම හේතු විය.

## 2.2 ගෝලීය උද්ධමනය සහ පොළී අනුපාත

සංවර්ධිත හා නැගී එන වෙළඳපොල මෙන්ම දියුණුවෙමින් පවතින ආර්ථිකයන්හි වෙළඳ භාණ්ඩවල මිල ඉහළ යාම හේතුවෙන් 2018 වර්ෂයේදී ගෝලීය උද්ධමනය වැඩිවනු ඇතැයි අපේක්ෂා කෙරේ. 2018 වර්ෂයේදී සංවර්ධිත ආර්ථිකයන්හි උද්ධමනය සියයට 2.0 ක මට්ටමකට ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. බලශක්ති මිල වැඩිවීම හේතුවෙන් ඇමරිකා එක්සත් ජනපදයේ වාර්ෂික උද්ධමනය සියයට 2.5 දක්වා වැඩිවනු ඇතැයි පුරෝකථනය කර ඇත. 2018 වර්ෂයේ දී යුරෝ ආර්ථිකයන්හි උද්ධමනය 1.5 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානියේ උද්ධමනය 2018 වර්ෂයේදී සියයට 2.7 ක මට්ටමෙහිම නොවෙනස්ව පැවති අතර මේ සඳහා ස්ටර්ලින් පවුම අවප්‍රමාණ වීම හා ආර්ථික ක්‍රියාකාරකම්හි මන්දගාමී වර්ධනය හේතු වී ඇත. බලශක්ති සහ ආහාර මිල ගණන් වැඩිවීම සහ දේශීය ඉල්ලුම ශක්තිමත් වීම හේතුවෙන් ජපානයේ උද්ධමනය 2018 - 2019 කාලසීමාව තුළ සියයට 1.1 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මේ අතර, නැගී එන වෙළඳ පොළ සහ දියුණුවෙමින් පවතින ආර්ථිකයන්හි (වෙනිසියුලාව හැර) උද්ධමනය 2018 වර්ෂයේදී සියයට 4.6 ක් දක්වා ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇත. චීනයේ උද්ධමනය 2018 වර්ෂයේදී සියයට 2.5 ක් දක්වා ඉහළ යනු ඇත. ඉන්දියාවේ උද්ධමනය 2018 සහ 2019 වර්ෂවලදී සියයට 5.0 ක මට්ටමක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පොළී අනුපාත පිලිබඳව සලකා බැලීමේදී, 2018 " ලෝක ආර්ථික දැක්ම" (World Economic Outlook) වාර්තාව මඟින් පුරෝකථනය කර ඇති පරිදි 2018 සහ 2019 වර්ෂවලදී සය මාසික ඇමරිකන් ඩොලර් තැන්පතු මත, ලන්ඩන් අන්තර් බැංකු ඒක්ෂණ පොලී අනුපාත (LIBOR) පිළිවෙළින් සියයට 2.4 ක් සහ සියයට 3.4 ක සාමාන්‍ය අගයක පවතිනු ඇත. මේ අතර ත්‍රෛමාසික යූරෝ තැන්පතු අනුපාත 2018 සහ 2019 වර්ෂවලදී පිළිවෙළින් සියයට - 0.3 ක සහ 0.0 ක සාමාන්‍ය අගයක පවතිනු ඇත. සය මාසික ජපන් යෙන් තැන්පතු මත වන පොලී අනුපාතය 2018 සහ 2019 සඳහා සියයට 0.0 ක් සහ සියයට 0.1 ක් වනු ඇත.

## 2.3 විනිමය අනුපාත

පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ශක්තිමත් වීම හේතුවෙන් 2018 දී සංවර්ධිත ආර්ථිකයන් සහ නැගී එන වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි විනිමය අනුපාත ශක්තිමත් වනු ඇතැයි අපේක්ෂිතය. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ "WEO 2018 වාර්තාව" අනුව ඇ. ඩොලරය සහ යූරෝ මුදල් ඒකකයන්හි සඵල මූර්ත අගය 2017 අගෝස්තු මාසයේ පැවති මට්ටමට ආසන්න මට්ටමක පවතිනු ඇත. ජපන් යෙන් මුදල් ඒකකය පොලී අනුපාත විචලනයන් පුළුල්වීම හේතුවෙන් සියයට 5 කින් අවප්‍රමාණය වී

ඇති අතර බ්‍රිතාන්‍ය පවුම සියයට 4 කින් අධි ප්‍රමාණය වී ඇති අතර එංගලන්ත බැංකුව විසින් නොවැම්බර් මාසයේදී පොළී අනුපාත ඉහළ දැමීම එයට හේතු වී ඇත. නැගී එන වෙළඳපොළ ආර්ථිකයන්හි මුදල් ඒකක සලකා බැලීමේදී, රෙන්මින්බි මුදල් ඒකකය සියයට 2 කින් සහ මැලේසියන් රින්ගිට් මුදල් ඒකකය සියයට 7 කින් අධිප්‍රමාණය වී ඇති අතර මේ සඳහා ගෝලීය ආර්ථික දැක්මෙහි වර්ධනය වීම සහ පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ශක්තිමත් වීම හේතු වී ඇත. මෙයට ප්‍රතිවිරුද්ධව, මෙක්සිකානු පෙසෝ මුදල් ඒකකය උතුරු ඇමරිකානු නිදහස් වෙළඳ ගිවිසුම සම්බන්ධයෙන් දැනට පවතින අවිනිශ්චිතභාවය හේතුකොටගෙන අවප්‍රමාණය වී ඇති අතර තුර්කි ලීරා මුදල් ඒකකය ඉහළ උද්ධමන අනුපාතිකය හේතුවෙන් සියයට 4.5 කින් අවප්‍රමාණය වී ඇත.

## 2.4 අයවැය හිඟය

ගෝලීය අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2017 වර්ෂයේ පැවති සියයට 3.3 අගයක සිට ප්‍රතිශතාංක 0.1 කින් 2018 වර්ෂයේදී සියයට 3.2 ක් දක්වා සංකෝචනය වී ඇත. මේ සඳහා බලශක්ති සහ භාණ්ඩ වල මිල ගණන් යථා තත්වයට පත්වීම සහ ගෝලීය වෙළඳාම ශක්තිමත් වීම හේතු වී ඇත. සංවර්ධිත ආර්ථිකයන්හි අයවැය හිඟය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2018 වර්ෂයේදී සියයට 2.7 ක් වනු ඇති අතර, එය 2019 වර්ෂයේදී සියයට 2.8 ක මට්ටමක පවතිනු ඇතැයිද අපේක්ෂා කෙරේ. ඇ.එ.ජ. යේ ඉහළ පුනරාවර්තන වියදම් සහ කැනඩාව සහ ජපානයේ ඉහළ ප්‍රාග්ධන වියදම් පිළිඹිබු කරමින් රටවල් කීපයක මූල්‍ය තත්වය තරමක ප්‍රසාරණාත්මක තත්වයක් පෙන්නුම් කරන ලදී.කෙසේ වුවද, 2017 වර්ෂයේ සියයට 4.4 ක් ව පැවති නැගී එන වෙළඳපොල සහ මැදි ආදායම් ආර්ථිකයන්හි අයවැය හිඟය 2018 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 4.2 ක් දක්වා සුළු වශයෙන් සංකෝචනය වී ඇති අතර මේ සඳහා රටවල් වල සිදුවූ රාජ්‍ය මූල්‍ය සංවර්ධනයන් හේතු වී ඇත. තවද, පහළ ආදායම් සහිත සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි අයවැය හිඟය 2018 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස සියයට 4.2 ක මට්ටමක පවතිනු ඇත. මෙම වසරේදී දෙවන භාගයේදී භාණ්ඩ මිළ ඉහළ යාම හේතුවෙන් සුළු වශයෙන් ආදායමක් ඉහළ යාමක් පෙන්නුම් කළද භාණ්ඩ අපනයනික ආර්ථිකයන්හි අයවැය හිඟය තව දුරටත් අඛණ්ඩව අයහපත් වීමේ තත්වයක් පෙන්නුම් කරනු ඇත.

## 2.5 රාජ්‍ය ණය

දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 2017 වර්ෂයේ සියයට 82.4 ක් වූ රාජ්‍ය ණය 2018 වර්ෂයේදී සියයට 82.1 ක් දක්වා සංකෝචනය වී ඇත. සංවර්ධිත ආර්ථිකයන්හි 2017 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් සියයට 105.4 ක් වූ දළ රාජ්‍ය ණය ප්‍රමාණය 2018 වර්ෂයේ දී සියයට 103.9 ක් දක්වා ආන්තිකව පහළ ගොස් ඇත. මෙයට ප්‍රතිවිරුද්ධව, නැගී එන සහ වෙළඳපොළ සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයන්හි 2018 වර්ෂයේදී දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස රාජ්‍ය ණය සියයට 51.2 ක මට්ටමක පවතිනු ඇතැයි ඇස්තමේන්තු ගත කර ඇත. 2019 වර්ෂයේදී එය සියයට 52.9 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙයට අමතරව, අඩු ආදායම් සහිත සංවර්ධනය වෙමින් පවතින රටවල රාජ්‍ය ණය දළ දේශීය නිෂ්පාදිතයෙහි ප්‍රතිශතයක් ලෙස පසුගිය වසරේ පැවති සියයට 44.3 අගයක සිට 2018 වර්ෂයේදී සියයට 45.5 ක් දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 2.6 අන්තර්ජාතික වෙළඳාම සහ භාණ්ඩ මිල

අන්තර් ජාතික වෙළඳාම 2018 සහ 2019 යන වර්ෂයන්හිදී ශක්තිමත්ව පවතිනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ සඳහා ගෝලීය ආර්ථික වර්ධනය විශේෂයෙන්ම ඇමරිකා එක්සත් ජනපදය ඇතුළු සංවර්ධිත ආර්ථිකයන්හි ආයෝජනවල වර්ධනය සහ ජපානයේ ඉහළ පරිභෝජන මට්ටම හේතු වනු ඇත. ලෝක වෙළඳ ධාරිතාව පසුගිය වර්ෂයේදී පැවති සියයට 4.7 ට සාපේක්ෂව 2018 වර්ෂයේදී සියයට 4.4 කින් වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින රටවල අපනයන වර්ධනය පිළිවෙළින් සියයට 3.8 ක් සහ සියයට 5.4 ක් වනු ඇතැයි අපේක්ෂිතය. මේ අතර, සංවර්ධිත සහ සංවර්ධනය වෙමින් පවතින හා නැගී එන රටවල ආනයනය 2018 වර්ෂයේදී පිළිවෙළින් සියයට 4.1 ක් සහ සියයට 4.8 ක් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2018 වර්ෂයේ පළමු කාර්තුවේදී පාරිභෝගික භාණ්ඩ මිල ගණන් ශක්තිමත් වී ඇත. 2018 සහ 2019 වර්ෂ වලදී බොරතෙල් මිලෙහි සාමාන්‍ය අගය බැරලයට ඇ.ඩො. 65 ක අගයක් ගනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර මේ සඳහා ඉහළ ඉල්ලුම, ඔපෙක් සහ ඔපෙක් නොවන නිෂ්පාදකයින්ගේ අඛණ්ඩ නිෂ්පාදනය සීමා කිරීම් සහ ඇ.එ.ජ. බොරතෙල් නිෂ්පාදනය ඉහළයාම හේතු වී ඇත. 2018 වර්ෂයේදී ගල් අඟුරු මෙට්‍රික් ටොන් 1 ක සාමාන්‍ය මිල

ඇ.ඩො.85 ක් වනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ සඳහා තොග ප්‍රතිපූර්ණය කිරීම සහ පරිභෝජනය අඩුකිරීම හේතු විය. තවද, 2018 වර්ෂයේ ලෝක ඛනිජ තෙල් පරිභෝජනය සියයට 1.5 කින් (වාර්ෂික ප්‍රතිශතය) ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

කෘෂිකාර්මික මිල ගණන් 2018 වර්ෂයේදී සියයට 2.2 කින් සහ 2019 වර්ෂයේදී සියයට 1.3 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කරන අතර මේ සඳහා නිෂ්පාදනය අඩුවීම හේතු විය. ධාන්‍ය මිල ගණන් 2018 වර්ෂයේදී සියයට 7.5 කින් සහ 2019 වර්ෂයේදී මීට අමතරව සියයට 1.8 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. තෙල් සහ සත්ව ආහාර මිල ගණන් සෝයා බෝංචි නිෂ්පාදන සැපයුම සීමාවීම පිළිඹිබු කරමින් සියයට 4කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනයක් ඇත. 2018 වර්ෂයේදී පාන වර්ගවල මිල නොවෙනස්ව පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ. අමුද්‍රව්‍ය මිල ගණන් 2018 වර්ෂයේදී සියයට 2.5 කින් සහ එය 2019 වර්ෂයේදී තව දුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ. පොහොර මිල ගණන් 2018 වර්ෂයේදී සියයට 2 කින් ඉහළ යනු ඇතැයි පුරෝකථනය කර ඇති අතර මේ සඳහා සාපේක්ෂව සැළකිය යුතු ඉල්ලුමක් පැවතීම සහ වෙළඳපොළ මනා සැපයුම් තත්වයක් පැවතීම හේතු වී ඇත. 2018 වර්ෂයේදී ලෝහ මිල ගණන් සියයට 9 කින් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වගුව 2.2 | පාරිභෝගික භාණ්ඩ මිල ගණන්**

ඇ.ඩො

| අයිතමය | ඒකක | තත්‍ය 2016 | තත්‍ය 2017 | පුරෝකථන 2018 කාර්තුව 1 | පුරෝකථන 2018 කාර්තුව 2 | පුරෝකථන 2018 කාර්තුව 3 | පුරෝකථන 2018 කාර්තුව 4 |
|---|---|---|---|---|---|---|---|
| **බලශක්ති** | | | | | | | |
| ගල් අඟුරු,ඕස්ට්‍රේලියාව | ඇ.ඩො./මෙ.ටො | 70.1 | 86.7 | 82.3 | 79.1 | 77.7 | 76 |
| බොර තෙල්, සාමාන්‍ය* | ඇ.ඩො./බැරල් | 42.8 | 49 | 47.8 | 48.4 | 48.9 | 49.3 |
| ස්වභාවික ගෑස්, එ.ජ. | ඇ.ඩො./MMBTU | 2.5 | 3 | 3.3 | 2.8 | 2.9 | 2.9 |
| **බලශක්ති නොවන** | | | | | | | |
| **කෘෂිකාර්මික** | | | | | | | |
| පාන වර්ග | | | | | | | |
| කොකෝවා ඇට | ඇ.ඩො./මෙ.ටො | 2892 | 1957.7 | 1910.6 | 1930.1 | 1954.0 | 1983.2 |
| කෝපි, රොබස්ටා | ශත/රාත්තල් | 94.3 | 106.6 | 104.0 | 103.7 | 104.7 | 105.3 |
| තේ | ශත/කි.ග්‍රෑ | 287.4 | 375.8 | 381.2 | 381.2 | 381.2 | 381.2 |
| ආහාර | | | | | | | |
| **මේද සහ තෙල්** | | | | | | | |
| පාම්තෙල් | ඇ.ඩො./මෙ.ටො | 639.8 | 635.8 | 608.1 | 612.3 | 600.9 | 596.7 |
| සෝයා බෝංචි වලින් යුක්ත වූ ආහාර | ඇ.ඩො./මෙ.ටො | 350.2 | 362.0 | 380.5 | 380.3 | 381.1 | 377.1 |
| සෝයා බෝංචි | ඇ.ඩො./මෙ.ටො | 362.7 | 368.8 | 383.1 | 384.3 | 384.1 | 377.4 |
| **ධාන්‍ය** | | | | | | | |
| බඩඉරිඟු | ඇ.ඩො./මෙ.ටො | 159.2 | 161.9 | 173.3 | 175.4 | 176.0 | 177.3 |
| සහල් | ඇ.ඩො./මෙ.ටො | 388.3 | 425.2 | 480.4 | 483.9 | 484.1 | 484.1 |
| තිරිඟු | ඇ.ඩො./මෙ.ටො | 143.2 | 169.1 | 204.5 | 207.7 | 209.7 | 213.7 |
| **අනෙකුත් ආහාර** | | | | | | | |
| සීනි, නිදහස් වෙළඳපොල | ශත/රාත්තල් | 18.5 | 15.5 | 14.3 | 14.3 | 14.4 | 14.6 |
| **අමුද්‍රව්‍ය** | | | | | | | |
| පුළුන් | ශත/රාත්තල් | 74.2 | 83.4 | 77.6 | 78.1 | 78.7 | 77.5 |
| රබර් | ශත/රාත්තල් | 74.5 | 91.0 | 79.0 | 80.7 | 81.9 | 81.9 |
| ඉරන ලද දැව, දැව | ඇ.ඩො/ඝන මීටර් | 738.9 | 2766.6 | 697.4 | 697.4 | 697.4 | 697.4 |
| **ලෝහ සහ ඛනිජ** | | | | | | | |
| ඇලුමිනියම් | ඇ.ඩො./මෙ.ටො | 1604.2 | 1883.5 | 1902.6 | 1911.2 | 1917.3 | 1922.3 |
| කොපර් | ඇ.ඩො./මෙ.ටො | 4867.9 | 5827.0 | 5935.4 | 5952.2 | 5966.0 | 5975.0 |
| නිකල් | ඇ.ඩො./මෙ.ටො | 9595.2 | 9474.6 | 9281.8 | 9335.0 | 9387.0 | 9438.0 |

*මූලාශ්‍රය: ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, මිල පුරෝකථනය (13.07.2017),මගින් උපුටා ගන්නා ලදී.*

*www.imf.org/external/np/res/commod/index.aspx* *එක්සත් රාජධානිය බ්‍රෙන්ට්,ඩුබායි සහ බටහිර ටෙක්සාස් නිශ්චිත මිල අනුව සාමාන්‍ය ඛනිජ තෙල් මිල දැක්වේ.

# 3 පරිච්ඡේදය

## රාජ්‍ය මූල්‍ය උපනතීන්

### 3.1 සමාලෝචනය

බදු ආදායම වැඩි කිරීම සහ රජයේ වියදම කළමනාකරණය වර්ධනය කිරීමත් සමඟින් 2018 පළමු මාස හතර සඳහා ආදායම පදනම් වූ රාජ්‍ය මූල්‍ය ඒකාග්‍රතා ක්‍රියාවලිය රජය විසින් තවදුරටත් ශක්තිමත් කරන ලදී. 2018 පළමු මාස හතර තුළදී රජයේ ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුල වාර්තා කරන ලද රු. මිලියන 589,439 ට සාපේක්ෂව රු. මිලියන 622,379 ක් දක්වා සියයට 5.6 කින් වැඩි වූ අතර 2018 වසරේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 28.1 ක ප්‍රතිශතයක් ළඟාකර ගන්නා ලදී. 2017 වසරේ සමාලෝචිත කාලපරිච්ඡේදයට සාපේක්ෂව බදු ආදායම රු. මිලියන 570,471 ක් දක්වා සියයට 2.8 කින් ආන්තිකව වර්ධනය වූ අතර බදු නොවන ආදායම රු. මිලියන 51,907 ක් දක්වා සියයට 49.5 කින් කැපීපෙනෙන ලෙස වර්ධනය විය. මෙම බදු නොවන ආදායම වැඩිවීමට මහ බැංකු ලාභ පැවරුම් ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. මේ අතර, 2018 පළමු මාස හතර තුළදී රජයේ වියදම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයක වූ රු. මිලියන 823,260 කට සාපේක්ෂව රු. මිලියන 873,350 දක්වා සියයට 6.1 කින් වර්ධනය වී ඇත.

**වගුව 3.1 : අයවැය සාරාංශය : (ජනවාරි - අප්‍රේල්)**

රු. මිලියන

| අයිතමය | 2017 | 2018 තාවකාලික* |
|---|---|---|
| **ආදායම් හා ප්‍රදාන** | **590,089** | **622,712** |
| ආදායම | **589,439** | **622,379** |
| බදු නොවන | 554,715 | 570,471 |
| බදු | 34,724 | 51,908 |
| ප්‍රදාන | 650 | 333 |
| **වියදම** | **823,260** | **873,350** |
| පුනරාවර්තන | **626,469** | **685,966** |
| පොළී ගෙවීම් | 243,499 | 271,545 |
| අනෙකුත් | 382,970 | 414,421 |
| රාජ්‍ය ආයෝජන | 201,012 | 181,998 |
| අනෙකුත් | **-4,221** | 5,386 |
| **ආදායම් හිඟය (-) / අතිරික්තය (+)** | **-37,030** | **-63,587** |
| **සමස්ත අයවැය හිඟය (-) / අතිරික්තය (+)** | **-233,171** | **-250,638** |
| **මූල්‍යයනය** | **233,171** | **250,638** |
| විදේශීය මූල්‍යයනය | **14,342** | **7,235** |
| ණය ගැනීම් | 75,000 | 78,992 |
| ණය ආපසු ගෙවීම් | -60,658 | -71,757 |
| දේශීය මූල්‍යයනය | **218,829** | **243,403** |
| ණය ගැනීම් | 613,456 | 686,882 |
| ණය ආපසු ගෙවීම් | -394,627 | -443,479.0 |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

බදු පදනම පුළුල් කිරීම, බදු පද්ධතිය සරල කිරීම, බදු නිදහස් කිරීම් තාර්කීකරණය කිරීම සහ බදු පරිපාලන ක්‍රමය ශක්තිමත් කිරීම ආදිය සිදුකරමින් බදු ප්‍රතිසංස්කරණයන් කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලදී. ඍජු බදු ආදායම වර්ධනය කිරීම සඳහා 2018 අප්‍රේල් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නව දේශීය ආදායම් බදු පනත හඳුන්වා දෙන ලදී. ඒ අනුව (i) සාමාන්‍ය බදු අනුපාතය සියයට 28 ක් ද (ii) සහනදායී බදු අනුපාතය සියයට 14 ක් සහ (iii) ඉහළ බදු අනුපාතය සියයට 40 ක්ද ලෙස ස්ථර 03 කින්

ආදායම් බදු අනුපාතයන් හඳුන්වාදෙන ලදී. සේවා නියුක්තිය මත ගෙවන ආදායම් බද්ද සඳහා උපරිමය සියයට 24 දක්වා ක්‍රමානුකූලව වැඩිවන අනුපාතයන් හඳුන්වා දුන් අතර, පුද්ගලයන්ගේ ආදායම මත අයකරනු ලබන බදු සීමාවන් පුළුල් කරන ලදී. තවද ලැයිස්තුගත කොටස් හැරුණු විට ගොඩනැගිලි සහ ඉඩම් හා අනෙකුත් ආයෝජන සඳහා සියයට 10 ක ප්‍රාග්ධන ලාභ මත බද්දක් පනවන ලදී. මේ අතර වාහන ආනයනික ආවස්ථාවේ දී අයකර ගන්නා පරිදි ආර්ථික සේවා ගාස්තු බද්ද පනවන ලදී. 2017 අප්‍රේල් මස පළමු වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික සේවා ගාස්තු බද්දට යටත් සීමාව කාර්තුවකට රු. මිලියන 50 සිට රු. මිලියන 12.5 දක්වා අඩු කරන ලදී. ඉහත බදු ප්‍රතිසංස්කරණ හා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව හා මහා භාණ්ඩාගාරය යන ආයතනයන්හි බදු පරිපාලන ක්‍රියාවලියේ වැඩිදියුණු වීමේ ප්‍රතිඵලයක් ලෙස 2018 පලමු මාස හතර සඳහා ආදායම් බදු තුලින් ලද ආදායම 2017 අනුරූප කාලපරිච්ඡේදය සඳහා වූ රු. මිලියන 84,721 ට සාපේක්ෂව රු. මිලියන 95,128 ක් දක්වා සියයට 12.3 කින් වර්ධනය විය.

වක්‍ර බදු වලින් ලැබෙන ආදායම වැඩි කිරීම සඳහා රජය විසින් විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හඳුන්වා දෙන ලදී. වටිනාකම අඩු කර දැක්වීම හේතුවෙන් ආදායම් අහිමිවීම වළක්වමින් වාහන මත ඒකක අගය පදනම් වූ නිෂ්පාදන බද්දක් හඳුන්වා දුන් අතර දේශීය කර්මාන්ත ආරක්ෂා කර ගැනීම සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාතය සංශෝධනය කරන ලදී. තවද, ජාතිය ගොඩනැගීමේ බද්ද සඳහා හඳුන්වා දී තිබූ බදු නිදහස් කිරීම් ඉවත් කරන ලදී.

දේශීය ආර්ථික කටයුතු ඉහළ යාම සහ ඉහත සඳහන් කළ පරිදි ආදායම් බදු ඉහළ නැංවීමට ගත් ක්‍රියාමාර්ගයන්හි උපකාරීත්වයෙන් දේශීය ආර්ථික කටයුතු මත පදනම් වූ බදු ආදායම රු. මිලියන 193,394 ක් දක්වා සියයට 9.1 කින් වර්ධනය විය. කෙසේ නමුත් 2018 පළමු මාස හතර තුළ ආනයන මත පදනම් වූ බදු තුළින් ලද ආදායම 2017 වසරේ අනුරූප කාල පරිච්ඡේදයක දී ලද ආදායමට සාපේක්ෂව රු. මිලියන 268,007 ක් දක්වා සියයට 3.6 කින් අඩු වී ඇත. 2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ දේශීය ක්‍රියාකාරකම් සඳහා එකතු කළ අගය මත බදු වලින් ලද ආදායම රු. මිලියන 102,220 ක් දක්වා සියයට 5.6 කින් වැඩි වූ අතර ආනයන මත එකතු කළ අගය මත බදු ආදායම රු. මිලියන 57,029 ක් දක්වා සියයට 2.5 කින් වැඩි විය. එකතු කළ අගය මත බදු ආදායමෙහි මෙම වර්ධනය සඳහා බදු පදනම පුළුල් කිරීම සහ 2016 වසරේ අවසානයේ දී එකතු කළ අගය මත බදු අනුපාතය සියයට 15 ක් දක්වා ඉහළ නැංවීමට හේතු විය. 2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා දේශීය ක්‍රියාකාරකම් මත ජාතිය ගොඩ නැගීමේ බදු තුළින් ලද ආදායම රු. මිලියන 18,289 ක් දක්වා සියයට 8.7 කින් වර්ධනය වූ අතර ආනයන මත පැනවූ ජාතිය ගොඩ නැගීමේ බද්ද රු. මිලියන 6,424 ක් දක්වා සියයට 3.1 කින් වර්ධනය විය. 2016 වර්ෂය අවසානයේ දී ජාතිය ගොඩනැගීමේ බද්දට යටත් සීමාව අඩු කිරීම නිසා බදු පදනම පුළුල් වීම සහ සේවා අංශයේ බදු නිදහස් කිරීම් කිහිපයක් ඉවත් කිරීම මෙම වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

**වගුව 3.2: ඇස්තමේන්තුගත සහ තත්‍ය ආදායම සහ වියදම : 2018 ජනවාරී සිට අප්‍රේල් දක්වා**

රු. මිලියන

| අයිතමය | ඇස්තමේන්තුගත | තත්‍ය | වෙනස |
|---|---|---|---|
| **මුළු ආදායම** | **690,200** | **622,379** | **-67,821** |
| බදු ආදායම | 636,700 | 570,471 | -66,229 |
| බදු නොවන ආදායම | 53,500 | 51,908 | -1,592 |
| **මුළු වියදම** | **900,000** | **873,350** | **-26,650** |
| පුනරාවර්තන වියදම | 670,000 | 685,966 | 15,966 |
| ප්‍රාග්ධන වියදම හා ශුද්ධ ණය දීම් | 230,000 | 187,384 | -42,616 |

*මූලාශ්‍ර : ජාතික අය වැය දෙපාර්තමේන්තුව, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

2018 වර්ෂයේ පළමු මාස හතර තුල නිෂ්පාදන බදු ආදායම සියයට 9.7 ක වර්ධනයක් සමඟ රු. මිලියන 170,839 ක් වූ අතර එය 2018 වර්ෂයේ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 31.9 කි. වාහන ආනයනය වර්ධනය වීමත් සමඟ, මේ සඳහා ප්‍රධාන වශයෙන් දායකත්වය දැක්වූයේ මෝටර් රථ වාහන ආනයනය ඉහළයාමත්, එමගින් එහි වර්ධනය සියයට 15.3 ක අගයක් ගනිමින් රු. මිලියන 73,774 ක ආදායමක් ලබා ගැනීමයි. මත්පැන් හා අදාල බලපත්‍ර ගාස්තුවල සිදුකළ ප්‍රතිසංස්කරණ හේතුවෙන් සමාලෝචිත කාලය තුළ

මත්පැන් නිෂ්පාදන මගින් ලද ආදායම රු. මිලියන 41,322 ක් වූ අතර, එය සියයට 8 ක වර්ධනයක් වාර්තා කර ඇත. මේ අතර දුම්වැටි සහ දුම්කොළ මගින් එකතු කරන ලද බදු ආදායම රු.මිලියන 29,843 ක් දක්වා සියයට 25.2 ක වර්ධනයක් ලබා ඇති අතර ඒ සඳහා 2018 පළමු මාස 04 තුළ දුම්වැටි නිෂ්පාදනය සියයට 9.7 කින් දුම්වැටි මිලියන 1,101 ක් දක්වා ඉහළ යෑම හේතුවන ලදී. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නිෂ්පාදනය මත වූ බදු ආදායම පසුගිය වසරට සාපේක්ෂව මෙම වසරේ මුල් මාස හතරේ දී සියයට 13.6 කින් සංකෝචනය වී ඇත. 2018 පළමු මාස හතර තුළ පෙට්‍රල් ආනයනය සියයට 8 කින් ඉහළ ගියද, ඩීසල්/ගෑස් තෙල් ආනයනය සියයට 13.1 කින් පහළ යාම මේ සඳහා හේතු වන ලදි. මේ අතර ප්ලාස්ටික් රෙසින සහ සීනි සහිත කාබනේට් පානයන් සඳහා නිෂ්පාදන බදු හඳුන්වා දීම නිෂ්පාදන බදු ආදායම ඉහළ යාමට හේතුවිය.

නිදහස් වෙළඳ ගිවිසුම සඳහා පහසුකම් සැලසීම අරමුණු කොට 2018 අයවැය තුලින් යෝජනා කළ පරිදි, ආසන්න වශයෙන් රේගු බදු නොවන අනෙකුත් ආනයන බදු අයිතම 1200 ක පමණ බදු ඉවත් කරන ලදී. එහිදී අයිතම 900 ක් පමණ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු යටතේ ද ඉතිරිය සෙස් බදු යටතේ ද ඉවත් කර ඇත. වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු යටතේ 2018 පළමු මාසය හතර තුල එකතු කරන ලද ආදායම රු. මිලියන 36,080 ක් වූ අතර එය සියයට 11.5 ක වර්ධනයකි. කෙසේ වෙතත්, 2018 පළමු මාස හතර තුල සෙස් බදු ආදායම සියයට 14.8 කින් පහල ගොස් ඇති අතර එය රු. මිලියන 17,220 ක් විය. ඒ සඳහා තිරිඟු පිටි සහ සන්නාම රහිත (Unbranded) නව ටයර් කවර මත වූ සෙස් බදු ඉවත් කිරීම මේ සඳහා බලපාන ලදී.

දේශීය නිෂ්පාදනයට සහාය දීම සඳහා තෝරාගන්නා ලද භාණ්ඩ සඳහා බදු අනුපාතයක් වෙනස් කිරීම නිසා සමාලෝචිත කාලපරිච්ජේදය තුල විශේෂ වෙළඳ භාණ්ඩ බදු මගින් ලද ආදායම රු.මිලියන 23,961 ක් දක්වා සියයට 0.5 කින් ආන්තික වශයෙන් පහත වැටී ඇත. එමෙන්ම 2017 වර්ෂයේ පළමු මාස හතර හා සසඳා බලන විට 2018 වර්ෂයේ අනුරූප කාලපරිච්ජේදය තුලදී ආනයන බදු වලින් එකතු කල ආදායම රු. 29,340 ක් දක්වා සියයට 38.1 ක සැලකිය යුතු පහළ වැටීමක් දක්නට ලැබිණි. ඇතැම් භාණ්ඩ සඳහා තීරු බදු විරාම ලබාදීම හා ආනයන පාලන බලපත්‍ර සංශෝධනය කිරීම යනාදිය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

වියදම් පිළිබඳ සැලකීමේ දී 2018 වර්ෂයේ පළමු මාස හතර තුල වියදම් තාර්කිකරණය කිරීම හා වියදම් අධීක්ෂණ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා රජය විසින් පියවර කිහිපයක් ගෙන ඇත. 2017 වර්ෂයේ පළමු කාර්තුවේ දී රු.මිලියන 823,260 ක් වූ මුළු රාජ්‍ය වියදම 2018 වර්ෂයේ අදාල කාලපරිච්ජේදය තුළදී රු. මිලියන 873,350 ක් දක්වා සියයට 6.1 ක වර්ධනයක් දක්නට ලැබිණි. සලකා බලනු ලබන කාලපරිච්ජේදය තුළදී පුනරාවර්තන වියදම රු.මිලියන 685,966 ක් දක්වා සියයට 9.5 කින් වර්ධනය වී ඇති අතර ආයෝජන වියදම රු. 187,384 දක්වා සියයට 4.8 කින් පහත වැටී ඇත. 2017 වර්ෂයේ පළමු මාස 4 තුළ රු. මිලියන 233,171 ක් වූ රාජ්‍ය අයවැය හිඟය 2018 වසරේ අනුරූප කාලපරිච්ජේදය තුළදී රු. මිලියන 250,638 ක් දක්වා වර්ධනය වී ඇත.

## 3.2 රජයේ ආදායම

මුළු රාජ්‍ය ආදායම 2018 මුල් මාස හතර තුළදී රු. මිලියන 622,379 ක අගයක් වාර්තා කර ඇති අතර එය 2017 මුල් මාස හතර තුළදී වූ රු. මිලියන 589,440 ක අගය හා සසඳන කළ සියයට 5.6 ක වර්ධනයකි. ආදායම් බදු, දේශීය පාරිභෝජනය මත පදනම් වූ බදු සහ ආනයන මත පදනම් වූ බදු ආදායම වැඩිවීම හේතුවෙන් 2018 පළමු මාස හතර තුළ වාර්තා වූ රු. මිලියන 570,472 ක අගය 2017 එම කාලය තුළ වාර්තා වූ අගය වන රු. මිලියන 554,716 ට වඩා සියයට 2.8 ක ප්‍රතිශතයකින් වැඩිවී ඇත.

සමස්ත ආදායම වැඩිවීම කෙරෙහි ආදායම් බදු (සියයට 2.8 ) සහ නිෂ්පාදන බදු (සියයට 9.7) මගින් ඉහළ ආදායමක් එකතු කර ගැනීම ප්‍රධාන ලෙසම හේතු වී ඇත. 2018 පළමු මාස හතර තුළ උපයන විට ගෙවීම් බදු සියයට 20.3 කින් රු. මිලියන 14,711 දක්වා වර්ධනය වී ඇති අතර ආර්ථික සේවා ගාස්තු සියයට 25 කින් රු. මිලියන 24,320 ක් දක්වා වර්ධනය වී ඇත. එලෙසම අදාල කාලය තුළ දුම්කොළ හා දුම්වැටි සඳහා වන නිෂ්පාදන බද්ද සියයට 25.2 කින් රු. මිලියන 29,843 ක් දක්වා වර්ධනය වී ඇති අතර මෝටර් රථ සඳහා වන නිෂ්පාදන බදු සියයට 15.3 කින් රු. මිලියන 73,774 ක් දක්වා වර්ධනය වී ඇත.

වගුව 3.3: ඇස්තමේන්තුගත සහ තත්‍ය බදු ආදායම : 2018 ජනවාරි සිට අප්‍රේල්

රු. බිලියන

| අයිතමය | | ඇස්තමේන්තුගත | තත්‍ය |
|---|---|---|---|
| දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | | | |
| | ආදායම් සහ ලාභ මත බදු | 93.7 | 95.1 |
| | එකතු කළ අගය මත බදු - දේශීය | 107.2 | 102.2 |
| | ජාතිය ගොඩනැගීමේ බදු - දේශීය | 19.4 | 18.3 |
| | **උප එකතුව** | **220.3** | **215.6** |
| රේගු දෙපාර්තමේන්තුව | | | |
| | ආනයන බදු | 60.8 | 29.3 |
| | එකතු කළ අගය මත බදු - ආනයන | 64.5 | 57.0 |
| | ජාතිය ගොඩනැගීමේ බදු -ආනයන | 7.6 | 6.4 |
| | වරාය ගුවන් තොටුපොළ සංවර්ධන බදු | 37.5 | 36.1 |
| | සෙස් ආනයන / අපනයන | 15.9 | 17.2 |
| | විශේෂ වෙළඳ භාණ්ඩ බදු සහ අනෙකුත් | 26.6 | 24.0 |
| | නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බදු | 134.9 | 129.6 |
| | දුම්වැටි මත නිෂ්පාදන බදු * | 30.0 | 29.8 |
| | ඛනිජ තෙල් නිෂ්පාදන | 30.1 | 24.2 |
| | මෝටර් වාහන සහ අනෙකුත් | 74.8 | 75.6 |
| | **උප එකතුව** | **347.8** | **299.6** |
| සුරා බදු දෙපාර්තමේන්තුව | | | |
| | මත්පැන් | 41.7 | 41.3 |
| | **උප එකතුව** | **41.7** | **41.3** |
| අනෙකුත් | | | |
| | විදුලි සංදේශ බද්ද | 13.4 | 9.7 |
| | බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 13.5 | 4.2 |
| | **උප එකතුව** | **26.9** | **13.9** |
| **මුළු බදු ආදායම** | | **636.7** | **570.4** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

* දුම්කොළ ඇතුලුව

බදු නොවන ආදායම 2017 පළමු මාස හතරක කාලය තුළදී වාර්තා කළ රු. මිලියන 34,724 ට සාපේක්ෂව 2018 පළමු මාස හතර තුළදී රු. මිලියන 51,907 ක් දක්වා සියයට 49.5 කින් වර්ධනය වී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහා භාණ්ඩාගාරය වෙත ලාභ පැවරීම, ආදායම් වැඩිවීම් සහ සමාජ ආරක්ෂණ දායකත්වය මේ සඳහා හේතු වී ඇත. කෙසේවුවද 2018 වසරේ පළමු මාස හතර තුළ කුලී, ලාභ සහ ලාභාංශ මගින් වූ ආදායම අඩු වී ඇත.

වගුව 3.4: රාජ්‍ය ආදායම් කාර්යසාධනයේ සාරාංශය : 2018 ජනවාරි - අප්‍රේල්

රු. මිලියන

| අයිතමය | 2017 | 2018 තාවකාලික | වර්ධනය % |
|---|---|---|---|
| **බදු ආදායම** | **554,716** | **570,472** | 2.8 |
| ආදායම් බදු | 84,721 | 95,128 | 12.3 |
| දේශීය පරිභෝජනය මත පදනම් වූ බදු | 177,330 | 193,394 | 9.1 |
| එකතු කළ අගය මත බදු | 96,806 | 102,220 | 5.6 |
| නිෂ්පාදන බදු | 63,698 | 72,885 | 14.4 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 16,826 | 18,289 | 8.7 |
| ආනයන මත පදනම් වූ බදු | 277,925 | 268,007 | -3.6 |
| රේගු බදු | 47,392 | 29,340 | -38.1 |
| එකතු කළ අගය මත බදු | 55,646 | 57,029 | 2.5 |
| ජාතිය ගොඩනැගීමේ බදු | 6,230 | 6,424 | 3.1 |
| වරාය හා ගුවන්තොටුපොළ සංවර්ධන බදු | 32,353 | 36,080 | 11.5 |
| විශේෂ වෙළඳ භාණ්ඩ බදු | 24,091 | 23,961 | -0.5 |
| නිෂ්පාදන බදු | 91,999 | 97,953 | 6.5 |
| සෙස් | 20,214 | 17,220 | -14.8 |
| බලපත්‍ර ගාස්තු සහ අනෙකුත් | 14,740 | 13,943 | -5.4 |
| **බදු නොවන ආදායම** | 34,724 | 51,907 | 49.5 |
| **බදු ආදායම** | **589,440** | **622,379** | **5.6** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

රූපසටහන 3.1 | රජයේ ආදායම් කාර්යසාධනය (ජනවාරි - අප්‍රේල්, 2018 )




## ආදායම් බද්ද

සංස්ථාපිත හා සංස්ථාපිත නොවන ආදායම් බදු මගින් ලද ආදායම 2017 වසරේ මුල් මාස හතර තුලදීරු. මිලියන 34,681 ක් වු අතර, එය 2018 වසරේ අදාල කාලපරිච්ඡේදයේදි රු. මිලියන 38,620 දක්වා සියයට 11.4ක් දක්වා ඉහළ ගොස් ඇත. උපයනවිට ගෙවීම් බදු (PAYE) මගින් ලද ආදායම, 2017 වසරේ පළමු මාස හතරක කාලපරිච්ඡේදයේදි රු. මිලියන 12,230 ක් වු අතර එය 2018 වසරේ අදාල කාලපරිච්ඡේදයේදි රු. මිලියන 14,711 ක් දක්වා සියයට 20 ක වර්ධනයක් විය. මෙම වර්ෂයේ මුල් මාස හතර තුලදී මෝටර් රථ ආනයනය කිරීමේදි ආර්ථික සේවා ගාස්තු (ESC) හඳුන්වාදීම නිසා එමගින් ලද ආදායම 2017 වසරේදි අනුරූප කාලපරිච්ඡේදයට

සාපේක්ෂව 2018 වසරේදි රු. මිලියන 24,320 ක් දක්වා සියයට 25ක කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබිණි. කෙසේ වුවද, රජයේ සුරැකුම්පත් නිකුත් කිරිම, සාපේක්ෂව අඩුවීම හේතුකොට ගෙන අදාළ කාලපරිච්ඡේදයේ දී පොළී ආදායම මත රඳවා ගැනීම් බද්ද රු. මිලියන 17,477 ක් දක්වා සියයට 4.8 කින් පහත වැටී ඇත.

**වගුව 3.5: ආදායම් බදු කාර්යසාධනය ( 2018 ජනවාරි සිට අප්‍රේල්)**

රු. මිලියන

| බදු පදනම | 2017 | 2018 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| සංස්ථාපිත හා සංස්ථාපිත නොවන | 34,681 | 38,620 | 11.4 |
| උපයන විට ගෙවීම් | 12,230 | 14,711 | 20.3 |
| පොළී ආදායම මත බදු | 18,359 | 17,477 | -4.8 |
| ආර්ථික සේවා ගාස්තු | 19,451 | 24,320 | 25.0 |
| **එකතුව** | **84,721** | **95,128** | **12.3** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## එකතු කළ අගය මත බදු

දේශීය ආර්ථික ක්‍රියාකාරීත්වයේ වර්ධනය හේතු කොට ගෙන 2018 වර්ෂයේ මුල් මාස හතර තුළ එකතු කළ අගය මත බදු ආදායම 2017 වර්ෂයේ අනුරූප කාලය තුළ වු රු. මිලියන 152,451 ට සාපේක්ෂව රු. මිලියන 159,249 දක්වා සියයට 4.5 ක වර්ධනයක් ලබා ඇත. 2017 වර්ෂයේ අදාල කාලපරිච්ඡේදය තුල දී දේශීය ක්‍රියාකාරකම් සඳහා එකතුකළ අගය මත බදු ආදායම රු. මිලියන 96,806 ට සාපේක්ෂව රු. මිලියන 102,220 දක්වා සියයට 5.6 ක වර්ධනයක් දක්නට ලැබිණි. 2018 වර්ෂයේ මුල් මාස හතර තුළ ගල් අගුරු, කිරිපිටි, සිමෙන්ති සහ ලිහිසි තෙල් යනාදී අයිතම තුලින් ලද එකතුකළ අගය මත වු බදු ආදායම වර්ධනය වීම හේතුවෙන්, 2017 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේ දී ආනයන මත වු එකතු කළ අගය මත බදු ආදායම රු. මිලියන 57,029 ක් දක්වා සියයට 2.5 ක සාමාන්‍ය වර්ධනයක් දක්නට ලැබිණි.

**වගුව 3.6: එකතු කළ අගය මත බදු කාර්යසාධනය ( 2018 ජනවාරි සිට අප්‍රේල්)**

රු. මිලියන

| බදු පදනම | 2017 | 2018 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| දේශීය | 96,845 | 102,249 | 5.6 |
| ආනයන | 55,805 | 57,143 | 2.4 |
| **දළ ආදායම** | **152,650** | **159,392** | 4.4 |
| ආපසු ගෙවුම් | 199 | 143 | -28.0 |
| **ශුද්ධ ආදායම** | **152,451** | **159,249** | **4.5** |
| ආපසු ගෙවුම් දළ ආදායමේ % ලෙස | **0.1** | **0.1** | - |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

## නිෂ්පාදන බදු

නිෂ්පාදන බදු තුළින් 2018 වසරේ පළමු මාස හතර සඳහා එකතු කරන ලද ආදායම රු. මිලියන 170,839 ක් වන අතර, එය 2017 වසරේ අනුරූප කාල පරිච්ඡේදය සමඟ සැසඳීමේ දී එම කාලය තුළ වාර්තා කරන ලද රු. මිලියන 155,696 ට සාපේක්ෂව සියයට 9.7 ප්‍රතිශතයකින් වැඩි වී ඇත. ඛනිජ තෙල් නිෂ්පාදන මත ආදායම හැරුණු විට මත්පැන්, සිගරට් සහ දුම්කොළ යන මෝටර් වාහන යන අංශ වලින් ලද ආදායම වැඩිවීම මෙම වර්ධනය සඳහා හේතු වී ඇත. ඒ අනුව 2018 වසරේ වාර්ෂික ඇස්තමේන්තුගත

ආදායමින් සියයට 31.9 ක ආදායමක් අත්පත් කරගෙන ඇත. 2018 වසරේ සළකා බලන ලද කාල පරිච්ඡේදය තුළ නිෂ්පාදන බදු තුළින් ලද ආදායම මුළු බදු ආදායමෙන් සියයට 29.9 ක් වන අතර, එය සාමාන්‍ය මුළු බදු ආදායම් තනි විශාලතම දායකත්වය දරමින් පවතියි.

**වගුව 3.7: නිෂ්පාදන බදු / සුරාබදු ආදායම් කාර්යසාධනය ( 2018 ජනවාරි සිට අප්‍රේල්)**

රු. මිලියන

| බදු පදනම | 2017 | 2018 තාවකාලික | වර්ධනය (%) |
|---|---|---|---|
| මත්පැන් | 38,262 | 41,322 | 8.0 |
| දුම්වැටි හා දුම්කොළ | 23,840 | 29,843 | 25.2 |
| මෝටර් වාහන | 64,004 | 73,774 | 15.3 |
| ඛනිජ තෙල් | 27,995 | 24,179 | -13.6 |
| අනෙකුත් | 1,596 | 1,720 | 7.8 |
| **එකතුව** | **155,696** | **170,839** | **9.7** |

*මූලාශ්‍රය : රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව*

2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලපරිච්ඡේදය තුළ දී මත්පැන් නිෂ්පාදන තුළින් ලද ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය තුළ දී වාර්තා වූ රු. මිලියන 38,262 ට සාපේක්ෂව රු. මිලියන 41,322 ක් දක්වා සියයට 8.0 කින් වැඩි විය. මෙම සුරාබදු ආදායමේ වර්ධනය සඳහා 2018 වර්ෂය සඳහා වූ අයවැය යෝජනා වල දී සැර මත්පැන් මත වූ සුරාබදු අනුපාතිකයන් වැඩි කිරීම සහ ශ්‍රී ලංකාව තුළ මත්පැන් පරිභෝජනය අධෛර්යමත් කිරීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය හේතු වී ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, සැර මත්පැන් නිෂ්පාදනය සියයට 47.4 කින් ලීටර් මිලියන 8.9 ක් දක්වා අඩුවීමක් පෙන්නුම් කරන ලදී.

රූපසටහන 3.2 | නිෂ්පාදන බදු කාර්යසාධනය (ජනවාරි - අප්‍රේල් 2017 සහ 2018




2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා මෝටර් වාහන මත නිෂ්පාදන බදු ආදායම 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයේදී වාර්තා වූ රු. මිලියන 64,004 කට සාපේක්ෂව රු. මිලියන 73,774 ක් දක්වා සියයට 15.3 කින් වර්ධනය විය. සළකා බලනු ලබන කාලයේ දී මෝටර් වාහන ආනයනය 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයේදී වාර්තා වූ 13,313 ට සාපේක්ෂව 30,236 ක් දක්වා සියයට 127.1 කින් කැපී පෙනෙන

ලෙස වර්ධනය වීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. එන්ජින් ධාරිතාවය ඝන සෙන්ටිමීටරයට 1000 ට අඩු මෝටර් වාහන සඳහා නිෂ්පාදන බදු අඩු කිරීම සහ ඒකක අගය මත පදනම් බදු අනුපාත ක්‍රමය මෝටර් රථ සඳහා හඳුන්වා දීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී. තවද මෝටර් රථ හා ත්‍රීරෝද රථවල බදු අනුපාත ඉහළ දමමින් සංශෝධනය කිරීම නිෂ්පාදන බදු ආදායම වැඩිවීම සඳහා උපකාරී විය. කෙසේ නමුත්, 2018 පළමු මාස හතර සඳහා යතුරුපැදි ආනයනය 2017 වසරේ සමාන කාලපරිච්ඡේදයත් සමග සැසඳීමේදී සියයට 8.6 කින් අඩු වූ අතර, යතුරුපැදි මත නිෂ්පාදන බද්ද ඉහළ දැමීම මේ සඳහා හේතු විය.

**වගුව 3.8: මෝටර් රථ වාහන ආනයන සහ නව ලියාපදිංචි කිරීම (2018 ජනවාරි සිට අප්‍රේල්)**

ඒකකය : සංඛ්‍යාව

| අයිතමය | ආනයන | | | | නව ලියාපදිංචි කිරීම් | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2017** | **2018** | වෙනස | වර්ධනය % | **2017** | **2018** | වෙනස | වර්ධනය % |
| මෝටර් රථ | 3,313 | 30,236 | 16,923 | 127.1 | 12,760 | 25,363 | 12,603 | 98.8 |
| ත්‍රී රෝද රථ | 4,112 | 5,144 | 1,032 | 25.1 | 7,546 | 6,424 | -1,122 | -14.9 |
| යතුරු පැදි | 123,999 | 113,346 | -10,653 | -8.6 | 113,225 | 119,612 | 6,387 | 5.6 |
| මගී ප්‍රවාහන රථ | 955 | 1,077 | 122 | 12.8 | 999 | 1,171 | 172 | 17.2 |
| භාණ්ඩ ප්‍රවාහන රථ (අ) | 9,605 | 9,056 | -549 | -5.7 | 9,507 | 9,541 | 34 | 0.4 |
| ඉඩම් වාහන (ආ) | 3,958 | 3,427 | -531 | -13.4 | 4,398 | 3,440 | -958 | -21.8 |
| **එකතුව** | **155,942** | **162,286** | **6,344** | **4.1** | **148,435** | **165,551** | **17,116** | **11.5** |

*මූලාශ්‍ර : රේගු දෙපාර්තමේන්තුව සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව*

*(අ) ලොරි රථ සහ අනෙකුත් භාණ්ඩ ප්‍රවාහන රථ*

*(ආ) ට්‍රැක්ටර්, අත් ට්‍රැක්ටර් සහ අනෙකුත් ඉඩම් වාහන*

2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය සඳහා සිගරට් සහ දුම්කොළ තුළින් ලද ආදායම 2017 සමාන කාලපරිච්ඡේදයේ ද ලද රු. මිලියන 23,840 කට සාපේක්ෂව රු. මිලියන 29,843 ක් දක්වා සියයට 25.2 ක ප්‍රතිශතයකින් වැඩි වූ අතර, එය 2018 සඳහා වූ වාර්ෂික ඇස්තමේන්තුවෙන් සියයට 33.1 ක ප්‍රතිශතයක් වේ. අදාල කාලය සඳහා සිගරට් නිෂ්පාදනය මිලියන 1,101 ක් දක්වා 9.7 කින් වර්ධනය වීම මෙම ආදායම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය.

කෙසේ නමුත්, 2018 පළමු මාස හතර සඳහා ඛනිජ තෙල් නිෂ්පාදනය තුළින් ලද ආදායම 2017 වසරේ අදාල කාලපරිච්ඡේදය තුළ වාර්තා වූ රු. මිලියන 27,995 ට සාපේක්ෂව රු. මිලියන 24,179 ක් දක්වා සියයට 13.6 ක් අඩු වූ අතර, සමාලෝචිත කාලය සඳහා ඩීසල්/ ගෑස් ඔයිල් ආනයනය සියයට 13.1 කින් අඩුවීම නිසා වන බලපෑම මෙමගින් පෙන්නුම් කරයි.

### ආනයන බදු

2018 වසරේ පළමු මාස හතර තුළදී සමස්ත බදු ආදායමෙන් සියයට 5.1 කට දායක වන ආනයන බදු ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයෙහි වාර්තා කළ රු. මිලියන 47,392 ට සාපේක්ෂව 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 29,340 දක්වා සියයට 38.1 කින් අඩු වී ඇත. ආනයන බලපත්‍ර අවශ්‍යතා සංශෝධනය කිරීම, පෙට්‍රල්, ඩීසල්, තිරිඟු පිටි හා කිරිපිටි සඳහා ආනයන තීරු බදු සහන ලබා දීම, සහ අනුමත වැඩ පිළිවෙළක් යටතේ කොන්දේසි මත පදනම්ව ආනයනය කරන ලද මෝටර් වාහන බැහැර කිරීම සඳහා රේගු වටිනාකම තීරණය කිරීමේ නව නිර්දේශිත ක්‍රමවේදය මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. තවද, පොහොර, ඖෂධ නිෂ්පාදන උපකරණ හා යන්ත්‍ර සූත්‍ර සහ හඳුනාගත් නිශ්චිත ව්‍යාපෘති සඳහා ආනයන බදු නිදහස් කර ඇති අයිතමයන් ආනයනය කිරීම ද, ආනයන බදු ආදායම

කෙරෙහි අහිතකර ලෙස බලපාන ලදී. මීට අමතරව, ද්විපාර්ශ්වික සහ කලාපීය වෙළෙඳ සබඳතා ශක්තිමත් කර ගැනීමේ අරමුණින් ඇති කරගත් නිදහස් වෙළෙඳ ගිවිසුම් යටතේ බදු නිදහස් හෝ සාමාන්‍ය බදු අනුපාත යටතේ බොහෝ නිෂ්පාදිත ආනයන කටයුතු තවදුරටත් ක්‍රියාත්මක විය.

## විශේෂ වෙළෙඳ භාණ්ඩ බද්ද

2017 වසරේ මුල් මාස හතර තුළදී රු.මිලියන 24,091 ක් වූ විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු ආදායම 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළදී රු.මිලියන 23,961 දක්වා සියයට 0.5 කින් අඩු වී ඇත. සහල් වර්ග, බඩ ඉරිඟු, හාල්මැස්සන්, කරවල, අල, ලොකුළූනු, උඳු, කැබලි කළ හෝ කුඩුකරන ලද චීස් යනාදිය මත අය කෙරෙන විශේෂ වෙළෙඳ භාණ්ඩ බදු අනුපාත පහළ දැමීම සහ පරිප්පු, සැමන්, කරවල, උම්බලකඩ, ධාන්‍ය, කඩල, කුරක්කන් යනාදිය සඳහා ලබා දී ඇති බදු සහන කාලය දීර්ඝ කිරීම, මෙම මධ්‍යස්ථ ක්‍රියාකාරීත්වය සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත.

## ජාතිය ගොඩනැගීමේ බද්ද

2017 වර්ෂයේ මුල් මාස හතර තුළ රු. මිලියන 23,056 ක් වූ ජාතිය ගොඩනැගීමේ බදු ආදායම 2018 වර්ෂයේ එම කාල පරිච්ඡේදය තුලදී රු. මිලියන 24,713 ක් දක්වා සියයට 7.2ක වර්ධනයක් වී ඇත. 2018 වසරේ පළමු මාස හතර තුළදී දේශීය ක්‍රියාකාරකම් මත වන ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රු. මිලියන 18,289ක් දක්වා සියයට 8.7ක වර්ධනයක් දක්නට ලැබූ අතර ආනයන මත වන ජාතිය ගොඩනැගීමේ බදු ආදායම රු. මිලියන 6,424 දක්වා සියයට 3.1 ක වර්ධනයක් දක්නට ලැබිණි. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට සහ මහල් නිවාස විකිණීමේදි තිබූ බදු නිදහස් කිරීම් ඉවත්කිරීම සඳහා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීම මගින් එකතුකළ අගය මත බදු ආදායම වර්ධනය වී ඇත. 2018 වසරේ මුල් මාස හතර තුළ ජාතිය ගොඩනැගීමේ බදු ආදායමෙන් රු. මිලියන 12,357 ක මුදලක් පළාත් සභා සඳහා මාරුකොට ඇත.

වගුව **3.9 :** පළාත් සභා වෙත ආදායම් මාරු කිරීම (2018 ජනවාරි සිට අප්‍රේල්)

රු. මිලියන

| මාසය | ජාතිය ගොඩනැගීමේ බද්ද | | මෝටර් රථ වාහන ලියාපදිංචි කිරීමේ ගාස්තු | මුද්දර බද්ද | එකතුව |
|---|---|---|---|---|---|
| | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව | ශ්‍රී ලංකා රේගුව | | | |
| ජනවාරි | 2,626 | 843 | 184 | 1,596 | 5,249 |
| පෙබරවාරි | 1,845 | 825 | 200 | 176 | 3,046 |
| මාර්තු | 2,009 | 798 | 206 | 207 | 3,220 |
| අප්‍රේල් | 2,665 | 746 | 192 | 1,756 | 5,359 |
| **එකතුව** | **9,145** | **3,212** | **782** | **3,735** | **16,874** |

*මූලාශ්‍රය* **:** රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

## අනෙකුත් බදු

2017 වර්ෂයේ පළමු මාස හතරෙහි වාර්තා කරන ලද රු. මිලියන 32,353 ක් වූ වරාය හා ගුවන් තොටුපල සංවර්ධන බදු ආදායමට සාපේක්ෂව 2018 වර්ෂයේ අනුයාත කාල පරිච්ඡේදය තුල සියයට 11.5 ක වර්ධනයක් සමගින් රුපියල් මිලියන 36,080 ක් වාර්තා කරන ලදී. එය 2018 වර්ෂයේ පළමු මාස හතර තුල වාර්තා කරන ලද සමස්ථ බදු ආදායමින් සියයට 5.8 කි. ආනයන හා අපනයන මත අය කරනු ලබන සෙස් බද්ද තුලින් 2018 වර්ෂයේ පළමු මාස හතර තුල රු. මිලියන 17,220 ක ආදායමක් ඉපැයූ අතර එය 2017 අදාල කාලපරිච්ඡේදය හා සැසඳීමේදි සියයට 14.8 ක පහලයෑමකි. මස්, කිරි නිෂ්පාදන, රටඉඳි, මිදි, පෙයාස්, බීර හා වයින් ඇතුළු හඳුනාගත් භාණ්ඩ 253 ක් සඳහා පනවා තිබූ සෙස් බදු ඉවත්කිරීම මේ සඳහා ප්‍රධාන වශයෙන් බලපාන ලදී.

මේ අතර විදුලි සංදේශ බද්ද තුලින් 2017 වර්ෂයේ පළමු මාස හතර තුල වාර්තා වු රු. මිලියන 11,616 ට සාපේක්ෂව 2018 වර්ෂයේ අදාල කාල පරිච්ඡේදය තුල සියයට 16.5ක පහල යාමක් සමග රු. මිලියන 9,705ක් විය. මෙම පහළ කාර්ය සාධනය සඳහා අන්තර්ජාල සේවා මත පනවා තිබු බදු ඉවත් කිරීම සහ සිම් කාඩ්පත් සක්‍රීය කිරීමේ ගාස්තු ඉවත් කිරීම හේතු විය.

## බදු නොවන ආදායම

2018 වසරේ පළමු මාස හතර තුළදී සමස්ත රාජ්‍ය ආදායමෙන් සියයට 8.3 කට දායක වු බදු නොවන ආදායම 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදයෙහි වාර්තා කළ රු. මිලියන 34,724 ට සාපේක්ෂව 2018 වසරේ එම කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 51,907 දක්වා සියයට 49.5 කින් වැඩි වී ඇත. සමාලෝචිත කාලපරිච්ඡේදය තුළ දී රු. මිලියන 14,227 ක ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරීම්, මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු විය. තවද, සළකා බලන කාලපරිච්ඡේදය තුළ දී, විකුණුම් හා ගාස්තු රු. මිලියන 23,268 දක්වා සියයට 20.7 කින් ද, පොළී ආදායම රු.මිලියන 1,813 දක්වා සියයට 5.9 කින් ද, සමාජ ආරක්ෂණ දායක අරමුදල් රු.මිලියන 7,679 දක්වා සියයට 2.4 කින් ද සහ අනෙකුත් බදු නොවන ආදායම රු.මිලියන 1,054 දක්වා සියයට 80.9 කින් වර්ධනය වීමද මීට හේතු වී ඇත. කෙසේ වෙතත්, 2017 වසරේ අනුරූප කාලපරිච්ඡේදය හා සැසඳීමේ දී 2018 වසරේ පළමු මාස හතර තුළදී ලද ලාභ සහ ලාභාංශ ආදායම රු.මිලියන 2,814 දක්වා සියයට 35.6 කින් සැළකිය යුතු ලෙස අඩු වී ඇත. රාජ්‍ය ව්‍යවසායන්හි දුර්වල මුල්‍ය කාර්යසාධනය මීට හේතු වී ඇත.

වගුව 3.10 | රාජ්‍ය ආදායමෙහි විචලතා විශ්ලේෂණය ( ජනවාරි - අප්‍රේල්)

*රු.මිලියන*

| අයිතමය | 2017 | 2018 ඇස්තමේන්තුව | 2018 | හේතු |
|---|---|---|---|---|
| ආදායම් බදු | 84,721 | 93,700 | 95,128 | රාජ්‍ය ආදායම් කළමනාකරණ තොරතුරු පද්ධතිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව තුල ක්‍රියාත්මක කිරීම හේතුවෙන් බදු පරිපාලන ක්‍රියාවලිය ශක්තිමත් වීම සහ 2018 අප්‍රේල් පළමු දින සිට නව දේශිය ආදායම් පනත ක්‍රියාත්මකවීම ආදායම් බදු ආදායම ඉහලයාම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා ඇත. ආර්ථික සේවා ගාස්තුවට යටත්වන පිරිවැටුම් සීමාව පහල දැමීම හා වාහන ආනයනයේදි ආර්ථික සේවා ගාස්තුවක් පැනවීම ආර්ථික සේවා ගාස්තු ආදායම සැලකියයුතු ලෙස ඉහලයාම සඳහා බලපාන ලදී. සේවා නියුක්ති ආදායම මත සියයට 24 ක් දක්වා අනුක්‍රමිකව වැඩිවන අගයන් මත බදු අයකිරීම හා බදු ස්ථර පුළුල් කිරීම උපයන විට ගෙවනු ලබන බදු ආදායම ඉහලයෑම කෙරෙහි තවදුරටත් සහය දක්වන ලදී. කෙසේ වුවද, භාණ්ඩාගාර සුරැකුම්පත් සඳහා වූ පොළිය මත අයකරනු ලබන රඳවාගැනීමේ බදු ඉවත් කිරීම හේතුවෙන් රඳවාගැනීමේ බදු ආදායම පෙර වර්ෂයේ සලකා බලනු ලබන කාලයට සාපේක්ෂකව අඩුවී ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| එකතු කළ අගය මත බදු | 152,452 | 171,700 | 159,249 | 2018 වර්ෂයේ පළමු මාස හතරෙහි එකතුකල අගය මත බදු ආදායම ඉහලයාම කෙරෙහි දේශීය ක්‍රියාකාරකම් පුළුල්වීම සහ ආනයන වියදම් ඉහලයාම  බලපා ඇත. ලිහිසිතෙල්, සිමෙන්ති, කිරිපිටි සහ ගල්අගුරු ආදියෙහි ආනයන සලකා බලනු ලබන කාලය තුල ඉහලයාම ආනයන මත අයකරනු ලබන එකතුකල අගය මත බදු ආදායම ඉහල යාම සදහා මුලික වශයෙන් හේතු වීය. තවද, රාජ්‍ය ආදායම් කළමනාකරණ තොරතුරු පද්ධතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් ලැබීම් හා ගෙවීම් අධීක්ෂණය හා බදු විගණනය වර්ධනය වීම මෙන්ම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ බදු පරිපාලන ක්‍රියාවලිය පුළුල් වීම ද 2018 වර්ෂයේ මුල් මාස හතරෙහි තත්‍ය ආදායම ඉහලයාම කෙරෙහි ධනාත්මකව බලපා ඇත. |
| නිෂ්පාදන බදු | 155,696 | 176,600 | 170,839 | නිෂ්පාදන බදු ආදායම ඉහල යාම සදහා සිගරට් සහ දුම්කොළ, මොටර් රථවාහන සහ මධ්‍යසාර මගින් උපයන ලද නිෂ්පාදන බදු ආදායමෙහි වර්ධනයට හේතු වී ඇත. ඒකක අගය මත පදනම් වු නිෂ්පාදන බදු ක්‍රමවේදයක් හදුන්වාදීම සහ එන්ජින් ධාරිතාවය කියුබික් සෙන්ටිමීටර් 1000 ට අඩු මෝටර් රථ මත අයකල නිෂ්පාදන බදු පහත හෙලීමේ ප්‍රතිඵලයක් ලෙස මෝටර් රථවාහන ආනයනය සියයට 127.1 කින් ඉහලයන ලද අතර, එය මෝටර් රථවාහන මත  අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම ඉහලයාම කෙරෙහි බලපාන ලදී. සලකා බලනු ලබන කාලය තුල සිගරට් නිෂ්පාදනය මිලියන 1,101 ක් දක්වා සියයට 9.7 කින් ඉහලයාම සිගරට් මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම වර්ධනය වීම කෙරෙහි බලපාන ලදී.  කෙසේ වුවද, සලකා බලනු ලබන කාලය තුල ඩීසල් ආනයනය පහලයාම බණිජතෙල් මත අයකරනු ලබන නිෂ්පාදන බදු ආදායම පහල යෑම කෙරෙහි බලපා ඇත. |
| තීරු බදු | 47,392 | 60,800 | 29,340 | පෙට්‍රල්, ඩීසල්, කිරිපිටි, තිරිගු ඇට යනාදී ප්‍රධාන ආනයන භාණ්ඩ සදහා ලබාදුන් තීරු බදු සහන සහ නිදහස් වෙළද ගිවිසුම් යටතේ භාණ්ඩ ආනයනය කිරීම 2018 වර්ෂයේ මුල් මාස හතර තුල ආනයන බදු ආදායම පහලයෑම කෙරෙහි අහිතකරව බලපා ඇත. |
| වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බදු | 32,353 | 37,500 | 36,080 | වරාය හා ගුවන්තොටුපල බදු ආදායම ඉහලයාම සදහා බණිජතෙල්, පොහොර, රත්‍රං ආදී අතරමැදි භාණ්ඩ ආනයනය ඉහලයාම හේතු වී ඇත. කෙසේ වුවද, අධිතාක්ෂණික යන්ත්‍රසූත්‍ර හා උපකරණ මත සියයට 2.5 ක සහනදායි බදු අනුපාතයක් ප්‍රදානය කිරීම  තත්‍ය ආදායම ඇස්තමේන්තුගත ආදායමෙන් විචලනය වීම සදහා බලපා තිබේ. |
| ජාතිය ගොඩනැගීමේ බදු | 23,056 | 27,000 | 24,712 | ජාතිය ගොඩනැගීමේ බදු ආදායම ඉහලයාම සදහා ඉදිකිරීම් සේවා සපයනු ලබන කොන්ත්‍රාත්කරුවන් , නිවාස සංකීර්ණ විකිණිම, සංචාරක නියෝජිත සේවාවන් යනාදිය මත පනවා තිබු ජාතිය ගොඩනැගීමේ බදු සහන ඉවත්කිරීම ආදී ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග හේතු වී ඇත. |

වගුව **3.10 |** තවදුරටත්. . .

| | | | | |
|---|---|---|---|---|
| වෙනත් බදු | 59,045 | 69,400 | 55,124 | ආනයන මත අය කරනු ලබන සෙස් බදු ආදායම සියයට 15.6 කින් පහල ගොස් ඇති අතර, මේ සඳහා තිරිගුපිටි මත අයකල සෙස් බද්ද පහත හෙලීම හා හදුනාගත් අයිතම 253 ක් මත අය කල සෙස් බදු ඉවත් කිරීම හේතු වී ඇත. කෙසේ වුවද, අපනයන මත අයකරනු ලබන සෙස් බදු ආදායම සියයට 1.7 කින් වර්ධනය වී ඇති අතර, මේ සඳහා තේ, රබර් සහ ඛණිජ නිෂ්පාදන යන අංශයන් හි ගෝලීය ඉල්ලුම ඉහලයාම හේතු වී ඇත. අන්තර්ජාල සඳහා පනවා තිබූ විදුලි සංදේශන බද්ද ඉවත් කිරීම හේතුකොටගෙන විදුලි සංදේශන බද්ද පහල ගොස් ඇත. එමෙන්ම සලකා බලනු ලබන කාලය තුල ජාත්‍යන්තර හා දේශිය වශයෙන් දුරකථන මගින් ලබාගත් කථා කාලය පෙර වර්ෂයට සාපේක්ෂව පහත වැටීම විදුලි සංදේශන බද්ද පහල යාම කෙරෙහි බලපා ඇත. |
| බදු නොවන ආදායම | 34,724 | 53,500 | 51,907 | පසුගිය වර්ෂයට අදාල ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ පැවරීම බදු නොවන ආදායම ඉහල යාම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. රාජ්‍ය අංශයේ සේවකයින්ගේ මූලික වැටුප ඉහල යාම හේතුවෙන් සමාජ සංරක්ෂණ දායක මුදල් ඉහල යාම, විකුණුම් හා ගාස්තු මගින් ලත් ආදායම ඉහල යාම සහ එක්සත් ජාතීන්ගේ සාම සාධක මෙහෙයුම් කටයුතු මගින් ලත් ආදායම ඒකාබද්ධ අරමුදලට බැරකිරීමට කටයුතු කිරීම ආදියද බදු නොවන ආදායම වර්ධනය වීම කෙරෙහි ධනාත්මකව බලපාන ලදී. කෙසේ වුවද, රාජය සතු ව්‍යවසායන්ගෙන් අපේක්ෂිත පරිදි ලාභ හා ලාභාංශ ගෙවීම අඩු වීම හා කුලී ආදායම පහල යාම 2018 වර්ෂයේ මුල් මාස හතරෙහි තත්‍ය ආදායම අපේක්ෂිත ආදායමෙන් විචලනය වීම කෙරෙහි බලපාන ලදී. |
| **එකතුව** | **589,438** | **690,200** | **622,378** | |

*මූලාශ්‍රයඃ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදී.*

3:1 |විශේෂ සටහන /ප්‍රධාන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග : 2017 ජනවාරි-2018 ජූනි

| ක්‍රියාත්මක දිනය | ක්‍රියාමාර්ග |
|---|---|
| | **නිෂ්පාදන (විශේෂ විධිවිධාන) බද්ද** |
| 2018.02.16 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.02.15 දිනැති අංක 2058/33 දරන ගැසට් නිවේදනය<br>– අංක 22/99 රාජ්‍ය කළමනාකරණ චක්‍රලේඛය යටතේ කාණ්ඩ i, ii, සහ iii ලෙස වර්ග කරන ලද ප්‍රතිලාභ ලබන පුද්ගලයන් සඳහා නිෂ්පාදන බදු උපරිම නිදහස් සීමාව රු. මිලියන 22.0, 16.0 සහ 12.0 වශයෙන් ඉහළ නංවන ලදී. |
| 2018.02.16 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත, (2018.02.15 දිනැති අංක 2058/34 දරන ගැසට් නිවේදනය<br>– වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2018 යටතේ වාහන ආනයනය කිරීමට ප්‍රතිලාභ ලබන්නන් සඳහා වූ උපරිම නිෂ්පාදන බදු නිදහස් සීමාව රු. මිලියන 5 දක්වා ඉහළ දමන ලදී. |

| | |
|---|---|
| 2018.04.12 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධිවිධාන) පනත, ( 2018.04.12 දිනැති අංක 2066/40 දරන ගැසට් නිවේදනය<br>– වාහන ආනයනය සඳහා පළාත් පාලන සහ පළාත් සභා චක්‍රලේඛ අංක 01/2017 (2017.04.21 දිනැති) යටතේ වාහන ආනයනය සඳහා සුදුසුකම් ලබන 2017 නොවැම්බර් 09 පෙර ණයවර ලිපි විවෘත කරන ලද අය සඳහා බදු සහන ලබාදෙන ලදී. |
| 2018.04.24 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධිවිධාන ) පනත, ( 2018.04.24 දිනැති අංක 2068/9 දරන ගැසට් නිවේදනය<br>– විශ්‍රාමික ජෙනරාල් හැමිල්ටන් වනසිංහ මහතා හට වාහන ආනයනය සඳහා බලපත්‍රයක් ප්‍රදානය කරන ලදී. |
| 2018.05.15 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධිවිධාන ) පනත, ( 2018.05.15 දිනැති අංක 2071/16 දරන ගැසට් නිවේදනය<br>– රාජ්‍යතාන්ත්‍රිකයන් සහ රාජ්‍යතාන්ත්‍රික සංවිධාන විසින් 100% ක බදු නිදහස් යටතේ ආනයනය සහ ලියාපදිංචි කර ඇති වාහන විකිණීම සහ ක්ෂය කිරීම සඳහා වාර්ෂික අඩු කිරීම් ප්‍රතිශත හඳුන්වා දෙන ලදී. |
| 2018.06.01 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධිවිධාන ) පනත, ( 2018.05.31 දිනැති අංක 2073/41 දරන ගැසට් නිවේදනය<br>– භූමිතෙල් සඳහා ලීටරයකට රු. 7.00 ක නිෂ්පාදන බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 2018.05.31 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධිවිධාන ) පනත, ( 2018.06.08 දිනැති අංක 2074/39 දරන ගැසට් නිවේදනය<br>– වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛ අංක 1/2018 යටතේ වාහන ආනයනය සඳහා හිමිකම් ලැබූ පුද්ගලයන් සඳහා නිෂ්පාදන බදු උපරිම නිදහස් සීමාව රු.මිලියන 5 සිට රු.මිලියන 3.6 දක්වා ලෙස සංශෝධනය කරන ලදී. |
| 2018.06.09 | 1989 අංක 13 දරන නිෂ්පාදන බදු ( විශේෂ විධිවිධාන ) පනත, ( 2018.06.14 දිනැති අංක 2075/51 දරන ගැසට් නිවේදනය<br>– භූමිතෙල් මත නිෂ්පාදන බදු අය වීම ඉවත් කරන ලදී. |
| | **සුරාබදු ආඥා පනත** |
| 2018.01.11 | අංක 01/2018 දරන සුරාබදු නිවේදනය (2018.01.10 දිනැති අංක 2053/21 දරන ගැසට් නිවේදනය)<br>– මත්පැන් බලපත්‍ර ලාභී ආයතන ව්‍යාපාර කටයුතු සඳහා විවෘත කර තබනු ලබන වේලාව හා වසනු ලබන වේලාව සංශෝධනය කිරීම. |
| 2018.01.10 | 02/2018 දරන සුරාබදු නිවේදනය (2018.01.10 දිනැති අංක 2053/26 දරන ගැසට් නිවේදනය)<br>– සුරාබදු නිවේදන අංක 666 සඳහන් නියමයන් සංශෝධනය කිරීම. |
| 2018.01.18 | 03/2018 දරන සුරාබදු නිවේදනය (2018.01.18 දිනැති අංක 2054/41 දරන ගැසට් නිවේදන)<br>– 2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සුරාබදු නිවේදන අංක 01/2018 හි සඳහන් "මත්පැන් බලපත්‍ර ලාභී ආයතන වල ව්‍යාපාර කටයුතු සඳහා විවෘතව තබන වේලාවන් සහ වසනු ලබන වේලාව"යන්න සංශෝධනය කරන ලදී. |
| 2018.01.18 | අංක 04/2018 දරන සුරාබදු නිවේදනය (2018.01.18 දිනැති අංක 2054/42 දරන ගැසට් නිවේදනය)<br>– -2018.01.16 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව සුරාබදු නිවේදන අංක 666 සඳහන් නියමයන් සංශෝධනය කරමින් නිකුත් කල 02/2018 දරන සුරාබදු නිවේදනය සංශෝධනය කරන ලදී. |
| 2018.01.22 | අංක 05/2018 දරන සුරාබදු නිවේදනය (2018.01.23 දිනැති අංක 2055/09 දරන ගැසට් නිවේදනය)<br>– ගැසට් නිවේදන අංක 1001 සහ 1002 සඳහන් "පල්පය" යන වචනය ඉවත් කරන ලදි. |
| 2018.02.21 | අංක 07/2018 දරන සුරාබදු නිවේදනය (2018.02.21 දිනැති අංක 2059/32 දරන ගැසට් නිවේදනය)<br>– පානීය නොවන ස්ප්‍රීතු ආනයනය කිරීමේදී තොග කිලෝ ග්‍රෑමයක් සඳහා අයකරන ලද සුරාබද්ද බද්ද රු. 9.00 කින් අඩු කරන ලදී. |
| 2018.04.16 | අංක 08/2018 දරන සුරාබදු නිවේදනය (2018.04.09 දිනැති අංක 2066/2 දරන ගැසට් නිවේදනය)<br>– සුරාබදු ආඥා පනතේ සිදු කරන ලද සංශෝධනයට අනුව රා මැදීම හා බෑම සඳහා බලපත්‍ර ගාස්තුවක් හඳුන්වා දෙන ලදී. |
| 2018.04.01 | අංක 09/2018 දරන සුරාබදු නිවේදනය (2018.04.06 දිනැති අංක 2065/57 දරන ගැසට් නිවේදනය)<br>– රා බෝතල් කිරීමේ වාර්ෂික බලපත්‍ර ගාස්තුව රුපියල් 500,000 අඩු කරන ලදී. |

| | |
|---|---|
| 2018.06.13 | අංක 10 /2018 දරන සුරාබදු නිවේදනය (2018.06.13 දිනැති අංක 2075/23 දරන ගැසට් නිවේදනය)<br>– අංක 07/2018 දරන සුරාබදු නිවේදනය මෙමගින් සංශෝධනය කරන ලදී. |
| 2018.06.13 | අංක 11/2018 දරන සුරාබදු නිවේදනය (2018.06.13 දිනැති අංක 2075/24 දරන ගැසට් නිවේදනය)<br>– රා තැබෑරුම් විවෘත කරනු ලබන සහ වසනු ලබන වේලාවන් සංශෝධනය කිරීම. |
| | **වරාය සහ ගුවන්තොටුපල සංවර්ධන බදු** |
| 2018.04.05 | 2011 අංක 18 දරන වරාය සහ ගුවන්තොටුපොල සංවර්ධන බදු පනත (2018.04.06 දිනැති අංක 2065/42 දරන ගැසට් නිවේදනය)<br>– අධි තාක්ෂණික යන්ත්‍ර සූත්‍ර හා උපකරණ මත 2.5% ක අනුග්‍රාහක වරාය හා ගුවන්තොටුපල බද්දක් ප්‍රදානය කරන ලදී. |
| 2018.04.01 | **සංස්ථාපිත ආදායම් බදු**<br>– *සම්මත අනුපාත සියයට 28* - මූල්‍ය සේවා, රක්ෂණය, වෙළඳාම,නිෂ්පාදනය, සහ අතිකුත් අනුග්‍රාහක හෝ ඉහළ බදු අනුපාතය යටතට ගැනෙන<br>– *අනුග්‍රාහක අනුපාත සියයට 14*- සුළු පරිමාණ ව්‍යවසායකයන්, කෘෂිකාර්මික, අධ්‍යාපන සේවා, සංචාරක ප්‍රවර්ධන, තාක්ෂණ සේවා, පුණ්‍ය ආයතන, සේවක අර්ථ සාධක අරමුදල, සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල සහ විශ්‍රාම අරමුදල |
| 2018.04.01 | ඉහළ *අනුපාත සහිත සියයට 40* - ඔට්ටු සහ සූදු, දුම්කොළ සහ මධ්‍යසාර<br>**පුද්ගලික ආදායම් බදු**<br>**බදු අයකල හැකි ආදායම** — **බදු අනුපාතය**<br>පළමු 600,000 — 4%<br>600,000 - 1,200,000 — 8%<br>1,200,000 - 1,800,000 — 12%<br>1,800,000 - 2,400,000 — 16%<br>2,400,000 - 3,000,000 — 20%<br>3,000,000 ඉහළ — 24% |
| 2018.04.01 | **සේවා නියුක්ති ආදායම් බද්ද**<br>– සේවා නියුක්ති ආදායම මත සියයට 24 ක් දක්වා අනුක්‍රමිකව වැඩිවන අගයන් මත බදු අය කරන අතර බදු ස්ථර පුළුල් කර ඇත.<br>– සුදුසුකම් ලබන ගෙවීම් දීමනාව රු.250,000 සිට රු.700,000 දක්වා වැඩි කරන ලදී.<br>– සේවාන්ත ලැබීම් සඳහා බදුකරණයේ කිසිඳු වෙනසක් ඇති නොකරන ලදී.<br>දෙවන ආදායම:<br>පළමු රු.50,000 මාසිකව : 10%<br>ඉතිරිය : 20% |
| 2018.04.01 | **රඳවා ගැනීමේ බද්ද**<br>**කාණ්ඩය** — **ප්‍රතිශතය**<br>බැංකු තැන්පතු මත පොලිය - ජ්‍යෙෂ්ඨ පුරවැසි — 5% (වාර්ෂික රු. මි 1.5 ට වැඩිවන)<br>අනිකුත් — 5%<br>සංස්ථාපිත ණය සුරැකුම්පත් මත පොලිය — 5%<br>රාජ්‍ය සුරකුම්පත් මත පොලිය — නැත<br>බදු කුලීය — 10%<br>විශේෂිත ගාස්තු - රු. 50,000 ට වැඩි — 5%<br>හවුල් ව්‍යාපාර - එක් හවුල්කරුවන්ගේ කොටස — 8%<br>ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ වෙන්දේසි මත මැණික් විකිණුම් — 2.5%<br>අනිකුත් (ලාභාංශ, පුරස්කාර ආදිය) — 14% |
| | **ප්‍රාග්ධන දීමනා ව්‍යුහය** |
| 2018.04.01 | **විස්තරය** — **ප්‍රතිශතය**<br>පරිගණක සහ දත්ත හැසුරුම උපකරණ — 20%<br>වාහන — 20% |

| | |
|---|---|
| | යන්ත්‍ර සූත්‍ර 20%<br>ගොඩනැගිල්ල 5%<br>කීර්තිනාමය ඇතුලුව අස්පෘශ්‍ය වත්කම් සත්‍ය ප්‍රයෝජනවත් ආයුකාලය හෝ 5% |
| | **ප්‍රාග්ධන ලාභ මත බදු** |
| 2018.04.01 | – ඉඩම් හා ගොඩනැගිලි සහ අනෙකුත් ආයෝජන ප්‍රතිශත කොටස ඇතුලත් නොවන පරිදි 10% ක් |
| | **ආයෝජන දිරිගැන්වීම් ක්‍රමය** |
| 2018.04.01 | පුද්ගලයකු විසින් තක්සේරු වර්ෂයක් තුලදී ක්ෂය කල හැකි වත්කම් මත කරන ලද වියදම් මත ක්ෂය දීමානව මත පදනම්ව නව ආයෝජන දිරිගැන්වීම් ක්‍රමයක් යෝජනා කරන ලදී.<br><br>**ආදායම් සංරක්ෂක පනත** |
| 2018.03.17 | 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂක පනත (2018.03.16 දිනැති අංක 2062/45 දරන ගැසට් නිවේදනය)<br>– තෝරාගත් අයිතම 154 සඳහා ආනයන තීරු බදු සංශෝධනය කරන ලදී.<br>– සුරතල් මත්ස්‍ය කර්මාන්තය සඳහා භාවිත කරන පැනල, මත්ස්‍ය ආහාර සඳහා භාවිතා කරන කුඩා මසුන් හා ක්ෂුද්‍ර ජීවීන් මගින් විනාශයට පත් වන සහ කොම්පෝස්ට් පොහොර ලෙස ඉවත් කල හැකි ප්ලාස්ටික් ද්‍රව්‍යය සඳහා නව සංයෝජිත වර්ගීකරණයක් හඳුන්වා දෙන ලදී.<br>– කිරි දෙන ගවයන් සඳහා ආහාර ලෙස භාවිතා කරන තෘණ සඳහා 15% වූ බදු ඉවත් කරන ලදී.<br>– ආනයනික ලොතරැයි සහ දුරකථන කාඩ් පත් සඳහා 30% වෙනුවට හෝ කිලෝ ග්‍රෑමයක් සඳහා රු. 350.00 හෝ 30% ක අනුපාතය ලෙස සංශෝධනය කරන ලදී. |
| 2018.04.18 | – 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂක පනත (2018.04.17 දිනැති අංක 2067/2 දරන ගැසට් නිවේදනය)-රත්රන් ආනයනය කිරීමේදී අය කරනු ලබන බදු ප්‍රතිශතය 15% දක්වා ඉහල දමන ලදී. |
| 2018.05.01 | – 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂක පනත (2018.05.01 දිනැති අංක 2069/2 දරන ගැසට් නිවේදනය)-සිංගප්පූරු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ රේගු සංයෝජිත වර්ගීකරණ 3539 ක ආනයන තීරු බදු ඉවත් කරන ලදී. |
| 2018.05.03 | – 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂක පනත (2018.05.02 දිනැති අංක 2069/19 දරන ගැසට් නිවේදනය)-බීඩි කොළ සඳහා ආනයනික තීරු බදු අය කිරීම 2018 මැයි 03 සිට බර මත පදනම්ව අය කිරීමට තීරණය කරන ලදී. |
| 2018.05.16 | – 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂක පනත (2018.05.15 දිනැති අංක 2071/15 දරන ගැසට් නිවේදනය)-දේශීය වෙළඳපොළ සඳහා තෙල් මිල සූත්‍රයක් හඳුන්වා දෙන ලදී. |
| | **විශේෂිත වෙළඳ භාණ්ඩ බද්ද** |
| 2018.01.19 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.01.18 දිනැති අංක 2054/40 දරන ගැසට් නිවේදනය ) - සියලුම වර්ග වල පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු සඳහා විශේෂිත වෙළඳ භාණ්ඩ බද්දක් පනවන ලදී.<br><br>– පෙරන්ගාන ලද හෝ පිටි කරන ලද කේජු, උම්බලකඩ, උඳු පිටි ඇතුලත්ව අයිතම 07 ක් සම්බන්ධව පනවන ලද විශේෂිත වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාලසීමාවක් උදෙසා දීර්ඝ කරන ලදී. |
| 2018.02.01 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.01.31 දිනැති අංක 2056/33 දරන ගැසට් නිවේදනය )- තිරිඟු මත විශේෂිත වෙළඳ භාණ්ඩ බද්ද වූ කිලෝග්‍රෑමයට රු.10.00 ක් වූ බද්ද මාස 06 ක කාලසීමාවක් දක්වා දීර්ඝ කරන ලදී. |
| 2018.02.16 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.02.15 දිනැති අංක 2058/30 දරන ගැසට් නිවේදනය )- සීනි සඳහා අය කල විශේෂිත වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාල සීමාවක් සඳහා බල පැවැත්වෙන පරිදි දීර්ඝ කරන ලදී. |
| 2018.02.24 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.02.23 දිනැති අංක 2059/52 දරන ගැසට් නිවේදනය )- අර්තාපල් මත විශේෂිත වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රු.30 ක් දක්වා ඉහල දමන ලදී. |
| 2018.03.08 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.03.07 දිනැති අංක 2061/22 දරන ගැසට් නිවේදනය )- මැකරල් (මාළු), මැ වර්ගයේ ඇට, කොණ්ඩා කඩල, කව්පි සහ කුරක්කන් සඳහා අයකල විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද මාස 06 ක කාල පරිච්ඡේදයක් දක්වා දීර්ඝ කරන ලදී. |

| | |
|---|---|
| 2018.03.20 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.03.19 දිනැති අංක 2063/13 දරන ගැසට් නිවේදනය )- කොත්ඩ කඩල ආනයනය මත පනවන ලද විශේෂිත වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයක් රු. 100 දක්වා ඉවත් කරන ලදී. |
| 2018.04.01 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.04.01 දිනැති අංක 2064/49 දරන ගැසට් නිවේදනය )-අල, සහල්, බටර්, සුදු ලූණු, දොඩම්, මිදි, ඇපල්, සුදුරු, කුරහන්,රටකජු, අඹ සහ ලුණු සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද දීර්ඝ කරන ලදී. |
| 2018.05.02 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.05.01 දිනැති අංක 2069/18 දරන ගැසට් නිවේදනය )- අල කිලෝවක් සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු. 40.00 දක්වා ද, බී ළූණු සඳහා සහ රු.40.00 දක්වා ද ඉහළ දමන ලදී. |
| 2018.05.08 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.05.08 දිනැති අංක 2070/2 දරන ගැසට් නිවේදනය )- අයිතම 11 සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් මාස 06 ක කාලසීමක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2018.05.09 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.05.09 දිනැති අංක 2070/6 දරන ගැසට් නිවේදනය )<br>- පියළි නොකළ පරිප්පු ආනයනයේදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු.7.00 දක්වා ඉහළ දමන ලදී.<br>- පියළි කළ පරිප්පු ආනයනයේදී විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝ ග්‍රෑමයට රු. 12.00 දක්වා ඉහළ දමන ලදී. |
| 2018.05.21 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.05.20 දිනැති අංක 2071/85 දරන ගැසට් නිවේදනය )-අයිතම 6 සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද තවත් මාස 06 ක කාලසීමාවක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2018.06.01 | – 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (2018.05.31 දිනැති අංක 2073/37 දරන ගැසට් නිවේදනය) - පොල් සහ ආශ්‍රිත නිෂ්පාදන වල පවතින වෙළඳපල මිල ස්ථායිකරණය කිරීමේ අරමුණින් රු. 20.00 ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 2018.04.28 | – **පරිපාලනමය ගාස්තු**<br>– කිලෝග්‍රෑම් 12.5 ක ගෘහස්ත ගෑස් සිලින්ඩරයක මිල රු. 245.00 කින් ඉහළ දමන ලදී. |

## 3.3 රාජ්‍ය වියදම්

2018 වර්ෂයේ පළමු මාස හතර තුළ සමස්ත රජයේ වියදම රු. මිලියන 873,350 ක් වූ අතර, 2017 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේදී එය සියයට 6.1 ක වැඩිවීමකි. එයින් රු. මිලියන 685,966 ක් පුනරාවර්තන වියදම් වූ අතර, මූලධන වියදම් රු.බිලියන 187,384 ක් විය.රාජ්‍ය සේවකයින්ගේ හා විශ්‍රාමිකයින්ගේ වැටුප් හා වේතන සහ පොලී ගෙවීම් හි වැඩිවීමක් පෙන්නුම් කරමින් පුනරාවර්තන වියදම සියයට 9.5 කින් ඉහළ ගොස් ඇති අතර, සමාලෝචන කාලසීමාව තුළදී රාජ්‍ය ආයෝජන සියයට 9.5 කින් ඉහළ ගොස් ඇත.

වගුව 3.11 : රාජ්‍ය වියදමෙහි කාර්ය සාධනය ජනවාරි - අප්‍රේල් 2018

රු.මිලියන

| අයිතමය | 2017 | 2018 තාවකාලික |
|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **626,469** | **685,966** |
| වැටුප් | 197,518 | 210,234 |
| විශ්‍රාම වැටුප් | 59,186 | 62,829 |
| පොලී ගෙවීම් | 243,499 | 271,545 |
| වෙනත් | 126,266 | 141,358 |
| **ප්‍රාග්ධන වියදම් සහ ශුද්ධ ණයදීම්** | **196,791** | **187,384** |
| **මුළු එකතුව** | **823,260** | **873,350** |

*මූලාශ්‍රයː ජාතික අයවැය දෙපාර්තමේන්තුව, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව හා භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව*

## වැටුප් හා විශ්‍රාම වැටුප්

2017 වර්ෂයේ මෙම කාලපරිච්ඡේදය හා සැසඳීමේදී පළාත් සභා ඇතුළුව රාජ්‍ය සේවක වැටුප් හා වේතන 2018 වර්ෂයේ පළමු මාස හතර තුළදී රු.මිලියන 204,334 ක් දක්වා සියයට 3 ක ප්‍රමාණයකින් වර්ධනය වී ඇත.2018 වර්ෂයේ පළමු මාස හතර සඳහා වන විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා වන වියදම රු.මිලියන 62,729 ක් වූ අතර, එය 2017 වර්ෂයේ එම කාලසීමාවට සාපේක්ෂව සියයට 6 ක වැඩිවීමකි.

## පොළී ගෙවීම්

2018 වර්ෂයේ පළමු මාස හතර තුළ පොළී ගෙවීම් වියදම රු.මිලියන 271,545 ක් වූ අතර, එය 2017 වර්ෂයේ එම කාලසීමාව තුළ වැය කරන ලද රු.මිලියන 243,499 හා සැසඳීමේදී සියයට 8.1 ක වැඩිවීමකි. මෙම මුළු පොළී ගෙවීම් වියදමින් රු.මිලියන 217,661 ක් දේශීය ණය සඳහාද, ඉතිරි රු.මිලියන 53,884 ක් විදේශීය ණය සඳහාද පොළී ගෙවීමය.

**3.12 වගුව : රජයේ සුරැකුම්පත් සඳහා වන ඵලදා අනුපාතික සහ විනිමය අනුපාතිකයේ හැසිරීම (%) 2016-2017 ජූනි**

| කාලපරිච්ඡේදය | | භාණ්ඩාගාර බිල්පත් (%) | | | භාණ්ඩාගාර බැඳුම්කර (%) | | | | මාසික සාමාන්‍ය විනිමය අනුපාතිකය (රු./ඇ.ඩො.) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | දින 91 | දින 182 | දින 364 | අවු. 2 | අවු. 3 | අවු. 4 | අවු. 5 | |
| 2017 | ජනවාරි | 9.03 | 10.07 | 10.37 | 11.41 | - | - | 12.19 | 150.09 |
| | පෙබරවාරි | 9.32 | 10.19 | 10.58 | 12.10 | - | - | 12.89 | 150.82 |
| | මාර්තු | 9.63 | 10.62 | 10.98 | 12.30 | - | - | - | 151.43 |
| | අප්‍රේල් | 9.73 | 10.70 | 11.02 | 11.21 | - | - | 11.55 | 151.76 |
| | මැයි | 9.61 | 10.35 | 10.71 | 11.07 | - | - | 11.42 | 152.33 |
| | ජූනි | 9.60 | 10.29 | 10.47 | - | - | 11.37 | - | 152.83 |
| | ජූලි | 9.44 | 9.71 | 9.99 | - | - | 11.14 | 10.43 | 153.67 |
| | අගෝස්තු | 8.87 | 9.30 | 9.67 | 9.83 | - | - | - | 153.19 |
| | සැප්තැම්බර් | 8.71 | 9.01 | 9.10 | - | - | - | 10.09 | 152.90 |
| | ඔක්තෝම්බර් | 8.75 | 9.10 | 9.48 | - | 9.92 | - | - | 153.53 |
| | නොවැම්බර් | 8.20 | 8.88 | 9.44 | - | - | - | 10.20 | 153.66 |
| | දෙසැම්බර් | 7.69 | 8.30 | 8.90 | - | 9.55 | - | - | 153.15 |
| 2018 | ජනවාරි | 7.69 | 7.95 | 8.90 | - | - | - | - | 153.80 |
| | පෙබරවාරි | 8.24 | 8.52 | 9.59 | | 9.85 | | | 154.86 |
| | මාර්තු | 8.17 | 8.52 | 9.69 | - | - | - | 10.68 | 155.73 |
| | අප්‍රේල් | 8.10 | 8.52 | 9.59 | - | 9.79 | - | - | 156.14 |
| | මැයි | 8.34 | 8.93 | 9.62 | 12.30 | - | - | 10.51 | 157.90 |

*මූලාශ්‍ර : භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව*

## සුභසාධන වියදම්

2018 වර්ෂයේ පළමු මාස හතර තුළ සුභසාධන හා සහනාධාර ගෙවීම් සඳහා වන වියදම රු.මිලියන 468,548දක්වා සියයට 20 කින් වැඩිවී ඇති අතර, මෙම වැඩිවීම කෙරෙහි පහත සඳහන් සුභසාධන වැඩසටහන් දායක වී ඇත.

- සමෘද්ධි සහනාධාර
- වැඩිහිටි දීමනාව
- ජූලි වර්ජකයින් සඳහා වන මාසික දීමනාව
- පොහොර සහනාධාරය
- ගැබිණි මව්වරුන් සඳහා පෝෂ්‍යදායී ආහාර වැඩසටහන (පෝෂණ මල්ල)
- වකුගඩු රෝගීන් සඳහා විශේෂ දීමනාව

සමෘද්ධි මුදල් ආධාර, වැඩිහිටි දීමනාව, ආරක්ෂක හමුදා සාමාජිකයින්ගේ දෙමව්පියන් සඳහා වන දීමනා සහ ගංවතුරින් හා නියගයෙන් විපතට පත්වූ පවුල් සඳහා වන දීමනා ඇතුළත් සමාජයේ උපකාර අවශ්‍ය ජනතාවට ආධාර කිරීම සඳහා වන සුභසාධන ආධාර වැඩසටහන් සඳහා වන වියදම රු.මිලියන 27,727 ක් ලෙස ගණනය කර ඇත. මෙම සමස්ථ සුභසාධන වියදමින් රු.මිලියන 9,461 ක් මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ සේවක වන්දි වෙනුවෙන් 2018 වර්ෂයේ පළමු මාස හතර තුළ දරන ලද අතර, 2017 වර්ෂයට සාපේක්ෂව එය රු.මිලියන 9,032 ක් විය.

මාතෘ සහ ළමා සෞඛ්‍ය වැඩිදියුණු කිරීමේ අරමුණින් යුතුව රජය විසින් පළමු මාස හතර තුළදී පෝෂණ මල්ල, ත්‍රිපෝෂ වැඩසටහන, දියර කිරි හා පාසල් පෝෂණ වැඩසටහන් වැනි වැඩසටහන් රු.මිලියන 3,281 ක වියදමින් අඛණ්ඩව ක්‍රියාත්මක කර ඇත.

ත්‍රිපෝෂ වැඩසටහන සඳහාවන රු.මිලියන 509 සහ පෝෂණ මල්ල වැඩසටහන සඳහා වූ රු.මිලියන 1,316 මෙයට ඇතුළත් වේ. මෙම අදාළ කාලසීමාව තුළදී රු.මිලියන 3,375 ක වියදමින් පාසල් සිසුන් සඳහා නොමිලේ පෙළ පොත්, නිල ඇඳුම්, වාර ප්‍රවේශ පත්‍ර, පාසල් සිසුන් සඳහා සෞඛ්‍ය රක්ෂණය, නොමිලේ දහම් පාසල් පෙළපොත් හා ශිෂ්‍යාධාර ප්‍රතිලාභද ලබාදෙන ලදී. රජය විසින් රෝගීන් සඳහා බාධාවකින් තොරව නොමිලේ ඖෂධ ලබාදීමට 2018 වර්ෂයේ පළමු මාස හතර තුළ රු.මිලියන 14,174 ක වියදමක් දරා ඇත.

මෙම කාලසීමාව තුළදී රජය විසින් පොහොර සහනාධාර වැඩසටහන යටතේ වී ගොවීන් සහ අනෙකුත් කුඩා බෝග වගාකරුවන් සඳහා සියලුම වර්ගවල පොහොර ලබාදීම වෙනුවෙන් රු.මිලියන 8,009 ක වියදමක් දරා ඇත.

වගුව 3.13 : සුභසාධන වියදම් 2018 ජනවාරි - අප්‍රේල් රු. මිලියන

| අයිතමය | 2017 | 2018 |
|---|---|---|
| **මවුවරුන් හා ළමුන්** | | |
| ත්‍රිපෝෂ වැඩසටහන සහ ළදරු කිරි සහනාධාර /පෝෂණ මල්ල | 1,913 | 1,944 |
| නොමිළයේ පෙළපොත් හා නිල ඇඳුම් | 2,041 | 1,966 |
| පාසල් වාර ප්‍රවේශ පත්‍ර | 245 | 1,234 |
| පාසල් පෝෂණදායී ආහාර | 1,143 | 1,377 |
| **කෘෂිකර්මාන්තය** | | |
| පොහොර සහනාධාරය | 7,762 | 8,009 |
| **සුභසාධන ගෙවීම්** | | |
| සමෘද්ධි සහනාධාරය | 13,311 | 13,142 |
| ආබාධිත රණවිරු දීමනාව | 9,032 | 9,461 |
| වැඩිහිටි දීමනාව | 3,010 | 3,050 |
| ආබාධිත දීමනාව | 356 | 371 |
| ආහාර ආධාර, ගංවතුර හා නියං සහනාධාර | 163 | 1,328 |

*මූලාශ්‍රය: ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## රාජ්‍ය ආයෝජන වියදම්

### 1. පාසල් අධ්‍යාපනය

2018 වර්ෂයේ පළමු මාස හතර තුළදී පාසල් අධ්‍යාපනය සඳහා වන සමස්ත වියදම රු.මිලියන 67,725 ක් වූ අතර, එයින් රු.මිලියන 57,164 ක් පුනරාවර්තන වියදම් සඳහාද, රු.මිලියන 10,561 ක් මූලධන වියදම් සඳහාද වැය විය. එක් ශිෂ්‍යයෙකු සඳහා දිනකට පෝෂ්‍යදායී ආහාර සඳහා වන පිරිවැය රු. 25 සිට රු. 30 දක්වා වැඩිවූ බැවින් සුබසාධන වැඩසටහන් සඳහා වන වියදම රු.මිලියන 3,644 ක් වූ අතර එය 2017 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේදී සියයට නවයක වැඩිවීමකි. තවද, කිරි පැකට් එකක මිලද රු. 21 දක්වා රුපියලකින් වැඩි විය.

ගුණාත්මක අධ්‍යාපනයක් සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සැපයීමේ වැදගත්කම සළකාබලමින් 2018 වර්ෂයේ පළමු මාස හතර තුළදී සාමාන්‍ය අධ්‍යාපන සංවර්ධන ව්‍යාපෘති සඳහා වන ආයෝජනය රු. මිලියන 8,677 ක් වූ අතර එය 2017 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේදී සියයට 50 ක වැඩිවීමකි.

2017 වර්ෂයේදී ආරම්භ කරන ලද "ළඟම පාසැල හොඳම පාසැල"(NSBS) වැඩසටහන 2018 වර්ෂයේදීද අඛණ්ඩව ක්‍රියාත්මක විය. 2018 අප්‍රේල් මස අවසානය වනවිට මෙම NSBS වැඩසටහන සඳහා දරන ලද මුළු ආයෝජනය රු.මිලියන 7,627 ක් විය.

### 2. උසස් අධ්‍යාපනය

2018 වර්ෂයේ පළමු මාස හතර තුළදී උසස් අධ්‍යාපනය සංවර්ධනය කිරීම සඳහා රජය විසින් රු.මිලියන 14,609 ක් වියදම් කර ඇති අතර, එයින් රු.මිලියන 9,800 ක් සහ රු.මිලියන 4,809 ක් පිළිවෙලින් පුනරාවර්තන හා මූලධන වියදම් සඳහා විය.

2018 වර්ෂයේ අප්‍රේල් මස අවසානයේදී විශ්වවිද්‍යාල දහයක (10) තාක්ෂණ පීඨ පිහිටුවීම සඳහා නව ගොඩනැගිලි සංකීර්ණ ඉදිකිරීම වෙනුවෙන් රු.මිලියන 1,253 ක් වියදම් දරා ඇත. 2018 වර්ෂයේ පළමු මාස හතර තුළදී විශ්වවිද්‍යාල ශිෂ්‍යයින් 238

දෙනෙකු ලැප්ටොප් පරිගණක මිලදී ගැනීම වෙනුවෙන් ණය ලබාගෙන ඇති අතර, 2016 වර්ෂයේ සිට ලබාදුන් ණය සඳහා වන පොළී වියදම් දැරීම සඳහා මහජන බැංකුවට සහ ලංකා බැංකුවට රු.මිලියන 71 ක් ගෙවා ඇත. 2018 වර්ෂයේ අප්‍රේල් 30 වන විට ඉහත කී ණය යෝජනා ක්‍රමය යටතේ ණය ලබාගත් ශිෂ්‍ය සංඛ්‍යාව 25,175 කි. රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් අධ්‍යාපන කටයුතු කරගෙන යාම සඳහා ණය ලබාදීමේ යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම්ලත් සිසුන් තෝරා ගැනීම සඳහා 2018 මාර්තු මාසයේදී අයදුම්පත් කැඳවන ලදී. 2018 මාර්තු 31 දින අයදුම්පත් භාරගැනීම අවසන් කළ අතර, සිසුන් තෝරා ගැනීමේ ක්‍රියාවලිය 2018 අප්‍රේල් 30 වන විට සිදු කෙරෙමින් පැවතිණ.

නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු විෂය සඳහා මූලධන වියදම් වශයෙන් රු. මිලියන 503.53 ක් හා පුනරාවර්තන වියදම් වශයෙන් රු. මිලියන 1,978 ක් එකතුව රු.මිලියන 2,481.53 ක සමස්ථ වියදමක් 2018 වර්ෂයේ මුල් මාස හතර තුළදී දරන ලදී. නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු ක්ෂේත්‍රයෙහි ප්‍රධාන මූලධන ව්‍යාපෘති වල 2018 වර්ෂයේ මුල් මාස හතර තුළ මූල්‍ය ප්‍රගතිය පහත දක්වේ.

විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශයෙහි මූලධන ව්‍යාපෘති සඳහා 2018 වර්ෂයේ අප්‍රේල් මාසය වන විට රු.මිලියන 820.47 ක මුළු වියදමක් දරා තිබිණ. 2018 වර්ෂයේ අප්‍රේල් මාසය අවසන් වන විට විද්‍යා, තාක්ෂණ හා පර්යේෂණ වලට අදාළ ප්‍රධාන මූලධන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රගතිය පහත දක්වා ඇත.

වගුව 3.14 : අධ්‍යාපන අංශයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල වියදම්

රු.මිලියන

| විස්තරය | 2017 ජනවාරි - අප්‍රේල් | 2018 ජනවාරි - අප්‍රේල් |
|---|---|---|
| **උසස් අධ්‍යාපනය - පුනරාවර්තන වියදම්** | | |
| විශ්වවිද්‍යාල සහ වෙනත් උසස් අධ්‍යාපන ආයතන සඳහා පුද්ගල පඩිනඩි | 8,004 | 8,400 |
| මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් | 199 | 402 |
| **උසස් අධ්‍යාපනය - මූලධන වියදම්** | | |
| විශ්ව විද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනවල සංවර්ධන කටයුතු | 1,180 | 2,387 |
| ශිෂ්‍ය නේවාසිකාගාර 84 ක් ඉදිකිරීම | 1,272 | 1,350 |
| වයඹ විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨ ස්ථාපිත කිරීම | - | 297 |
| විශ්ව විද්‍යාල වල තාක්ෂණ පීඨ ස්ථාපිත කිරීම | 255 | 1,253 |
| විශ්ව විද්‍යාල සිසුන් සඳහා ලැප්ටොප් පරිගණක ලබාදීමට අදාළ ණය පොළී ගෙවීම | 40 | 71 |
| රුහුණු විශ්ව විද්‍යාලයේ ධීවර හා සාගර විද්‍යා පීඨය | 56 | 20 |
| අග්නිදිග විශ්ව විද්‍යාලයේ සංවර්ධන සැලසුම අදියර 1 බී | 45 | 31 |
| **නිපුණතා සංවර්ධන** | | |
| නිපුණතා අංශයේ සංවර්ධන වැඩසටහන | 205 | 325.79 |
| කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය හා ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපනය කිරීම | 41 | 15.14 |
| ආනමඩුව කාර්මික විද්‍යාලයේ ගොඩනැගිලි ඉදිකිරීම | 2 | 19.53 |
| **විද්‍යා,තාක්ෂණ සහ පර්යේෂණ** | | |
| නැනෝ තාක්ෂණ වැඩසටහන | 32 | 515.5 |
| විද්‍යා සංවර්ධන වැඩසටහන | 5 | 24.66 |
| විද්‍යාතා වැඩසටහන | 3 | 4.15 |
| ජෛව තාක්ෂණ නවෝත්පාදන උද්‍යානය ස්ථාපිත කිරීම (රජය සහ පෞද්ගලික) | - | 14.42 |

*මූලාශ්‍රය : රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව*

## 3. සෞඛ්‍යය

2018 වර්ෂයේ පළමු මාස 4 තුළදී බටහිර සහ දේශීය වෛද්‍ය අංශවලින් සමන්විත සෞඛ්‍ය ක්ෂේත්‍රය සඳහා වන රජයේ මුළු වියදම පළාත් සහ මධ්‍යම රජයේ සෞඛ්‍යය සඳහා වන වියදමද ඇතුළත්ව 2017 වර්ෂයේ එම කාලසීමාව හා සැසඳීමේදී රු.මිලියන 68,806 ක් දක්වා සියයට 11.6 කින් වැඩිවී ඇත. සෞඛ්‍යය සඳහා වන මුළු වියදමින් රු.මිලියන 59,634 ක් පුනරාවර්තන වියදම් සඳහා වන අතර මූලධන ආයෝජනය රු.මිලියන 9,172 කි.

**3.15 වගුව : සෞඛ්‍ය අංශයේ ප්‍රධාන කාර්යයන් සඳහා වන වියදම්**

රු.මිලියන

| විස්තරය | 2017 ජනවාරි - අප්‍රියෙල් | 2018 ජනවාරි - අප්‍රියෙල් |
|---|---|---|
| **මුළු පුනරාවර්තන වියදම** | **52,993** | **59,634** |
| සේවා සැපයීමේ වියදම | 25,773 | 29,480 |
| වෛද්‍ය නිලධාරීන් සහ කාර්ය මණ්ඩල වැටුප් සඳහා වන වියදම | 21,209 | 23,948 |
| වෛද්‍ය සැපයීම් | 11,325 | 14,174 |
| පළාත්සෞඛ්‍ය | 15,895 | 15,980 |
| **රාජ්‍ය ආයෝජන වියදම** | **8,663** | **9,172** |
| පොළොන්නරුව දිස්ත්‍රික් මහ රෝහල සංවර්ධනය කිරීම | 53 | 98 |
| අපස්මාර ඒකකය - ජාතික රෝහල කොළඹ | 129 | 5 |
| හම්බන්තොට හා නුවරඑළිය දිස්ත්‍රික් මහ රෝහල සංවර්ධනය කිරීම | 3 | - |
| මහරගම ජාතික පිළිකායතනය සඳහා වාට්ටුසංකීර්ණයක් ඉදිකිරීම (රසාවි ව්‍යාපෘතිය) | - | - |
| මාතෘ වාට්ටුසංකීර්ණය - ශික්ෂණ රෝහල කුරුණෑගල | 95 | - |
| වතු අංශයේ රෝහල් සංවර්ධනය කිරීම | 23 | 29 |
| හදිසි අනතුරු සේවා ඒකකය සහ  වාට්ටු සංකීර්ණය ශික්ෂණ රෝහල - රාගම | 87 | - |
| හෙල්මුට්කෝල් මාතෘ රෝහල ඉදිකිරීම (ශ්‍රී ලංකා රජය -ජර්මන් රජය) | 64 | 35 |
| ශ්‍රී ලංකාවේ පිළිකා රෝගීන් සඳහා ඉහළ ගුණාත්මක භාවයකින් යුත් අධිශක්ති විකිරණ ප්‍රතිකාර ලබා දීම | - | 55 |
| වෙනත් මූලධන ආයෝජන | 6,452 | 7,727 |
| පළාත්සෞඛ්‍යආයෝජන | 1,757 | 1,445 |

*මූලාශ්‍රය : ජාතික අයවැය දෙපාර්තමේන්තුව*

## 4. වාරිමාර්ග සහ ජල සම්පත් කළමනාකරණය

2018 වර්ෂයේ පළමු මාස 4 තුළදී වාරිමාර්ග සහ ජලසම්පත් කළමනාකරණයට අදාළ සංවර්ධන කටයුතු වෙනුවෙන් රජය විසින් රු.මිලියන 12,581 ක් ආයෝජනය කර ඇත. එයින් රු.මිලියන 9,896 ක් වැය කර ඇත්තේ මහවැලි සංවර්ධන අමාත්‍යාංශය යටතේ නව ජලාශ ප්‍රතිසංස්කරණය කිරීම හා ඉදිකිරීම මගින් මහවැලි වාරිමාර්ග යෝජනා ක්‍රමය සංවර්ධනය කිරීම වෙනුවෙනි. සමාලෝචිත කාලසීමාව තුළදී මොරගහකන්ද, කළුගඟ හා උමා ඔය ව්‍යාපෘති වැනි ප්‍රධාන වාරිමාර්ග යෝජනා ක්‍රම සඳහා දරන ලද වියදම රු.මිලියන 2,906 කි. වාරිමාර්ග යෝජනා ක්‍රම සංවර්ධනය කිරීම සහ ජලාශ ඉදිකිරීම සඳහා වාරිමාර්ග හා ජලසම්පත් අමාත්‍යාංශය විසින් ඉතිරි රු.මිලියන 2,865 ආයෝජනය කර ඇත. 2018 වර්ෂයේ පළමු මාස හතර අවසාන වන විට සංවර්ධන කටයුතු සඳහා දරන ලද විශාලතම වියදම ඇතුළත් වූ යාන්ඔය ව්‍යාපෘතිය සියයට සියයක මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කරන ලදි.

## 5. කෘෂිකර්මය

ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා වන විශේෂ වැඩසටහන් ඇතුළත්ව ප්‍රධාන සංවර්ධන කටයුතු සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙනුවෙන් රු.මිලියන 11,936 ක මුළු ප්‍රතිපාදනයක් වෙන්කර ඇත. මෙම කටයුතු සඳහා 2018 වර්ෂයේ පළමු මාස හතරතුළදී දැරීමට සිදුවූ වියදම රු.මිලියන 1,619 කි. මෙම කාලසීමාව තුළදී කුඩා වැව් හා ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම සහ පළතුරු ගම්මාන 100 ක් ස්ථාපිත කිරීම ඇතුළත්ව මෙවැනි ක්‍රියාකාරකම් කිහිපයක ස්ථාවර මූල්‍ය ප්‍රගතියක් පෙන්නුම් කර ඇත.

## 6. ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව

බීමට සුදුසු ජලය හා ගුණාත්මක සනීපාරක්ෂක පහසුකම් සැපයීමේ අරමුණ පෙරදැරිව රජය විසින් ජල සම්පාදන හා සනීපාරක්ෂාව සඳහා 2018 පළමු මාස හතර තුළදී, ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ (NWS&DB) දේශීය හා විදේශීය ණය පියවීම සඳහා මූල්‍යයනයද ඇතුළත්ව රු.මිලියන 18,495 ක මුදලක් ආයෝජනය කර ඇත. රු.මිලියන 10,009 ක් වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වශයෙන් ලබාදෙන ලද අතර NWS&DB

ණුජුව ලබාගත් ණය රු.මිලියන 6,385 ක් විය. තවද, ජල සම්පාදන හා අපවහන ව්‍යාපෘති සඳහා විදේශීය මූල්‍ය පහසුකම් වලට අදාළ දේශීය ප්‍රතිපාර්ශවීය අරමුදල් සඳහා යොදාගනු වස් මහජන බැංකුව වෙතින් ලබාගත් රු.මිලියන 2,101 ක මුදලද ඊට ඇතුළත් වේ.

මීට අමතරව පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ මුල් මාස හතර තුළ කොළඹ නගරයේ හා මහ කොළඹ බල ප්‍රදේශයේ සනීපාරක්ෂක සේවා වැඩිදියුණු කිරීම සඳහා රු.මිලියන 473 ක් ආයෝජනය කර ඇත.

**3.16 වගුව : ජල සම්පාදනය සහ සනීපාරක්ෂාව සඳහා වන වියදම්**

2018.04.30 දිනට වියදම (රු. මි.) රු.මිලියන

| ව්‍යාපෘතිය | විදේශීය අරමුදල් | දේශීය අරමුදල් | මුළු වියදම |
|---|---|---|---|
| යාපනය/කිලිනොච්චි ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය | 263 | 432 | 695 |
| අනුරාධපුර උතුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 1 | 418 | 20 | 438 |
| මාතලේ නගර ජල සම්පාදන ව්‍යාපෘතිය | 1.058 | 792 | 1,850 |
| කැළණි ගඟ දකුණු ඉවුර ජල සම්පාදන ව්‍යාපෘතිය අදියර 2 | 1,382 | 1,024 | 2,406 |
| 7 | චීන එක්සම් බැංකුව | ශ්‍රී ලංකා විදුලි සංදේශ නියාමන කොමිෂන් සභාව | 14,097.38 |
| 8 | හැටන් නැෂනල් බැංකුව | රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය | 3,550.00 |
| | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 10,391.89 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 23,943.54 |
| 9 | හොංකොන් ඇන්ඩ් ෂැංග්හයි බැංකුව | සී /ස  ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 7,018.55 |
| | | සී/ස වෙස්ට් කෝස්ට් පවර් පුද්ගලික සමාගම | 26,137.52 |
| 10 | චීනයේ කර්මානත්ත හා වාණිජ බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 11,087.02 |
| 11 | ජපන් ජාත්‍යන්තර සහයෝගිතා ආයතනය (JICA) | සී /ස  ගුවන් තොටුපල හා ගුවන් සේවා සමාගම | 109,192.48 |
| 12 | ජාතික සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 8,374.13 |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | 7,745.36 |
| 13 | ඉන්දියා එක්සිම් බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 40,818.87 |
| 14 | චීනයේ සංවර්ධන බැංකුව | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 9,933.07 |
| 15 | ආසියානු සංවර්ධන බැංකුව | ලංකා විදුලිබල මණ්ඩලය | 42,138.68 |
| 16 | සම්පත් බැංකුව පී. එල්. සී. | මාර්ග සංවර්ධන අධිකාරිය | 14,500.00 |
| 17 | යුනික්‍රෙඩිට් බෑංක් ඔස්ට්‍රියා  AG | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 9,808.35 |
| එකතුව | | | **927,384.84** |

# 4 වන පරිච්ඡේදය
# රජය සතු වාණිජ ව්‍යවසායයන්හි කාර්යසාධනය

## 4.1 සමාලෝචනය

රජය සතු ව්‍යාපාරවලින් විශේෂයෙන්ම රජය සතු වාණිජ ව්‍යාපාරවලින් ආර්ථිකයට ඇති වැදගත්කම සැලකිල්ලට ගනිමින් රජයේ උපායමාර්ගය වනුයේ මෙම රජය සතු ව්‍යවසායයන්හි සාමූහික ක්‍රියාකාරකම් වර්ධනය කිරීම, කළමනාකරණ ප්‍රතිසංස්කරණ, නවෝද්පාදිත මූල්‍යනය, ශක්තිමත් සහ ස්ථිරසාර මූල්‍ය කළමනාකරණය, තරගකාරීත්වය සඳහා විවෘත කිරීම හා ජාත්‍යන්තර වශයෙන් පොදුවේ පිළිගත් භාවිතයන් සහ ඵලදායී මානව සම්පත් කළමනාකරණය ඇති කිරීම තුළින් මෙම පොදු වගවීම ඉහළ නැංවීමත් මෙම ආයතන රජයේ අයවැය මත යැපීම රහිත ආයතන බවට පත් කිරීම සඳහා උනන්දු කරවීම සහ අවශ්‍ය පහසුකම් සැලසීමත් වේ.

2017 වර්ෂයේදී රජය සතු වාණිජ ව්‍යාපාර 55 විසින් වාර්තා කරන ලද මුළු ආදායම රු. බිලියන 1755.55 ක් වන අතර මෙය දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 13.2 ක් වේ. 2017 වර්ෂය තුළ රජය සතු වාණිජ ව්‍යාපාර 55 අතරින් රාජ්‍ය ව්‍යාපාර 39 ක් රු. බිලියන 136 ක ශුද්ධ ලාභයක් වාර්තා කර ඇති අතර රාජ්‍ය ව්‍යාපාර 16 ක් රු. බිලියන 87 ක ශුද්ධ අලාභයක් වාර්තා කර තිබුණි. රජය සතු වාණිජ ව්‍යාපාරවල වත්කම් පදනම 2016 ට සාපේක්ෂව 2017 දී සියයට 13.6 කින් ඉහළ ගොස් ඇති අතර එය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 56.8 කි.

රාජ්‍ය ව්‍යාපාරයන්හි කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2017 වසරේදී සාමූහික අභිලාෂ ප්‍රකාශ සංකල්පය හඳුන්වා දෙන ලදී. සාමූහික අභිලාෂ ප්‍රකාශ තුළ මූල්‍ය හා මූල්‍ය නොවන කාර්යසාධනය පිළිබිඹු කරනු ලබන ආයතනයේ ප්‍රධාන ක්‍රියාකාරිත්වය ඉලක්ක කර ගත් කාර්යසාධන දර්ශක ඇතුළත් වේ.

රටේ දළ ජාතික නිෂ්පාදනය සඳහා සපයනු ලබන දායකත්වය වැඩි කිරීම මගින් ශ්‍රී ලංකාවේ ආර්ථික අරමුණු ළඟා කර ගැනීමට උපායමාර්ගිකව වැදගත් රාජ්‍ය ව්‍යාපාර සඳහා සාමූහික අභිලාෂ ප්‍රකාශ වැදගත් වනු ඇත. මෙම රාජ්‍ය ව්‍යාපාර තුළින් රජය විසින් මූලික වශයෙන්ම බලාපොරොත්තු වනුයේ පොදු වගවීම ඉහළ නංවමින් යහපාලනයන් පවත්වාගනිමින් ඒවා වාණිජමය වශයෙන් වාසිදායක සහ ඵලදායී ව්‍යාපාර ඒකක බවට පත් කිරීම වේ.

2017 වසර තුළදී, ලංකා විදුලිබල මණ්ඩලය, ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ගුවන්තොටුපොල හා ගුවන්සේවා (ශ්‍රී ලංකා) සමාගම විසින් අදාළ රාජ්‍ය ව්‍යාපාරය, රේඛීය අමාත්‍යාංශය සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය සමඟ ත්‍රෛපාර්ශවික ගිවිසුමක් අත්සන් කරමින් සාමූහික අභිලාෂ ප්‍රකාශ සඳහා යොමු වූ අතර රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් දැනට එහි අරමුණු ළඟා කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග මෙහෙයවීමේ කාර්යයෙහි නිරත වී සිටියි.

එසේම, අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති පරිදි ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, නාගරික සංවර්ධන අධිකාරිය, ලංකා සතොස (පුද්ගලික) සමාගම, ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය, රාජ්‍ය දැව සංස්ථාව, ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව, මිල්කෝ (පුද්ගලික) සමාගම, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය සහ භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය යන තෝරාගත් ආයතන දහය සමඟද 2018 වසරේ ජූලි මස අවසන් වන විට සාමූහික අභිලාෂ ප්‍රකාශ ගිවිසුම් අත්සන් තැබීමට සැලසුම් කර ඇත.

## 4.2 ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 10 පිළිබඳ සමාලෝචනය

### ලංකා බැංකුව

2017 වසර අවසානයේ පැවති වත්කම් පදනම වන රු. ට්‍රිලියන 1.9, මෙම වසරේ අප්‍රේල් මස අවසානය වන විට රු. ට්‍රිලියන 2.0 ඉක්මවා ඇත. 2017 වසර අවසානයේ පැවති තැන්පතු පදනම වන රු.බිලියන 1,547 ට සාපේක්ෂව 2018 වසරේ මුල් මාස හතර තුළ තැන්පතු පදනම රු. බිලියන 1,606 දක්වා සියයට 3.8කින් වර්ධනය වී ඇත. බැංකුවේ අක්‍රීය ණය අනුපාතය 2017 වසර අවසානයේ පැවති සියයට 2.8 සිට 2018 වසරේ මුල් මාස හතර තුළ සියයට 4.3 දක්වා ඉහළ ගොස් ඇත. ලංකා බැංකුව පසුගිය වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ වාර්තා කල රු. බිලියන 10.2 ක බදු පෙර ලාභයට සාපේක්ෂව 2018 වසරේ මුල් මාස හතර තුළ රු.බිලියන 8.6 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇති අතර එය සියයට 15.7 ක පසුබෑස්මකි.

### මහජන බැංකුව

බැංකුවේ වත්කම් පදනම 2018 වසරේ මුල් මාස හතර තුළ සියයට 5.7 ක වර්ධනයක් වාර්තා කරමින් රු.බිලියන 1,551 දක්වා ඉහළ ගොස් ඇති අතර 2017

වසර අවසානයේ පැවති වත්කම් පදනම රු.බිලියන 1,467 කි. පෙර වසර අවසානයේ පැවති තැන්පතු පදනම වන රු.බිලියන 1,244 ට සාපේක්ෂව 2018 වසරේ අප්‍රේල් අවසානය වන විට තැන්පතු පදනම රු.බිලියන 1,306 දක්වා සියයට 5.0 කින් වර්ධනය වී ඇත. 2018 වසරේ ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ ණය හා අත්තිකාරම් රු.බිලියන 1,158 දක්වා සියයට 7.8 ක වර්ධනයක් වාර්තා කරයි. 2017 වර්ෂයේ අනුරූපී කාලපරිච්ඡේදයේ ඉපැයූ බදු පෙර ලාභය වන රු.බිලියන 4.6 ට සාපේක්ෂව මහජන බැංකුව 2018 වසරේ මුල් මාස හතර තුළ රු.බිලියන 7.8 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2018 වසරේ මුල් මාස හතර තුළ බැංකුවේ වත්කම් පදනම සියයට 3.7කින් රු.බිලියන 1,050 දක්වා වර්ධනය වී ඇති අතර, 2017 වසර අවසානයේ පැවති වත්කම් පදනම රු.බිලියන 1,012 කි. බැංකුවේ තැන්පතු 2018 අප්‍රේල් මස අවසානය වන විට සියයට 4.7 ක වර්ධනයක් වාර්තා කරමින් රු. බිලියන 772 ක අගයක පැවති අතර 2017 වසර අවසානයේ පැවති අගය රු.බිලියන 737කි. ණය හා අත්තිකාරම් 2018 ජනවාරි සිට අප්‍රේල් දක්වා කාලය තුළ රු.බිලියන 402 දක්වා සියයට 3.1 කින් වර්ධනය වී ඇත. 2017 වසරේ අනුරූපී කාලපරිච්ඡේදයේ ඉපැයූ බදු පෙර ලාභය වන රු.බිලියන 3.5 ට සාපේක්ෂව ජාතික ඉතිරිකිරීමේ බැංකුව 2018 වසරේ මුල් මාස හතර තුළ රු.බිලියන 3.9 ක බදු පෙර ලාභයක් වාර්තා කර ඇත.

### ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව

වසරේ පළමු මාස 04 තුළ දී ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව රු.මිලියන 2,258 ක බදු පෙර ලාභයක් හා මුළු ආදායම රු. බිලියන 14.8 ක් ලෙස වාර්තා කර ඇති අතර එය 2017 වසරේ අනුරූප කාලයේ මුළු ආදායම වූ රු. බිලියන 13.4 හා සැසඳීමේදී සියයට 10.4 ක වර්ධනයකි. සංස්ථාවේ මනා කළමනාකාරිත්වය තවදුරටත් ශක්තිමත් කරමින් මෙම කාලය තුළ දී ප්‍රධාන කළමනාකරණ තනතුරුවල පැවති පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ජීවිත රක්ෂණාවරණ දරන්නන් වෙනුවෙන් රු. බිලියන 6.8 ක් වන රක්ෂණ ක්ෂේත්‍රයේ ඉහළම ප්‍රසාද දීමනාව ප්‍රකාශ කර ඇත. වරප්‍රසාද නොලත් දරුවන් සඳහා වන සුභ පැතුම් ශිෂ්‍යත්ව ක්‍රමය හා පිළිකා රෝහලේ ළමා වාට්ටුව සඳහා අරමුදල් රැස් කිරීම සඳහා වන call-to-Donate ව්‍යාපෘතිය 2016 වර්ෂයේදී නැවත ක්‍රියාත්මක කිරීමට සංස්ථාව සැලසුම් කර ඇත.

### ලංකා විදුලිබල මණ්ඩලය (ලංවීම)

ලංකා විදුලිබල මණ්ඩලය 2017 වසරේ පළමු කාර්තුව තුල වාර්තා කළ ආදායම වූ රු.මි 50,476 ට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තුව තුළ රු.මි 54,489 ක ආදායමක් වාර්තා කර ඇත. කෙසේවෙතත්, 2017 වසරේ වාර්තා කරන ලද මෙහෙයුම් අලාභය වූ රු.මි 12,443 ට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කරන ලද මෙහෙයුම් අලාභය රු.මි 14,702 කි. 2017 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ ඒකකයක බදු පෙර පිරිවැය වූ පැයට කිලෝවොට් රු. 20.19 ට සාපේක්ෂව 2018 වසරේ ඒකකයක බදු පෙර පිරිවැය පැයට කිලෝ වොට් රු. 20.75 කි. ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය පහත වැටීම ලංකා විදුලිබල මණ්ඩලයේ කාර්යසාධනය කෙරෙහි ඍජුව බලපෑ බව පෙනේ. පැයට ගිගාවොට් 901 ක ධාරිතාවයකින් යුත් ජලවිදුලිය, පුනර්ජනනීය බලශක්ති හා සුලං බලශක්තිය, පැයට ගිගාවොට් 1,430 ක ධාරිතාවයකින් යුත් ඛණිජ තෙල් බලශක්තිය හා පැයට ගිගාවොට් 1557 ක ධාරිතාවයකින් යුත් ගල් අඟුරු බලශක්තිය යන බලශක්ති සංයුතිය 2017 වර්ෂයේ 15:39:46 ක් වූ අතර 2018 වර්ෂයේ එම සංයුතිය 23:37:40 ලෙස වෙනස් වී ඇත.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් බැංකු වෙත ගෙවීමට ඇති බැදීම් 2018 වසරේ පළමු කාර්තුව තුළ රු.මි 44,340 ක් වූ අතර එය 2017 වසරේ රු.මි 31,744 ක් විය. පිරිවැය පිළිඹිබු මිල ක්‍රමයක් ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයේ ද්‍රවශීල අවශ්‍යතා සපුරාගැනීමට රාජ්‍ය බැංකු මගින් ණය ලබාගැනීම වර්ධනය වී ඇත. එසේම, 2017 වර්ෂයේ පළමු කාර්තුව තුළ ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට හා නිදහස් විදුලි සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ණය රු.මි 53,033 ට සාපේක්ෂව 2018 වසරේ පළමු කාර්තුව තුළ රු.මි 86,995 ක් දක්වා වර්ධනය වී ඇත.

පුනර්ජනනීය බලශක්ති මාධ්‍යයක් වශයෙන් සුළං බලශක්තිය යොදා ගැනීම වැඩිදියුණු කළයුතුය යන සංකල්පය මත අප්‍රේල් මස හම්බන්තොට ජාතික පුනර්ජනනීය බලශක්ති උද්‍යානයේ "සුලං බල මෙහෙයුම" ව්‍යාපෘතිය දියත් කළ අතර මෙගාවොට් 100 ක ධාරිතාවයකින් යුතු සුලංබල ව්‍යාපෘතියක් මන්නාරමේ ක්‍රියාත්මක කිරීමටද මුලපුරා ඇත.

### ලංකා ඛණිජතෙල් නීතිගත සංස්ථාව

ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් 2018 වර්ෂයේ පළමු මාස 04 ක කාලය තුළදී රු. මිලියන 11,143 ක මෙහෙයුම් අලාභයක් වාර්තා කර ඇති අතර 2017 වර්ෂයේ එම කාලපරිච්ඡේදය සලකා බැලීමේදී

රු. මිලියන 3,553 ක මෙහෙයුම් ලාභයක් වාර්තා කර ඇත. 2018 වර්ෂයේ පළමු මාස හතර තුළ බ්‍රෙන්ට් බොරතෙල් බැරලයක සාමාන්‍ය මිල ඇමරිකානු ඩොලර් 66.95 ක් පමණ වූ අතර 2017 වර්ෂයේ මුල් මාස හතර තුළ බැරලයක මිල ඇමෙරිකානු ඩොලර් 53.96 ක් පමණ වී ඇත.

2017 වර්ෂයේ පළමු මාස හතරක කාලය තුළදී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් වාර්තා කරන ලද මුළු විකුණුම් පිරිවැය වූ රු. මිලියන 139,845 ට සාපේක්ෂව, 2018 වර්ෂයේ සමාන කාලපරිච්ඡේදය සඳහා විකුණුම් පිරිවැය රු. මිලියන 164,821 දක්වා සියයට 17 කින් වැඩි වී ඇති බව නිරීක්ෂණය වේ. ඇමරිකානු ඩොලරයට එරෙහිව ශ්‍රී ලංකා රුපියල සීඝ්‍රයෙන් උච්ඡාවචනය වීම ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ කාර්යසාධනය කෙරෙහි අහිතකර ලෙස බලපා ඇත. 2018 වර්ෂයේ පළමු මාස 4 තුලදී විනිමය විචලනය මත ඇති වූ බලපෑම රු. මිලියන 9,146.5 ක් වන අතර 2017 වර්ෂයේ එම කාලපරිච්ඡේදය තුලදී ඇතිවූ විනිමය අලාභය වන රු. මිලියන 5,652 හා සැසඳීමේදී එය සැලකිය යුතු වර්ධනයකි.

රාජ්‍ය බැංකු වන ලංකා බැංකුව සහ මහජන බැංකුව මඟින් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව මුහුණ දෙමින් සිටින මූල්‍ය සහ මෙහෙයුම් කම්පනයන් තාවකාලිකව අවශෝෂණය කර ගනු ලබයි. 2018.04.30 වන දිනට මෙම බැංකු 2 සඳහා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවිය යුතු මුළු මුදල රු. මිලියන 375,496 ක් දක්වා ලගා විය.

ආර්ථිකය කෙරෙහි වන සමස්ථ බලපෑම සැලකිල්ලට ගනිමින්, රජය මඟින් ප්‍රවාහන ක්ෂේත්‍රය ආශ්‍රිත ඛනිජ තෙල් නිෂ්පාදන හා භූමිතෙල් සඳහා 2018 මැයි සිට ක්‍රියාත්මක වන පරිදි මිල සූත්‍රයක් දැනටමත් ස්ථාපිත කර තිබේ. ඒ අනුව රජය විසින් තීරණය කරන ලද මිල යාන්ත්‍රණය මගින් ඇති වන බලපෑම ලිහිල් වනු ඇති අතර ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ඉදිරියේදී මෙමඟින් ලබන මෙහෙයුම් ප්‍රතිඵල සාධනීය වනු ඇතැයි බලාපොරොත්තු වේ. කෙසේ වෙතත්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ 2018.04.30 දින වන විට සමුච්චිත අලාභය හා සෘණ ශුද්ධ වටිනාකම පිළිවෙළින් රු. මිලියන 218,609 ක් සහ රු. මිලියන 174,940 කි.

## ශ්‍රී ලංකා වරාය අධිකාරිය

ශ්‍රී ලංකා වරාය අධිකාරිය 2017 වසර සඳහා මෙතෙක් වාර්තාගත ඉහළම ශුද්ධ ලාභය වන රු. බිලියන 13.3ක් වාර්තා කර ඇත. හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලබාගත් ණයවලට අදාළ විදේශ විනිමය ලාභය මෙම ලාභදායිත්වය කෙරෙහි බලපා ඇත. 2018 පළමු කාර්තුවේදී ඇ.ඩො. 973,658,000 ක් සහ ඇ.ඩො. 146,000,000 ක් වන විකුණුම් පියවීම් ශ්‍රී ලංකා වරාය අධිකාරියට ලැබී ඇත. සහන ගිවිසුමේ අන්තර්ගත කොන්දේසි සපුරාලීමෙන් අනතුරුව 2018 ජූනි මස වන විට තෙවන විකුණුම් පියවීමද ලබාගැනීමට ආයතනයට හැකිවනු ඇත. ශ්‍රී ලංකා නාවික හමුදාව සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර එම ආයතන විසින් බදුගෙන ඇති භූමිය සම්බන්ධ බදු ගිවිසුමේ අන්තර්ගත තෙල් ගබඩා කිරීම සහ තෙල් ටැංකි පැවරීමට අදාළව කර්මාන්තයේ යොදාගන්නා මනා භාවිතයන් මෙම ගිවිසුමේ කොන්දේසි ලෙස අන්තර්ගත වේ. හම්බන්තොට වරාය සංවර්ධන ව්‍යාපෘතිය සඳහා චීන එක්සිම් බැංකුවෙන් සහ ලංකා බැංකුවෙන් ලබාගන්නා ලද ණය රජය විසින් සේවාකරණය කරනු ලබන අතර 2018 මුල් කාර්තුවේදී අදාළ වාරික ගෙවීම ඇරඹීමට නියමිතය.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් වාර්තාකරන ලද ඉහළම ලාභය මුල්කර ගෙන ආයතනයේ වෘත්තීය සමිති ක්‍රියාකාරිත්වය විසින් සිය වැටුප් ඉහළ නංවා ගැනීම සඳහා ඉල්ලුම් කරමින් සිටී. ඒ අනුව 2018-2020 වර්ෂ සඳහා වැටුප් ඉහළ නැංවීම සඳහා රු. බිලියන 2 වැඩිවන වියදමක් අන්තර්ගත කරමින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් සේවකයන් සමඟ සාමූහික ගිවිසුමකට එළඹී ඇත. 2017 වර්ෂයේදී මහා භාණ්ඩාගාරය වරාය සහ නාවික කටයුතු අමාත්‍යාංශය සහ වරාය අධිකාරිය අතර අත්සන් තබනු ලැබූ ත්‍රෛපාර්ශවික සාමූහික අභිලාෂ ගිවිසුමේ ද උපකල්පන ලෙස සියයට 5 කින් වැඩි කරන ලද වැටුප් සංශෝධනයක්ද ඇතුළත් කර තිබිණි. මෙම වැටුප් වැඩිකිරීම මඟින් සාමූහික අභිලාෂ ගිවිසුම ක්‍රියාත්මක වන වසර 3 ක කාලය තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරියේ පහළ ස්ථරික ලාභදායීත්වය කෙරෙහි ඍජු බලපෑම් එල්ල කරනු ඇත. තවද, හම්බන්තොට වරාය විකිණීම ද අනාගතයේදී සාමූහික අභිලාෂ ප්‍රකාශ ඉලක්ක මත බලපෑම් ඇති කරනු ඇත.

2018 වසරේ පළමු මාස හතර තුළ ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රු. මිලියන 14,381 ක ආදායමක් වාර්තා කර ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරියේ මුළු ආදායමෙන් සියයට 62 ක් වන නාවික මෙහෙයුම් කටයුතු හා නැව් බඩු පැටවීමේ හා බෑමේ කටයුතුවලට අදාළ ආදායම මේ සඳහා මූලිකවම බලපා ඇත. ශ්‍රී ලංකා වරාය අධිකාරිය වෙත පැමිණීම වාර්තා කර ඇති නැව් 1,696 අතරින් නෞකා 1,474 ක්ම කොළඹ වරාය වෙත පැමිණීම වාර්තා කර ඇත. 2018 මුල් මාස හතර තුළ අවම නෞකා පැමිණීම් සංඛ්‍යාව වන නැව් පැමිණීම් 29 ක් වාර්තා කර ඇත්තේ කන්කසන්තුරේ

වරාය වන අතර එම වරාය අවම පහසුකම් සහිත වීම මෙයට බලපා ඇත. රජයේ සංවර්ධන ප්‍රතිපත්ති රාමුවට සමගාමීව උතුරු නැගෙනහිර ආර්ථික මග සංකල්පයට අදාළ ප්‍රතිපත්ති අරමුණු මුදුන් පමුණුවා ගැනීමේදී කන්කසන්තුරේ වරාය වාණිජමය ශක්‍යතාවයෙන් යුත් තිරසාර වාණිජ වරායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල විසින් ඉන්දියානු ණය යෝජනා ක්‍රමයේද සහාය ඇතුව වරාය සංවර්ධන සඳහා අනුමැතිය ලබා දී ඇත. 2018 වසරේ පලමු මාස 04 තුළ අධිකාරිය විසින් නැව් බහාලුම් මිලියන 2.25 ක් මෙහෙයුම් කටයුතු සිදුකර ඇත.

ශ්‍රී ලංකා වරාය අධිකාරිය සමග ගෘහස්ථ වශයෙන් තරගකාරී ලෙස වරාය මෙහෙයුම් කටයුතුවල යෙදෙන පෞද්ගලික අංශයේ ආයතන සමග යෝග්‍ය පරිදි වෙළෙඳ තරගකාරීත්වයට එළඹීමට හැකිවන අයුරින් 1998 වසරෙන් පසු සිය මිල ව්‍යුහයේ සංශෝධන කිරීම සඳහා වරාය අධිකාරිය කටයුතු කරමින් සිටී. මෙම මිල ව්‍යුහයේ සංශෝධන කිරීමේදී මෙහෙයුම්වල ප්‍රමාද දෝෂ සහ අවභාවිතයන් සඳහා හේතුවී ඇති නිර්වචන ඉවත්කිරීමේ මෙහෙයුම් කටයුතුවලට අදාළ ලේඛන වල අන්තර්ගතයන්හි සංකීර්ණභාවය හැකිතාක් අවම කර එය සරල ක්‍රියාවලියක් බවට පත්කිරීම මගින් ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් රු. මි 500 කට වඩා ආදායමක් උපයා ගැනීමට අපේක්කෂා කරයි

## ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය

මහජනතාවගේ ජීවන තත්වය නගා සිටුවීම සඳහා අවශ්‍ය සුරක්ෂිත පානීය ජලය සැපයීම හා සනීපාරක්ෂක පහසුකම් සලසන රජය සතු ව්‍යාපාරයක් වන ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය 2018 වර්ෂයේ පළමු මාස 4 හි සියයට 44.2 ක් වන නලජල ආවරණය, සියයට 89.3 ක් වන සුරක්ෂිත ජල සැපයීමේ ආවරණය හා සියයට 2 ක් වන අපජල නල ආවරණය 2020 වන විට පිළිවෙලින් සියයට 60, සියයට 91.7 හා සියයට 3.3 දක්වා වර්ධනය කිරීමට අපේක්ෂිතය.

මේ වන විට ජල සම්පාදන ව්‍යාපෘති 337 ක් දියත් කර ඇති අතර ඉන් ව්‍යාපෘති 62 ක් නල ජල ව්‍යාපෘති වේ. නාගරික ව්‍යාපෘතීන්, දුෂ්කර පළාත් ව්‍යාපෘතීන්, වකුගඩු ආශ්‍රිත රෝග පවතින ප්‍රදේශයන්හි ව්‍යාපෘතීන් සඳහා ලබාගන්නා ණය පිළිවෙලින් සියයට 50 ක්, සියයට 75 ක් හා සියයට 100 ක් මහා භාණ්ඩාගාරය විසින් සේවාකරණය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලය විසින් ලබා දුන් අනුමැතිය අනුව 2018 වර්ෂයේ ප්‍රථම මාස 4 තුළ රු.මිලියන 174 ක් ජාතික ජලසම්පාදන ජලාපවහන මණ්ඩලය වෙත මහා භාණ්ඩාගාරය විසින් ලබා දී ඇත. ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අපේක්ෂිත අරමුණු කරා ළඟා වීමට හා වගකීම් පියවීමට අවශ්‍ය දේශීය මූල්‍යයන ව්‍යාපෘති සඳහා රු.මිලියන 75,630 ක් ද, විදේශීය මූල්‍යයන ව්‍යාපෘති සඳහා ඇ.ඩො. මිලියන 1,155.38 ක් හා යුරෝ මිලියන 170.03 ක් ණයට ගැනීමේ සීමාව මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් අනුමත කර ඇත.

ජාතික ජලසම්පාදන ජලාපවහන මණ්ඩලයේ 2017 වර්ෂයේ ප්‍රථම මාස 4 සඳහා රු.මිලියන 7,600 ක් වූ ආදායම 2018 වර්ෂයේ එම කාලසීමාව සඳහා රු. මිලියන 7,892 ක් ලෙස සියයට 4 කින් වර්ධනය වී ඇති අතර එය ත්‍රෛපාර්ශවීය සාමූහික අවබෝධතා ගිවිසුමෙහි 2018 වර්ෂය සඳහා අපේක්ෂිත ආදායමින් සියයට 24 ක් වේ. ආයතනයේ ලාභය පෙර වර්ෂයේ මුල් මාස හතරට සාපේක්ෂව සියයට 158 කින් රු. මිලියන 362 දක්වා වැඩි වී ඇති අතර එය අපේක්ෂිත ලාභයෙන් සියයට 6 කි.

ආයතනයේ ජලය කාන්දුවීම්, මීටර් සම්බන්ධ ගැටළු හා බලය නොලත් පාරිභෝජනය හේතුකොට ගෙන ඇති වන, ආදායම් ජනනය නොකරන ජලය (non-revenue water) පිළිගත නොහැකි තත්වයක පවතී. 2017 අප්‍රේල් අග වන විට සියයට 27.8 ක් වූ ආදායම් ජනනය නොකරන ජලය ප්‍රමාණය 2018 පළමු මාස 4 අවසාන වන විට සියයට 25.9 ක් දක්වා අඩු වුවද එය තව දුරටත් ආයතනයේ කාර්යක්ෂමතාවයට හා මූල්‍ය තත්වයට ප්‍රමාණාත්මක ගැටළුවක් වී ඇත.

## ගුවන් තොටුපල හා ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම

ගුවන් තොටුපොළ සහ ගුවන්යානා (ශ්‍රී ලංකා) සමාගම සඳහා 2018 වසරේ පළමු කාර්තුව තුළ මෙහෙයුම් ලාභය මිලියන 3,410 ක් වූ අතර 2017 වසරේ සමාන කාල පරිච්ඡේදය තුළ වාර්තා කළ රුපියල් මිලියන 2,230 ක ලාභය හා සලකා බැලීමේ දී එය සියයට 53 ක වර්ධනයකි. 2017 වර්ෂයේදී රජය විසින් ඉදිරි වසර 3ක් සඳහා ගුවන් තොටුපොළ සහ ගුවන්යානා (ශ්‍රී ලංකා) සමාගම සමඟ සාමූහික අභිලාෂ ප්‍රකාශ සඳහා ත්‍රෛපාර්ශවික ගිවිසුමක් අත්සන් කර ඇත.

රජය විසින් තායිලන්ත රජය සහ ශ්‍රී ලංකා රජය අතර ද්විපාර්ශවීය ගුවන් සේවා ගිවිසුමක් අත්සන් කර ඇති අතර, එය ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ ආදායම කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය. සංචාරක ප්‍රවර්ධනය සඳහා අභ්‍යන්තර ගුවන් මෙහෙයුම් පිළිබඳ ප්‍රඥප්තිය ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රධානතම අරමුණක් වන අතර එය ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගමේ

ක්‍රියාකාරිත්වය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කළ හැකිය.

## ශ්‍රී ලංකන් ගුවන් සමාගම

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ කෙටුම්පත් මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම සමාගම විසින් 2017/18 මූල්‍ය වර්ෂ තුළදී රු. මිලියන 160,850 ක ආදායමක් උපයාගෙන ඇත. එය 2016/17 මූල්‍ය වර්ෂයට සාපේක්ෂව සියයට 16 ක වර්ධනයකි. මගී සේවා ආදායම සියයට 25 කින් වැඩිවීම හා භාණ්ඩ හා සේවා ආදායම සියයට 23 කින් වැඩිවීම මෙයට ප්‍රධාන හේතු වී ඇත. 2016/17 මූල්‍ය වර්ෂයේදී රු. මි. 7,489.ක් වූ මෙහෙයුම් ලාභය 2017/18 මූල්‍ය වර්ෂය තුළදී රු.මි. 3,721 ක් දක්වා අඩු වී ඇත.

2018.02.02 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් අතිගරු ජනාධිපතිතුමා විසින් ශ්‍රී ලංකන් ගුවන් සමාගම, මිහින් ලංකා සමාගම සහ ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ පරිපාලිත සමාගමක් වන සීමාසහිත ශ්‍රී ලංකා කේටරින් සමාගම යන ආයතනවල සිදුව ඇතැයි පැවසෙන අක්‍රමිකතා විමර්ශනය කිරීම සඳහා සාමාජිකයන් පස්දෙනෙකුගෙන් යුත් ජනාධිපති කොමිසමක් පත්කර ඇත. ශ්‍රේෂ්ඨාධිකරණ, අභියාචනාධිකරණ හා මහාධිකරණ විනිසුරුවන්ගෙන් සහ ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති සමීක්ෂණ මණ්ඩලය සහ විගණකාධිපතිවරයා යන සාමාජිකයන්ගෙන් එම කොමිසම සමන්විත වෙයි. නීතිපති දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව අදාළ පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතී.

2017 වසරේදී බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපළ වසා දැමීම හේතුවෙන් ඇති වූ අලාභය පියවීම සඳහා ලබාගත් ණය වෙනුවෙන් ලංකා බැංකුව සහ මහජන බැංකුව වෙත නිකුත් කළ ණයවර ලිපි නැවත නිකුත් කිරීම සඳහා ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත.

**වගුව 4.3 : ප්‍රධාන රජය සතු වාණිජ ව්‍යවසායයන් සඳහා ආරම්භ කරන ලද ප්‍රතිසංස්කරණ**

| ආයතනය | ආරම්භ කරන ලද ප්‍රතිසංස්කරණ |
|---|---|
| රාජ්‍ය බැංකු (ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව ) | ▪ පාරිභෝගිකයන් අතර ඩිජිටල් බැංකු කටයුතු ප්‍රවර්ධනය කිරීම<br>▪ ලංකා බැංකුවේ, මහජන බැංකුවේ. සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ණය ශ්‍රේණීන් රජයේ ව්‍යවසායයන් ඇතුළුව රජයේ නිරාවරණය මත විශාල වශයෙන් රඳා පවතින අතර, එය ආර්ථිකයේ නව සංවර්ධනය වන අංශවලට ණය පහසුකම් සැපයීම හා නිෂ්පාදන කළඹ විවිධාංගීකරණය කිරීම සඳහා ණය පහසුකම් සැපයීමට බාධා කරනු ලැබේ.<br>▪ ණය ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සහ නැවත යථා තත්ත්වයට පත්කිරීමේ යාන්ත්‍රණය වැඩි දියුණු කිරීම.<br>▪ මධ්‍යකාලීන කාර්යසාධනය වැඩිදියුණු කිරීම සඳහා නිවාස සංවර්ධන හා මූල්‍ය බැංකුව තුළ ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කිරීම. |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | ▪ ජීවිත හා සාමාන්‍ය හර පද්ධතිය ක්‍රියාත්මක කිරීම සඳහා මූලික පියවර ගෙන තිබේ. |
| ලංකා විදුලිබල මණ්ඩලය | ▪ පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයක් ලෙස සුළං බලශක්තිය සංවර්ධනය කිරීමේ සන්දර්භය තුළ අප්‍රේල් මාසයේදී "සුළඟ බල මෙහෙයුම" ව්‍යාපෘතිය හම්බන්තොට ජාතික පුනර්ජනනීය බලශක්ති උද්‍යානයේදී ආරම්භ කරන ලදී.<br>▪ මෙගා වොට් 100ක සුළං විදුලි බලාගාරයක් මන්නාරම් ප්‍රදේශයේ ඉදිකිරීමට පියවර ගෙන ඇත.<br>▪ සම්ප්‍රේෂණ සහ බෙදා හැරීම සඳහා ප්‍රමාණවත් ආයෝජන ලබා දෙන බවට සහතික කරන ප්‍රතිසංස්කරණ සහ එක් එක් පළාත තුළ සම්ප්‍රේෂණ පහසුකම් සැපයීම සඳහා පුද්ගලික අංශය දිරිමත් කිරීම.<br>▪ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් නියම කරන ලද අවශ්‍යතාව අනුව තොග සැපයුම් ගනුදෙනු ගිණුම ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලි බල මණ්ඩලය විසින් ක්‍රියාමාර්ග ගනු ලැබේ.<br>▪ පවත්නා "තීරු බදු ක්‍රමවේදය" සංවර්ධනය කිරීම සමග විදුලිය සඳහා ස්වයංක්‍රීය මිල සූත්‍රයක් ක්‍රියාත්මක කිරීමට හැකි වනු ඇත. |

වගුව 4.3 - තව දුරටත් . . .

| | |
|---|---|
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව | ▪ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සභාපති, රේඛීය අමාත්‍යාංශයේ ලේකම් සහ භාණ්ඩාගාර ලේකම් යන ත්‍රෛපාර්ශ්වය අතර සාමූහික අභිලාෂ ප්‍රකාශ සඳහා අත්සන් තබන ලදී<br>▪ තෙල් ගබඩා කිරීම සඳහා ත්‍රිකුණාමල ඉහළ ටැංකි ගොවිපළ භාවිතා කිරීමේ හැකියාව පිළිබඳව විමර්ශනය කිරීමට රජය පියවර ගෙන තිබේ.<br>▪ දැනට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ගෙවනු ලබන විශාල ප්‍රමාද ගාස්තු අඩු කිරීම සඳහා උපකාරී වන ආකාරයට භාණ්ඩ ප්‍රවාහනය කිරීම සඳහා ගත වන සාමාන්‍ය කාලය සම්මිත මට්ටම දක්වා අඩු කිරීමට අවශ්‍ය නව තාක්ෂණයෙන් යුත් රට හරහා යන නව නළ පද්ධතියක් ඇති කිරීමට රජය විසින් ක්‍රියාමාර්ග ගෙන ඇත.<br>▪ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සඳහා ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරන ලද මිල සූත්‍රය ක්‍රියාවට නැංවෙනු ඇත. යෝජිත මිල සූත්‍රය මඟින් ලාභදායී වීම සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත පහසුකම් සපයනු ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සිය අරමුදල් අවශ්‍යතාවය සඳහා දේශීය මූල්‍ය වෙළඳපොළ මත රඳා පැවතීම අඩු කරනු ඇති අතර එමගින් දේශීය මූල්‍ය ක්ෂේත්‍රය වෙත ධනාත්මක බලපෑමක් ඇති කරනු ඇත. |
| ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ▪ සම්පූර්ණ ජනගහනය සඳහා සුරක්ෂිත පානීය ජලය සැපයීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා, අඛණ්ඩ ජල සැපයුම සහතික කිරීම කෙරෙහි ඇති කාලගුණ රටාවන් වල අවදානම අවම කිරීම සඳහා විවිධ ප්‍රවේශයන් සොයා ගැනීම වැදගත්ය.<br>▪ ගිවිසගත් කාල පරිච්ඡේදයන් තුළ මෙම ඉලක්ක කරා ළඟාවීම සඳහා නව්‍ය මූල්‍ය යාන්ත්‍රණ භාවිතා කිරීම ඉතා වැදගත් වේ. |
| ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | ▪ ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම මධ්‍යකාලීන මූලික කාර්යසාධන දර්ශක ළඟා කර ගැනීම සඳහා සාමූහික අභිලාෂ ප්‍රකාශ සඳහා එළඹි රාජ්‍ය වාණිජ ව්‍යවසායයන් පහ අතරින් එකකි. 2017 වර්ෂය තුළදී ධාවන පථ ද ඇතුළුව ගුවන් යානා පද්ධති වැඩි දියුණු කිරීමට ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගමට හැකි වී තිබෙන අතර A 380 තරම් විශාල ගුවන් යානා පහසුකම් සැපයීමට බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළට හැකියාව ලැබී ඇත. කෙසේ වෙතත්, බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළේ ධාරිතාව නියම ප්‍රමාණයට වඩා සංතෘප්ත කිරීම නිසා එම ආයතනය මින් සපයනු ලබන සේවයේ කාර්යක්ෂමතාවය බිඳ වැටී ඇත.<br>▪ 2025 දී තක්සේරු කරන ලද ඉල්ලුම සපුරාලීම සඳහා ගුවන් තොටුපොළ සහ ගුවන් සේවා ශ්‍රී ලංකා සමාගම විසින් අදාළ යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සිදු කිරීමට ආයෝජන සඳහා ඉල්ලීම් කිරීමට අවශ්‍ය වේ.<br>▪ බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපොළහි ධාවන පථය සම්මත කාල පරිච්ඡේදය තුළ ප්‍රතිසංස්කරණය කර නොතිබූ නිසා, 2017 ආරම්භයේ දී ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීම සඳහා අවශ්‍ය ආයෝජනයක් සිදු කරන ලදී. |

*මූලාශ්‍ර: රජය සතු ව්‍යාපාර හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

වගුව 4.1 : මූල්‍ය නොවන රජය සතු ව්‍යාපාරවලින් බැංකු වලට අයවිය යුතු ණය

රු.මිලියන

| | රාජ්‍ය ව්‍යාපාරය | බැංකු වෙත ඇති ණය | | 30.04.2018 වන විට (තාවකාලික) |
|---|---|---|---|---|
| | | 2016 | 2017 (තාවකාලික) | |
| 1 | ලංකා විදුලි බල මණ්ඩලය | 38,968 | 27,995 | 44,340 |
| 2 | ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 333,793 | 339,481 | 359,036 |
| 3 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය (අ) | 10,593 | 7,409 | - |
| 4 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 35,102 | 67,162 | 73,583 |
| 5 | ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 37,679 | 42,780 | 0 |
| 6 | ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම (අ) | 67,598 | 90,337 | - |
| 7 | මිහින් ලංකා සමාගම (ආ) | 3,372 | - | - |
| 8 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය (ආ) | - | - | - |
| 9 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (අ) | 1,261 | 2,050 | 900 |
| 10 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | 0 | 0 | 0 |
| 11 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (අ) | 752 | 907 | 1,450 |
| 12 | මිල්කෝ (පුද්) සමාගම (අ) | 13,677 | 15,017 | - |
| 13 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (අ) | 209 | 249 | - |
| 14 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | 12 | 2 | 13.4 |
| 15 | තුරුණෑගල වැවිලි සමාගම | 101 | 56 | 68.12 |
| 16 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | 77 | 0 | 0 |
| 17 | හලාවත වැවිලි සමාගම | 0 | 0 | 0 |
| 18 | කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව (අ) | 35 | 124 | - |
| 19 | ශ්‍රී ලංකා කජු සංස්ථාව (අ) | 0 | 8 | - |
| 20 | ලංකා ඛණිජ වැලි සමාගම | 100 | 536 | 0 |
| 21 | ලංකා පොස්පේට් සමාගම | 15 | 4 | 15 |
| 22 | සීමාසහිත කහටගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | 0 | 0 | 0 |
| 23 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය | 0 | 0 | 0 |
| 24 | ජාතික ලොතරැයි මණ්ඩලය | 0 | 0 | 0 |
| 25 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | 0 | 0 | 0 |
| 26 | ශ්‍රී ලංකා ආයුර්වේද නිෂ්පාදන සංස්ථාව | 53 | 46 | 44 |
| 27 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (අ) | 39 | 1.361 | - |
| 28 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | 0 | 0 | 0 |
| 29 | ස්වාධීන රූපවාහිනී සේවය | 0 | 0 | 0 |
| 30 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (අ) | 311 | 341 | - |
| 31 | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව | 0 | 0 | 0 |
| 32 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 554 | 520 | 453 |
| 33 | රාජ්‍ය දැව සංස්ථාව | 0 | 0 | 0 |
| 34 | සීමා සහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | 1,180 | 1,338 | 1,128 |
| 35 | සීමා සහිත ලංකා සතොස (ආ) | - | - | - |
| 36 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව (අ) | 0 | 733 | - |
| 37 | ලංකා ධීවර සංස්ථාව (අ) | 38 | 87 | - |
| 38 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව | 0 | 0 | 0 |
| 39 | සීමාසහිත ලංකා පොහොර සමාගම (අ) | 27,482 | 28,296 | - |
| 40 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 12,675 | 13,897 | 9,969 |
| 41 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | 340 | 272 | 69 |
| 42 | සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගම | 0 | 0 | 0 |
| | **එකතුව** | **431,462** | **440,844** | **491,069** |

*මූලාශ්‍ර: රජය සතු ව්‍යාපාර හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

*(අ ) 2018.04.30 දිනට දත්ත ලැබී නොමැත*

*(ආ)මූල්‍ය වාර්තා පිළියෙළ කොට නැත*

## වගුව 4.2 : රජය සතු වාණිජ ව්‍යවසායයන්හි ලාභදායිත්වය

රු. මිලියන

| | රාජ්‍ය ව්‍යාපාර | ලාභය/(අලාභය) | | 30.04.2018 වන විට (තාවකාලික) |
|---|---|---|---|---|
| | | 2016 | 2017 (කෙටුම්පත්) | |
| 1 | ලංකා බැංකුව | 31,189 | 30,363 | 8,659 |
| 2 | මහජන බැංකුව | 20,814 | 23,564 | 7,777 |
| 3 | ජාතික ඉතිරි කිරීමේ බැංකුව | 13,303 | 14,029 | 3,895 |
| 4 | රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 706 | 446 | 343.9 |
| 5 | නිවාස සංවර්ධනහා මූ.ව බැංකුව | 848 | 502 | 161 |
| 6 | ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 259 | 285 | 26.5 |
| 7 | ප්‍රාදේශිය සංවර්ධන බැංකුව | 2,131 | 3,289 | 617.6 |
| 8 | ශ්‍රී ලංකා ඉතිරි කිරීමේ බැංකුව | 600 | 605 | 189.4 |
| 9 | සේවක භාරකාර අරමුදල් මණ්ඩලය | 16,043 | 19,534 | - |
| 10 | ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 12,741 | 4,569 | 2,258 |
| 11 | ජාතික රක්ෂණ භාර අරමුදල | 2,840 | 758 | - |
| 12 | ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | 156 | (200) | 89 |
| 13 | කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | (3,261) | (3,895) | (1,590) |
| 14 | ලංකා විදුලි බල මණ්ඩලය | (14,499) | (49,231) | (14,702) |
| 15 | ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව | 69,620 | 3,504 | (21,178) |
| 16 | ශ්‍රී ලංකා වරාය අධිකාරිය (අ) | 1,036 | 13,222 | - |
| 17 | ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | 2,385 | 1,737 | 362 |
| 18 | ගුවන් තොටුපොළ හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම | 6,909 | 10,762 | 3,410 |
| 19 | ශ්‍රී ලංකන් එයාර්ලයින් සමාගම (අ) | (12,622) | (28,930) | - |
| 20 | මිහින් ලංකා සමාගම | (1,579) | - | - |
| 21 | ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය | (3,617) | 2,598 | 589 |
| 22 | රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (අ) | (958) | (940) | 305 |
| 23 | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | 816 | 633 | 143 |
| 24 | රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (අ) | 23 | (491) | 15 |
| 25 | මිල්කෝ (පුද්) සමාගම | 340 | 114 | - |
| 26 | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (අ) | 9.49 | (840) | - |
| 27 | ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව | (134) | (79) | 8.09 |
| 28 | ජනතා වතු සංවර්ධන මණ්ඩලය | (443) | (295) | (88.44) |
| 29 | කුරුණෑගල වැවිලි සමාගම (අ) | 156 | 240 | - |
| 30 | හලාවත වැවිලි සමාගම (අ) | 78 | 126 | - |
| 31 | කළුබෝවිටියන තේ කර්මාන්ත ශාලාව (අ) | 43 | 31 | - |
| 32 | ශ්‍රී ලංකා කජු සංස්ථාව (අ) | 32 | 16 | - |
| 33 | ලංකා ඛණිජ වැලි සමාගම (අ) | 170 | 100 | - |
| 34 | ලංකා පොස්පේට් සමාගම (අ) | (32) | 15 | - |
| 35 | සීමාසහිත කහට ගහ ග්‍රැෆයිට් ලංකා සමාගම | (2.52) | 17.8 | 4.9 |
| 36 | සංවර්ධන ලොතරැයි මණ්ඩලය (අ) | 2,700 | 2,320 | - |
| 37 | ජාතික ලොතරැයි මණ්ඩලය (අ ) | 897 | 602 | - |
| 38 | රාජ්‍ය ඖෂධ නිෂ්පාදන නීතිගත සංස්ථාව | 441 | 322 | 54 |
| 39 | ශ්‍රී ලංකා ආයුර්වේද නිෂ්පාදන සංස්ථාව | 48 | 56 | 12.5 |
| 40 | රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව (අ) | 1,868 | 1,560 | - |
| 41 | ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල | (171) | (143) | :435) |
| 42 | ස්වාධීන රූපවාහිනී සේවය (අ) | (70) | (287) | - |
| 43 | ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව (අ) | (231) | (196) | - |
| 44 | ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාව (අ) | 49 | 75 | - |
| 45 | ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය (ලක්සල) | 7 | 33 | 2.5 |
| 46 | රාජ්‍ය දැව සංස්ථාව | 86 | 565 | 53.1 |
| 47 | සීමා සහිත රාජ්‍ය වාණිජ නීතිගත සංස්ථාව | 61 | 71 | 2 |
| 48 | සීමා සහිත ලංකා සතොස (අ) | (4,474) | (1,980) | - |
| 49 | රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව (අ) | (75) | (229) | - |
| 50 | ලංකා ධීවර සංස්ථාව (අ) | (161) | 37 | - |
| 51 | ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව (අ) | (31) | (64) | - |
| 52 | සීමාසහිත ලංකා පොහොර සමාගම (අ) | 937 | 128 | - |
| 53 | සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 253 | 70 | 16.5 |
| 54 | සීමාසහිත හොටෙල් ඩිවලොපර්ස් ලංකා සමාගම | 172 | 219 | 243 |
| 55 | සීමාසහිත ලංකා සීනි (පුද්) සමාගම (අ) | 1,006 | 677 | - |
| | එකතුව | **76,952** | **48,204** | **(9,366)** |

*මූලාශ්‍ර: රජය සතු ව්‍යාපාර හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*
*(අ) මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කොට නැත*

වගුව **4.3 :** රාජ්‍ය වාණිජ ව්‍යසායයන්ගෙන් ලද අයබදු /ලාභාංශ

රු. මිලියන

| වර්ෂය | 2012 | 2013 | 2014 | 2015 | 2016 | 2017 | 30.04.2018 වන විට |
|---|---|---|---|---|---|---|---|
| **අයබදු** | **31,514** | **30,400** | **42,137** | **26,118** | **92,338** | **50,489** | **2,361** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 8,200 | 5,000 | 4,000 | 2,800 | 12,026 | 3,865 | - |
| ලංකා බැංකුව | 5,000 | 5,000 | 6,500 | 5,000 | 18,000 | 12,000 | - |
| මහජන බැංකුව | 4,500 | 4,500 | 6,000 | 3,000 | 8,000 | 5,000 | 200 |
| විදුලි සංදේශ හා නියාමන කොමිසම | 7,200 | 10,100 | 10,000 | 10,000 | 28,000 | 22,800 | 2,000 |
| ශ්‍රී ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව | | | 10,000 | | 10,000 | - | - |
| රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව | 25 | 40 | 10 | 10 | 10 | - | - |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව | 500 | 500 | - | 87 | 88 | - | - |
| රාජ්‍ය දැව සංස්ථාව | 50 | 50 | 25 | 50 | 175 | 100 | - |
| රාජ්‍ය ඖෂධ නිෂ්පාදන සංස්ථාව | 20 | 20 | 25 | 30 | 65 | 222 | - |
| ජාතික රක්ෂණ භාර අරමුදල | 4,200 | 3,200 | 4,000 | 3,000 | 2,500 | 2,100 | 121 |
| භූ විද්‍යා හා පතල් කාර්යාංශය | 750 | 700 | 650 | 850 | 900 | 1,500 | - |
| ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය | - | 100 | - | 75 | 175 | 100 | - |
| ශ්‍රී ලංකා සම්මුති කාර්යාංශය | 12 | - | - | - | - | - | - |
| ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව | 5 | - | 2 | - | - | - | - |
| ලංකා විදුලිබල මණ්ඩලය | - | - | - | - | 8,000 | - | - |
| ආයෝජන මණ්ඩලය | 200 | - | 100 | 141 | 115 | 220 | - |
| ජාතික ලොතරැයි මණ්ඩලය | 502 | 500 | - | 50 | 550 | - | - |
| සුරැකුම්පත් හා විනිමය කොමිසම | - | 94 | - | - | - | - | - |
| ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලය | - | 300 | - | - | - | - | - |
| ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය | - | 20 | - | - | - | - | - |
| ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව | - | 25 | - | - | 25 | - | - |
| ජාතික පශු සම්පත් සහ සංවර්ධන මණ්ඩලය | - | 1 | - | - | - | | - |
| ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශන කාර්යාංශය | - | - | - | 25 | 25 | 25 | - |
| ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය | - | - | 500 | 500 | 1,500 | 1,000 | - |
| සිවිල් ගුවන් සේවා අධිකාරිය | 350 | 200 | 250 | 400 | 768 | 800 | - |
| රාජ්‍ය ඖෂධ සංස්ථාව | - | 50 | 75 | 100 | 216 | 222 | - |
| ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය | - | - | - | - | 200 | 160 | 40 |
| විදේශ සේවා හා නියුක්ති කාර්යාංශය | - | - | - | - | 1,000 | 75 | - |
| ජාතික ගමනාගමන කොමිසම | | | | | | 300 | - |
| **ලාභාංශ** | **4,548** | **-** | **4,664** | **3,678** | **15,821** | **3,550** | **453** |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | 60 | - | 60 | 60 | 60 | 60 | 30 |
| ලංකා බැංකුව | 346 | - | 346 | 346 | 346 | 346 | 173 |
| මහජන බැංකුව | 158 | - | 316 | 316 | 316 | 316 | 158 |
| ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව | 18 | - | 36 | 36 | 36 | 41 | - |
| ජාතික සංවර්ධන බැංකුව | 4 | - | 6 | 5 | 2 | 2 | 1 |
| ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව | 1,001 | - | 2,001 | 1,003 | 11,857 | 503 | 3.6 |
| ගුවන්තොටුපල සහ ගුවන් සේවා සමාගම | - | - | 500 | 497 | 1,500 | 850 | - |
| ලංකා ඛණිජ වැලි සමාගම | 1,700 | - | 43 | 14 | - | - | - |
| ලංකා පොස්පේට් සමාගම | 40 | - | 35 | 30 | - | 8 | - |
| ස්වාධීන රූපවාහිනී ජාලය | 88 | - | 125 | 84 | - | 10 | - |
| ලංකා ලේලන්ඩ් සමාගම | 5 | - | 11 | 54 | 34 | 35 | - |
| රක්නා ආරක්ෂක ලංකා සමාගම | 10 | - | 68 | 93 | - | - | - |
| මාන්තායි සෝල්ට් ලිමිටඩ් | - | - | 1 | - | - | - | - |
| ලංකා පොහොර සමාගම | 4 | - | 38 | 54 | 116 | 90 | 21 |
| කොළඹ කොමර්ෂල් පොහොර සමාගම | 8 | - | 12 | 10 | 25 | 12 | - |
| පරන්තන් කෙමිකල්ස් සමාගම | 3 | - | 10 | 5 | - | 8 | - |
| කහටගහ ග්‍රැපයිට් ලංකා ලිමිටඩ් | - | - | 1 | - | - | - | - |
| එස්ටීසී ජනරල් ට්‍රේඩින්ග් සමාගම | - | - | - | - | 5 | - | - |
| ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම | 759 | - | 759 | 795 | 795 | 795 | - |
| ඩී ලා රූ ලංකා පුද්ගලික සමාගම | 42 | - | 49 | 61 | 62 | 79 | - |
| ලංකා විදුලිබල සමාගම | 75 | - | 25 | 87 | 152 | 218 | - |
| ලංකා කාර්මික වතු සමාගම | 47 | - | 55 | 55 | 47 | 55 | - |
| නිපුණතා සංවර්ධන අරමුදල | - | - | - | 2 | - | - | - |
| ලංකා කෘෂි කර්මාන්ත සමාගම | - | - | 7 | 6 | 12 | 12 | - |
| ලංකා සීනි සමාගම | - | - | 80 | - | - | - | - |
| ජීසියන් රී - ඉන්ෂුවරන්ස් කෝපරේෂන් | - | - | - | - | - | - | |
| ලංකා ලොජිස්ටික්ස් ඇන්ඩ් ටෙක්නොලොජීස් සමාගම | - | - | 2 | 2 | 5 | - | 1 |
| ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම | - | - | - | - | 438 | - | - |
| වැවිලි සමාගම්* | 179 | - | 80 | 62 | 10 | 103 | 64.98 |
| වෙනත්** | 1 | - | - | 1 | 3 | 7 | - |
| එකතුව | 36,062 | 30,400 | 46,801 | 29,796 | 108,159 | 54,039 | 2,814 |

*මූලාශ්‍ර: භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව*

***කුරුණෑගල, කළුබෝවිටියන, හලාවත, පුස්සැල්ලාව, කොටගල, නමුණුකුල,ඇල්පිටිය වැවිලි සමාගම් ඇතුළුව කාසන්ස් සමාගම, ලංකා කැනරීස්, යුනයිටඩ් මෝටර්ස් ලංකා සමාගම, බෙරගල ග්‍රැෆයිට් සමාගම, ඔටෝ ග්‍රිල් සංකා සමාගම, හුන්නස් ෆෝල්ස් සමාගම, ලංකා හයිඩ්‍රොලික් සර්විස් පුද්ගලික සමාගම ඇතුළුව*

# 5 වන පරිච්ඡේදය

## විදේශ මූල්‍යයනය

### 5.1 විදේශ මූල්‍යයන එකඟතා

රාජ්‍ය ආයෝජන වැඩසටහන සඳහා අවශ්‍ය විදේශ මූල්‍යයනයන් සම්පාදනය කිරීම වෙනුවෙන් රජය විවිධ විදේශ සංවර්ධන පාර්ශ්වකරුවන් හා ණය දෙන ආයතන සමග 2018 වර්ෂයේ ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා විදේශ මූල්‍යයන එකඟතා ගිවිසුම් දහයක් (10) මගින් ඇ.ඩො. මිලියන 266.2 ක එකඟතා (නිල සංවර්ධන සහයෝගීතා) ඇතිකර ගෙන ඇත. මෙයින් ඇ.ඩො. මිලියන 219.2 ක් ණය ගිවිසුම් අනුව මූල්‍යයනය වන අතර, ඉතිරි ඇ.ඩො. මිලියන 46.9 ක ප්‍රමාණය ප්‍රදාන එකඟතා අනුව මූල්‍යයනය වේ. ඊට අමතරව, මෙම කාලපරිච්ඡේදයේ දී ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුත් කිරීම් මගින් ඇ.ඩො. මිලියන 2,500 ක් ලබාගෙන ඇත.

මෙම කාලච්ඡේදය තුළ ඇති කරගත් එකඟතා වලින් ඉහළම ප්‍රමාණය වන ඇ.ඩො. මිලියන 79.8ක් චීනය විසින් ලබාදී ඇති අතර, අනතුරුව පිළිවෙළින් ආසියානු සංවර්ධන බැංකුව (ඇ.ඩො.මිලියන 75.0), ඉන්දියාව (ඇ.ඩො. මිලියන 45.3), ඔස්ට්‍රේලියාව (ඇ.ඩො. මිලියන 25.0), ඇමරිකා එක්සත් ජනපදය (ඇ.ඩො. මිලියන 17.9),ඔස්ට්‍රියාව (ඇ.ඩො. මිලියන 13.0), කෘෂිකර්මික සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල (ඇ.ඩො. මිලියන 6.2), එක්සත් ජාතීන්ගේ, ජනගහන අරමුදල (ඇ.ඩො. මිලියන 4.0), සහ එක්සත් ජාතීන්ගේ, සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් (ඇ.ඩො. මිලියන 0.01) යන සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් ලබා දී ඇත. මෙම කාලපරිච්ඡේදයේ දී නිකුත් කරන ලද ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අතරින් ඇ.ඩො. මිලියන 1,250.0 ක් වාර්ෂික පොලී අනුපාතිකය සියයට 5.75 ක් යටතේ වර්ෂ 5 කින් පරිණත වන ලෙසද, ඉතිරි ඇ.ඩො. මිලියන 1,250.0 ක ප්‍රමාණය වර්ෂ 10 ක දී පරිණත වන පරිදි සියයට 6.75 ක වාර්ෂික පොලී අනුපාතිකයක් යටතේ ද ලබාගෙන ඇත.

2018 වර්ෂයේ පළමු කාර්තුව තුළ පළ කරන ලද නිල සංවර්ධන සහයෝගීතා අතරින් ඉහළම ප්‍රමාණය වන ඇ.ඩො. මිලියන 79.8 ක් දුම්රිය ප්‍රවාහන අංශය සඳහා ඇතිකර ගෙන ඇති අතර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ඇ.ඩො. මිලියන 75.0 ක එකඟතා ඇති කරගෙන ඇත.

රූපසටහන 5.1: 2018 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා අංශ අනුව ඇති කරගත් එකඟතා (ඇ.ඩො. මිලියන)




*මූලාශ්‍රය :විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

වගුව 5.1: 2018 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා ඇති කරගත් විදේශ මූල්‍යයන එකඟතා අදාළ මූල්‍ය කොන්දේසි සමග

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ණය හෝ ප්‍රදානය | එකඟතා ගිවිසුම අත්සන් කරන ලද දිනය | ව්‍යාපෘතිය, වැඩසටහන හෝ ණය | එකඟතා ප්‍රමාණය (මිලියන) | | | | මූල්‍ය කොන්දේසි | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | විනිමය | අත්සන් කරන ලද විනිමයන් | රුපියල් | එ.ජ.ඩොලර් | පොලිය: වර්ගය | පොලිය: වාර්ෂික අනුපාතය (සියයට) | පොලිය: සීමාන්තිකය (පදනම් අංක සියයට) | වෙනත් ගාස්තු | සහන කාලය (වර්ෂ) | පරිණත කාලය/උපයෝජ්‍යතා කාලය (ගිවිසුම්ගත දිනයේ සිට) (වර්ෂ) |
| **ද්විපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගීතා** | | | | | | | | | | | | | |
| **ඔස්ට්‍රේලියාව** | **ප්‍රදාන** | **1/30/2018** | **ඔස්ට්‍රේලියාවනු රජයේ මූල්‍යාධාර යටතේ, වර්ධනය සඳහා යහපාලනය වැඩසටහන ක්‍රියාත්මක කිරීම** | **ඔස්ට්‍රේලියානු ඩොලර්** | **31.0** | **3,850.90** | **25.0** | | | **අදාළ නොවේ** | | | **2.4** |
| ඇමරිකා එක්සත් ජනපදය | ප්‍රදාන | 1/30/2018 | සමාජ ඒකාබද්ධතාව හා ප්‍රජාතාන්ත්‍රික පාලනය සඳහා ශක්තිමත් සබඳතාවක් ගොඩනැගීම (අරමුදල් ඉහළ දැමීම) | එ.ජ.ඩොලර් | 9.7 | 1,487.10 | 9.7 | | | අදාළ නොවේ | | | 8.7 |
| | ප්‍රදාන | 1/30/2018 | තිරසාර හා සවිමත් ආර්ථික වර්ධනය (අරමුදල් ඉහළ දැමීම) | එ.ජ.ඩොලර් | 8.2 | 1,263.00 | 8.2 | | | අදාළ නොවේ | | | 7.7 |
| ඉන්දියානු ආනයන අපනයන බැංකුව | ණය | 1/10/2018 | කන්සකන්තුරෛයි වරාය සඳහා ඩොල(ර්) ණය මාලාව | එ.ජ.ඩොලර් | 45.3 | 6,963.40 | 45.3 | විචල්‍ය | ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය ඇ.ඩො. | 0 | - | 5.0 | 20.0 |
| HSBC බැංකුව (හොංකොං - චීනය) | ණය | 4/27/2018 | උඩරට දුම්රිය සඳහා ඩීසල් දුම්රිය කට්ටල 09ක් ගැනීම සඳහා ප්‍රසම්පාදනය | එ.ජ.ඩොලර් | 79.8 | 12,578.20 | 79.8 | විචල්‍ය | ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය ඇ.ඩො. | 2.0 | ණය රක්ෂණ වාරිකය එ.ජ.ඩොලර් මිලියන 2.2 | 1 | 13.5 |

වගුව 5.1: තව දුරටත් . . .

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | සැකසීමේ ගාස්තුව එ.ජ.ඩොලර් 877,665.87, පොරොන්දු ගාස්තු 0.5% | | |
| ඔස්ට්‍රියාවේ UniCedit Bank Austria AG බැංකුව | ණය | 3/8/2018 | කිරම - කටුවාන ඒකාබද්ධ ජල සම්පාදන ව්‍යාපෘත්ය ක්‍රියාත්මක කිරීම | යූරෝ | 10.5 | 2,019.40 | 13.0 | | පොලී රහිත | | පොරොන්දු ගාස්තු 0.4%,<br>කළමනාකරණ ගාස්තු<br>යූරෝ 47,185.25, මෙහෙයුම් ගාස්තු<br>යූරෝ 1,440, මූලික ගෙවීම් යූරෝ 58,981.6 | 6.5 | 15.0 |
| **බහුපාර්ශ්වික නිල සංවර්ධන සහයෝගීතා** | | | | | | | | | | | | | |
| ආසියානු සංවර්ධන බැංකුව | ණය | 2/16/2018 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සඳහා ණය මාලාව (අමතර මූල්‍යය) | එ.ජ.ඩොලර් | 75.0 | 11,649.30 | 75.0 | විචල්‍ය | ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතය ඇ.ඩො. | 0.6 | පොරොන්දු ගාස්තු 0.15% | 11.0 | 11.0 |
| කෘෂිකර්ම සංවර්ධනය සඳහා ජාත්‍යන්තර අරමුදල | ණය | 1/26/2018 | කුඩා තේ වතු කෘෂි ව්‍යාපාර හවුල්කරණය (SAP) වැඩසටහන ක්‍රියාත්මක කිරීම (අමුදල් ඉහළ නැංවීම) | එ.ජ.ඩොලර් | 6.2 | 950.1 | 6.2 | ස්ථාවර | 2.0 | අදාළ නොවේ | - | 5.0 | 25.0 |
| එක්සත් ජාතීන්ගේ, සරණාගතයන් පිළිබඳ මහ කොමසාරිස් (UNHCR) | ප්‍රදාන | 1/1/2018 | කිලිනොච්චි, පුත්තලම සහ මන්නාරම යන දිස්ත්‍රික්කවල නැවත පදිංචි කරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙත ප්‍රවේශ කරවීම | ශ්‍රී ලංකා රුපියල් | 1.9 | 1.9 | 0.01 | | | අදාළ නොවේ | | | 1.0 |
| **වෙළෙඳපොළ ණය** | | | | | | | | | | | | | |
| ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව | ණය | 4/18/2018 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව 2018 | එ.ජ.ඩොලර් | 1,250.00 | 195,413.40 | 1,250.00 | ස්ථාවර | 5.75 | අදාළ නොවේ | - | 5.0 | 5.0 |
| | ණය | 4/18/2018 | ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව 2018 | එ.ජ.ඩොලර් | 1,250.00 | 195,413.40 | 1,250.00 | ස්ථාවර | 6.75 | අදාළ නොවේ | - | 10.0 | 10.0 |
| **එකතුව** | | | | | | **432,201.60** | **2,766.20** | | | | | | |

*මූලාශ්‍රය :විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන : 1. LIBOR = ලන්ඩන් අන්තර් බැංකු අර්පණ අනුපාතිකය,*

*2. එක් එක් විදේශ විනිමයෙන් සටහන් වන එකගතා අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී අදාළ ගිවිසුම අත්සන් කරන ලද දිනයේ පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත.*

## 5.2 විදේශ මූල්‍යයන ප්‍රතිලබ්ධි හා උපයෝජනය

2018 ජනවාරි 01 සිට අප්‍රේල් 30 දක්වා, සංවර්ධන ව්‍යාපෘති සහ වැඩසටහන් වල උපයෝජනය පිණිස ඇ.ඩො. මිලියන 512.1 ක විදේශ ප්‍රතිලබ්ධි ප්‍රමාණයක් ලබාගෙන ඇත. මෙයින් ඇ.ඩො. මිලියන 508.2 ක් ණය ප්‍රතිලබ්ධි වන අතර ඇ.ඩො. මිලියන 3.9 ක් ප්‍රදාන ලෙස ලද ප්‍රතිලබ්ධිවී ඇත. මෙම ප්‍රතිලබ්ධි වලින් ඉහළම ප්‍රමාණය ආසියානු සංවර්ධන බැංකුව සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් මගින් ලබා ගත් අතර,එය සමස්තය ආසන්න වශයෙන් සියයට 45 ක්ද අනතුරුව ඉහළ ප්‍රමාණයක් චීනය (සියයට 18) සහ ජපානය (සියයට 11) සමඟ අත්සන් කරන ලද ණය ගිවිසුම් මගින් ලබා ගත් ප්‍රතිලබ්ධි ද වේ.

වගුව 5.2 : එක් එක් සංවර්ධන පාර්ශ්වකරු විසින් 2018 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ප්‍රතිලබ්ධි

| සංවර්ධන පාර්ශ්වකරු / ණය දෙන ආයතනය | ප්‍රතිලබ්ධි ප්‍රමාණය (එ.ජ.ඩොල(ර්) මිලියන)* | | |
|---|---|---|---|
| | ණය | ප්‍රදාන | එකතුව |
| **ද්විපාර්ශ්වික** | **221.95** | **3.16** | **225.10** |
| චීනය | 90.83 | - | 90.83 |
| ජපානය | 54.19 | - | 54.19 |
| ප්‍රංශය | 16.91 | 0.25 | 17.17 |
| ඉන්දියාව | 16.90 | - | 16.9 |
| නෙද(ර්)ලන්තය | 8.65 | - | 8.65 |
| ඔස්ට්‍රියාව | 8.38 | - | 8.38 |
| සෞදි අරාබිය | 6.39 | - | 6.39 |
| කොරියාව | 4.58 | - | 4.58 |
| ස්පාඤ්ඤය | 4.32 | - | 4.32 |
| එක්සත් රාජධානිය | 3.55 | - | 3.55 |
| ඇමරිකා එක්සත් ජනපදය | - | 2.90 | 2.90 |
| ඩෙන්මා(ර්)කය | 2.80 | - | 2.80 |
| කුවේට් | 2.69 | - | 2.69 |
| ජ(ර්)මනිය | 1.08 | - | 1.08 |
| ඔස්ට්‍රේලියාව | 0.68 | - | 0.68 |
| **බහුපාර්ශ්වීය** | **286.28** | **0.74** | **287.02** |
| ආසියානු සංවර්ධන බැංකුව | 228.85 | - | 228.85 |
| ලෝක බැංකුව | 48.83 | - | 48.83 |
| ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදල | 7.17 | - | 7.17 |
| කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල | 1.43 | - | 1.43 |
| එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන (UNHCR), (UNICEF), (UNFPA) & (FAO) | - | 0.54 | 0.54 |
| ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව | - | 0.20 | 0.20 |
| **එකතුව** | **508.23** | **3.89** | **512.12** |

*මූලාශ්‍රය :විදේශ සම්පත් දෙපාර්තමේන්තුව*

*සටහන :එක් එක් විදේශ විනිමයෙන් සටහන්වන ප්‍රතිලබ්ධි අගයයන් එ.ජ.ඩොලර් හා රුපියල් බවට හැරවීමේ දී 2018 අප්‍රේල් 30 දින පැවති විනිමය අනුපාතිකයන් භාවිත කර ඇත*

* *තාවකාලික*

රූපසටහන 5.2: සංවර්ධන පාර්ශ්වකරුවන් විසින් 2018 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුකරන ලද ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)




මෙම ප්‍රතිලබ්ධීන්ගෙන් ඉහළම ප්‍රමාණය මාර්ග සහ පාලම් අංශය යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති සඳහා උපයෝජනය වී ඇති අතර එය ආසන්න වශයෙන් සියයට 27 කි. අනතුරුව පිළිවෙලින් මූල්‍ය හා රාජ්‍ය පාලන අංශය සඳහා සියයට 24 ක් ද විදුලි හා බලශක්ති අංශය සඳහා සියයට 8 ක් සහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා සියයට 27 ක් ද වන ලෙස ප්‍රතිලබ්ධි සිදුවී ඇත.

රූපසටහන 5.3: එක් එක් අංශය වෙනුවෙන් 2018 ජනවාරි 1 සිට අප්‍රේල් 30 දක්වා සිදුවූ ප්‍රතිලබ්ධි (ඇ.ඩො. මිලියන)



## 5.3 එකඟතා පළකරන ලදුව ඉදිරියේදී උපයෝජනය වීමට නියමිත ශේෂය

දැනට පළකර ඇති එකඟතා අනුව ඉදිරි වර්ෂ 3-5 කාලය තුළ විවිධ ව්‍යාපෘති හා වැඩසටහන්වල උපයෝජනය වීමට නියමිත විදේශ මූල්‍යයන වල ශේෂය 2018 අප්‍රේල් 30 දින වන විට ඇ.ඩො. මිලියන 8,870.4[1] ක් විය. මෙයින් ඇ.ඩො. මිලියන 2,513.0 ක් හෝ සියයට 28 ක් මාර්ග හා පාළම් අංශයේ ද ඇ.ඩො. මිලියන 2,070.5 ක් ජල සම්පාදන හා සනීපාරක්ෂාව අංශයේ ද එකඟතා පළකරන ලද ව්‍යාපෘතිවල උපයෝජනය වීමට නියමිතය.

**රූපසටහන 5.4 : පළකරන ලද එකඟතා අනුව ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය එක් එක් සංවර්ධන පාර්ශ්වකරු අනුව (ඇ. ඩො. මිලියන)**




**රූපසටහන 5.5: 2018 අප්‍රේල් 30 වන විට අංශ අනුව පළකරන ලද එකඟතාමත ප්‍රතිලබ්ධි වීමට නියමිත ශේෂය (ඇ. ඩො. මිලියන)**




[1] *ඉරානය මත පනවා ඇති ජාත්‍යන්තර සම්බාධක බලපා ඇත. රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ඇතිකරගත් එකගතා අනුව සිදුවීමට නියමිත ප්‍රතිලබ්ධි අඩංගු නොවේ*

## 5.4 විදේශ ණය ප්‍රමාණය හා විදේශ ණය සේවාකරණය

2018 අප්‍රේල් 30 වන විට රජය ලබා ගත් විදේශ ණය මූල්‍යනයන් සඳහා ආපසු ගෙවීමට එකතු වී තිබූ විදේශ ණය ප්‍රමාණය ඇ.ඩො. බිලියන 31.6[2] කි. තවද, 2018 ජනවාරි 1 සිට අප්‍රේල 30 දක්වා සිදුකරන ලද ණය සේවාකරණය[3] ඇ.ඩො. මිලියන 715.6 කි. මෙයින්, ඇ.ඩො. මිලියන 390.2 ක් ණය ආපසු ගෙවීම සඳහා යොදවා ඇති අතර, ඉතිරිය වන ඇ.ඩො. මිලියන 325.4 ක් පොලී ගෙවීම සඳහා යොදවා ඇත.

**රූපසටහන 5.6 : 2018 අප්‍රේල් 30 වන විට සිදුකර ඇති ණය සේවාකරණය හා වර්ෂයේ ඉදිරි මාස 8 සඳහා පුරෝකතනය[4] කරන ලද ණය සේවාකරණ ගෙවීම් (ඇ.ඩො. මිලියන)**




2018 වර්ෂය සඳහා පුරෝකතනය කරන ලද ණය සේවා කරණ ගෙවීම් ප්‍රමාණය ඇ.ඩො. මිලියන 2,900.9 කි. මෙයින්, සියයට 25 ක් මෙම වර්ෂයේ අප්‍රේල් 30 වනවිට ගෙවා ඇත.

[2] භාණ්ඩාගාර බැඳුම්කර හා බිල්පත්හි අනේවාසික අයෝජනහාරාජ්‍ය *ව්‍යාපාර සඳහා ලබාගත් ණය අඩංගු නොවේ.*

[3] මුළු ණය සේවාකරණය = පොලී ගෙවීම් + *ණය වාරික ආපසු ගෙවීම්, රාජ්‍ය ව්‍යාපාරයන්හි ණය සේවාකරණය අඩංගු නොවේ.*

[4] *පුරෝකතනය කර ඇත්තේ 2018 අප්‍රේල් 30 පැවති විනිමය අනුපාතිකයන් අනුව වේ.පුරෝකතනය සඳහා දැනට ඇති ණය ප්‍රමාණය පමණක් පදනම් කරගෙන ඇති අතර 2018 වර්ෂයේ සිදුවන නව ණය ගැනීම් අනුව එකතු වන ණය සේවාකරණ ගෙවීම් අගයයන් එකතු කර නැත.*